රළ සමග

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

ISSN 1391 - 1031
2017 මාර්තු
22 වෙළුම 12 කලාපය
ආධාරය රු 30/-

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

"කාන්තාවන්ගේ නියම විමුක්තිය, නියම කොමියුනිස්ට් ක්‍රමය ආරම්භ වන්නේ (රාජ්‍ය බලය මෙහෙයවන නිර්ධන පංතියේ නායකත්වය යටතේ) මෙම අවශේෂ ගෙදර වැඩට විරුද්ධව සමා නැති අරගලයක් ආරම්භවූ විට, නැතහොත්, එය සම්පූර්ණයෙන්ම මහා පරිමාණ සමාජවාදී ආර්ථිකයකට පරිණාමනය වීම ආරම්භ වූ විට පමණකි."

**ලෙනින්,**
**තෝරාගත් කෘති,**
**9වැනි වෙළුම,**
**228-229 පිටු**

# ජ.වි.පෙ. දිස්ත්‍රික් මෙහෙයුම සාර්ථකව ඉදිරියට

වසර 68ක තට්ටුමාරු දේශපාලනයෙන් සහ වත්මන් ආණ්ඩුවේ බංකොලොත් නව ලිබරල් දේශපාලනයෙන් හෙම්බත් වෙමින් සිටින ජනතාව විකල්ප දේශපාලන පෙළගැස්මක් වෙනුවෙන් සංවිධානය කිරීම අරමුණු කරගනිමින් ජනතා විමුක්ති පෙරමුණ විසින් ක්‍රියාත්මක කරනු ලබන දිස්ත්‍රික් මෙහෙයුම සාර්ථකව ඉදිරියට යමින් තිබේ. විශාල ජනතා සහාගිත්වයත් විශේෂයෙන් ජනතාව රටේ දේශපාලනය සම්බන්ධයෙන් ජ.වි.පෙ. සමඟ සංවාද ගතවීමට දක්වන අතිශය උනන්දුවත් මෙම වැඩපිළිවෙල තුළ කැපී පෙනෙන ලක්ෂණයක් වී ඇත.

අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් ආරම්භ කරන ලද මෙම මෙහෙයුම මේ වචන විට මාතර හා කුරුණෑගල දිස්ත්‍රික්ක ආවරණය කරමින් පවත්වනු ලැබ ඇති අතර එය මාර්තු මාසයේ අවසන් වන විට ගම්පහ සහ මැයි මාසයේදී හම්බන්තොට යන දිස්ත්‍රික්ක ආවරණය කිරීමට නියමිතය. ඉදිරියේදී සෙසු දිස්ත්‍රික්කද ආවරණය කර ගනිමින් දිස්ත්‍රික් මෙහෙයුම රට පුරා පැවැත්වීමට කටයුතු යොදා ඇත.

රටේ බොහෝ දේශපාලන පක්ෂ මැතිවරණ වකවානුවලදී පමණක් සමඟ ජනතාව අතරට යද්දී ජ.වි.පෙ. රටේ උණුසුම්වන දේශපාලනය පිළිබඳව ජනතාව සමග සංවාද ගත වීමට **02 වැනි පිටුවට**












**05 ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය...**



මැතිවරණ කොමසාරිස්වරයා විසින් පෙන්වා දී තිබෙන අඩුපාඩු රැසක්ද...

**09 කෝප් හෙළිදරව්ව...**



තවත් රුපියල් මිලියන 28,000ක් (කෝටි 2800ක්) මඟනැගුම මඟින් වියදම් කළ ආකාරයවත් සොයා...

**11 සාවද්‍ය පරාවර්තනයේ...**



ධනවාදී ක්‍රමය තුළ ධනපති ආණ්ඩු කාලයක් තිස්සේ ජනතාව රවටා තිබෙන තත්වය තුළ "කවුරු ආවත්...

**12 මකර කටට වැටීමට...**



මේ සා විශාල සම්පතක් විදේශීය සමාගමකට විකුණා දමා සිදුකිරීමට යන මහා අපරාධය...


| | |
|---|---|
| සංවාදය.......................... | 03 |
| තරුණ.......................... | 04 |
| ආවර්ජනා.......................... | 06 |
| දැනුම.......................... | 07 |
| ජාත්‍යන්තර.......................... | 08 |
| කාන්තා.......................... | 10 |
| වේදිකාව.......................... | 13 |
| විශේෂාංග.......................... | 14 |


යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!

# සටන් බිම

## AGIO සේවිකාවෝ වහල උඩ සත්‍යග්‍රහයක




බියගම නිදහස් වෙළඳ කලාපයේ දුම්කොළ සැකසුම් ආයතනයේ සේවකයින් පසුගිය 22 දින සිට වෘත්තීය සමිති මර්දනයට එරෙහිව (ක්‍රියාකාරිකයෙකු වූ නන්දසිරි සහෝදරයාගේ සේවය අහිමි කිරීම හේතු කොට ගෙන) මේ වන විට සත්‍යග්‍රහයක නියැලී සිටියහ. මෙම සේවිකාවන් 22 වන දින රාත්‍රියේ AGIO වහලය මත නැග සත්‍යග්‍රහය ආරම්භ කර තිබිණි.

මෙම කාර්මික ආරවුල සමථයකට පත් කර ගැනීම සඳහා අන්තර් සමාගම් සේවක සංගමයේ නියෝජ්‍ය ලේකම් හෙට්ටිආරච්චි සහෝදරයා මැදිහත් වී සිටි අතර එදිනම දින කම්කරු දෙපාර්තමේන්තුවේ පැවැත්වූ සාකච්ඡාවේදී ජයග්‍රාහී ලෙස අවසන් කිරීමට හැකි විය. එහිදී සත්‍යග්‍රහයට සහභාගි වී සිටි AGIO සේවකයින් හත්දෙනාගේ සේවය අවසන් කිරීම පාලකයන් විසින් හකුළා ගනු ලැබුණු අතර දැනට සේවය අවසන් කර ඇති නන්දසිරි සහෝදරයාගේ සේවය නැවත ලබාගැනීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව සමඟ සකච්ඡා අරම්භ කර ඇති බව අන්තර් සමාගම් සේවක සංගමය ප්‍රකාශ කරයි.

## SAITM විරෝධී පාගමනට වෘත්තීය සමිති සහය

ජනතා විමුක්ති පෙරමුණ විසින් පසුගිය 23වැනි දින පැවැත්වූ 'නිදහස් අධ්‍යාපනය වනසන සයිටම් එපා!' විරෝධතා පාගමන ටෙක්නිකල් හන්දියේ සිට කොටුව දුම්රියපොළ ඉදිරිපිටට පැමිණ විරෝධතා රැලියට වෘත්තීය සමිති නායකයින්, වෛද්‍යවරුන් ඇතුළු විශාල පිරිසක් සහභාගි වූහ.

ජ.වි.පෙ. නායක අනුර දිසානායක, ජවිපෙ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා, සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක රංගන දේවප්‍රිය, සමස්ත ලංකා වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ ප්‍රධාන ලේකම් වෛද්‍ය ජයන්ත බණ්ඩාර සහෝදරයා ඇතුළු පිරිසක් රැලිය ඇමතූහ.

## වරාය විකිණීමට එරෙහි පාගමනට ආණ්ඩුවෙන් කඳුළු ගෑස්




කොළඹ වරායේ නැගෙනහිර ජැටිය රහසිගත ලෙස ඉන්දියානු සහ ඇමෙරිකානු ඒකාබද්ධ සමාග මක් වෙත පවරාදීමට කටයුතු කිරීමට විරෝධය පළ කරමින් වරාය රැකගැනීමේ වෘත්තීය සමිති පෙරමුණ විසින් පසුගිය 01වැනි දින සංවිධානය කළ පා ගමනට කඳුළු ගෑස් සහ අධිපීඩන ජල ප්‍රහාර එල්ලකර විසුරුවා හැරීමට ආණ්ඩුව ක්‍රියාකරන ලදී.

ආණ්ඩුව රටේ ආර්ථික මර්මස්ථාන විදේශයන්ට විකුණමින් ඒ සඳහා එල්ලවන ජනතා විරෝධයද සමතලා කරමින් හිතුවක්කාර ලෙස හැසිරීම සම්බන්ධයෙන් ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය දැඩි විරෝධය සහ පිළිකුල ප්‍රකාශකර සිටී. මෙම විරෝධතා පාගමනට ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික, සමස්ත ලංකා වරාය පොදු සේවක සමිතියේ සභාපති සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා, සමස්ත ලංකා වරාය පොදු සේවක සමිතියේ ප්‍රධාන ලේකම් චන්ද්‍රසිරි මහගමගේ සහෝදරයා, ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ කැඳවුම්කරු වසන්ත සමරසිංහ සහෝදරයා, අන්තර් සමාගම් සේවක සංගමයේ ප්‍රධාන ලේකම් ජානක අධිකාරී සහෝදරයා හා ලංකා ගුරු සේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ සහෝදරයා ඇතුළු වෘත්තීය සමිති ක්‍රියාකාරීහු විශාල පිරිසක් සහභාගි වූහ.

## ජලසම්පාදන මණ්ඩලයට එරෙහිව වෘත්තීය සමිති විරෝධතාවයේ




වෘත්තීය ගැටලු විසඳීමට බලකරමින් ජලසම්පාදන මණ්ඩලයේ ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන්ගේ සංගමය සහ කාර්මික නිලධාරීන්ගේ සංගමය එක්ව පසුගිය පෙබරවාරි 09වැනි දින සිට ආරම්භ කර ඇති වෘත්තීය ක්‍රියාමාර්ගය මේ වන විට සමාජිකයින්ගේ සහභාගිත්වයෙන් අඛණ්ඩව ඉදිරියට ක්‍රියාත්මක වෙමින් තිබේ. එහි තවත් එක් පියවරක් ලෙස පසුගියදා රත්මලාන, සොයිසාපුර බස්නාහිර පළාත් ජලසම්පාදන නියෝජ්‍ය සමානාධිකාරී කාර්යාලය ඉදිරිපිට විරෝධතාවයක් පැවැත්විණි. කාර්යාල භූමියේ පැවැත්වූ සාකච්ඡාව ආවරණය කිරීමට මාධ්‍යවේදීන්ට පාලනාධිකාරියෙන් අවසර දී නොතිබුණ අතර කාර්යාල අවට පොලිසිය යොදවා තිබුණි.

# එතෙරින්...

## රංගන ලක්මාල් CPIM තරුණ සමුළුවට




සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක රංගන ලක්මාල් (දේවප්‍රිය) සහෝදරයා ඉන්දියාවේ මාක්ස්වාදී කොමියුනිස්ට් පක්ෂයේ (CPIM) තරුණ සමුළුව සඳහා පසුගියදා සහභාගි විය. ඉන්දියාවේ කේරල ප්‍රාන්තයේ කොචිං නගරයේදී මෙම සමුළුව පැවැති අතර, රටවල් කිහිපයක විදේශ නියෝජිතයෝද මේ සඳහා සහභාගි වූහ. දැනට කේරල ප්‍රාන්තයේ පාලන බලය හිමිව ඇත්තේද මාක්ස්වාදී කොමියුනිස්ට් පක්ෂයටය.

## බිමල් යුරෝපයේ කොමියුනිස්ට් පක්ෂ හමුවේ




පසුගියදා යුරෝපයේ රටවල් කිහිපයක විදේශ කමිටුවල ආරාධනාවක් මත සංචාරය කළ ජ.වි.පෙ. ජාත්‍යන්තර ලේකම් - දේශපාලන මණ්ඩල සභික බිමල් රත්නායක සහෝදරයාට විදේශ රටවල කොමියුනිස්ට් පක්ෂ කිහිපයක් සමග නව සබඳතා ඇති කර ගැනීමට හැකිවිය. එහිදී ස්වීඩන් කොමියුනිස්ට් පක්ෂයේ සභාපති රොබට් මැතියාසන් (Robert Mathiassion) සහ එම පක්ෂයේ ජාත්‍යන්තර ලේකම්, පැට්‍රික් පාබලෝ හමුවිය. එසේම ඩෙන්මාර්ක් කොමිනිස්ට් පක්ෂයේ ජෝර්ජ් පීටර්සන් සහ ජර්මනියේ පක්ෂයේ මධ්‍යම කමිටු සාමාජිකයකු ද හමුවිය. ඡායාරූපය එවැනි එක් හමුවීමක මතක සටහනකි.

## රෝමයේ 'එතෙර අපි' පිහිටුවයි



ඉතාලියේ රෝම නගරයේද මේ වනවිට " එතෙර අපි" ශ්‍රී ලාංකිකයින්ගේ සංවිධානයේ ශාඛාවක් පිහිටුවීම පසුගියදා සිදු කෙරිණි. ඒ සඳහා එතෙර අපි සභාපති සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා ස්කයිප් තාක්ෂණය මගින් සම්බන්ධ විය. රෝමයේ වෙසෙන ශ්‍රී ලාංකිකයෝ විශාල පිරිසක් ඒ සඳහා සහභාගි වූහ. දැනට ඉතාලියේ නාපෝලි - මිලානෝ නගරවල එතෙර අපි සංවිධානයේ කටයුතු සාර්ථකව සිදු කෙරේ.

## එතෙර අපි - නාපෝලියේ උද්ඝෝෂණයක්




ඉතාලියේ විදේශගත ශ්‍රමිකයින් මුහුණ දෙන ගැටලු ගණනාවක් මූලික කරගෙන නාපෝලි නගරයේදී දැවැන්ත උද්ඝෝෂණයක් සිදු කිරීමට ඉතාලියේ - නාපෝලි 'එතෙර අපි' ශාඛාව සූදානමින් සිටී. විශේෂයෙන් මෙහි අරමුණ අවලංගු කර ඇති පෙරමෙස්සෝ සෝජෝර්නය බලපත්‍රය ලබා ගැනීමයි. ඒ සඳහා පළකර ඇති දැන්වීමක් ඉහතින් දැක්වේ.

### ජ.වි.පෙ. දිස්ත්‍රික්... 01 පිටුවෙන්

තීරණය කිරීම විශේෂත්වයකි. තෝරා ගනු ලබන දිස්ත්‍රික්කයේ සෑම ආසනයක්ම නියෝජනය වන පරිදි මෙම මෙහෙයුම ක්‍රියාත්මකය. ජනහමු, පැරණි සාමාජික හමු, විද්වත් හා ව්‍යාපාරික හමු, විශේෂ පුද්ගල හමුවීම් සහ කලා සංස්කෘතික ලක්ෂණ ආදී විවිධ වැඩසටහන් සමගින් පවත්වනු ලබන මෙම දිස්ත්‍රික් මෙහෙයුමේදී දේශපාලන සාකච්ඡා සඳහා ජ.වි.පෙ. නායකයෝ දිස්ත්‍රික් නායකයින් සමඟ සම්බන්ධ වෙති.

2017 වසර පුරා ක්‍රියාත්මක වීමට නියමිත මෙම දිස්ත්‍රික් මෙහෙයුම අවසන් වන විට රටේ ජනතාවගෙන් සැලකිය යුතු පිරිසක් ජ.වි.පෙ. අරමුණු කරා සමීප කරවීමටත් දිස්ත්‍රික් මෙහෙයුමේ ඉලක්ක ඉහළින්ම සම්පූර්ණ කරගැනීමටත් හැකිවනු ඇති බවට විශ්වාස යැයි ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් නියමුවා කරන ලද විමසුමකට පිළිතුරු දෙමින් පැවසීය.

### රටම කතා කරන... අවසන් පිටුවෙන්

එස්.බී. දිසානායකයි. එස්.බී දිසානායක කියන රජයේ විශ්වවිද්‍යාලවල පීඨාධිපතිවරු 08 දෙනෙක් සයිටම් ආයතනයට එකඟ වුණා යැයි කියන ලියවිල්ල වෙන කවුරුවත් දැකලා නැහැ. නමුත් අපි ළඟ තිබෙනවා පීඨාධිපතිවරු 08 දෙනා මෙයට විරුද්ධයි කියලා ප්‍රකාශ කරපු ලියවිල්ල. එනිසා එස්.බී.දිසානායක තැන තැන කියන බේගල් ඔහුටම ඔප්පු කරන්න බැරිවෙලා තිබෙනවා. සයිටම් ආයතනය නිසා විදේශ විනිමය ඉතුරු කරනවා යැයි මොවුන් කියන නිසාම අපි පාර්ලිමේන්තුවේදී ප්‍රශ්නයක් ඇහුවා, කොතරම් මුදලක් රටට ඉතිරි වෙනවාද කියලා. නමුත් එම ප්‍රශ්නයට උත්තර දෙන්න එස්.බී.ට උත්තර තිබුණේ නැහැ. එනිසා එස්.බී මෙම ප්‍රකාශ සිදුකරන්නේ තොරතුරු, වාර්තා ළඟ තබාගෙන නෙවෙයි.

මහින්ද රාජපක්ෂ අවස්ථාවාදියෙක් කියන එකට එක් උදාහරණයක් තමයි ඔහුගේ මෙම සයිටම් විරෝධය. 2008 වර්ෂයේ ඔහුගේ ආණ්ඩුව යටතේ තමයි, මෙම ආයතනය ආරම්භ කළේ. බී.ඕ.අයි. ආයතනයටත් සෞඛ්‍ය අමාත්‍යාංශයටත් අධ්‍යාපන අමාත්‍යාංශයටත් බොරු කරලා තමයි සයිටම් ආයතයනය පවත්වාගෙන ගියේ. මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුව කාලේ අධ්‍යාපන ඇමති එස්.බී. කිව්වා වෛද්‍ය සභාව අහෝසි කරලා හරි සයිටම් ආයතනයට ලියාපදිංචිය දෙනවා කියලා. ඒ ආණ්ඩුවේ නායකයා විදිහට මහින්ද රාජපක්ෂ ශිෂ්‍යයන්ට සයිටම් ආයතනයේ ශිෂ්‍යත්ව ප්‍රදානය කළා. ඔහු වෙනුවෙන් ගීත ගායනා කරපු, අධ්‍යාපන සුදුසුකම් නැති තරුණියකට සයිටම් ආයතනයට ඇතුල් වෙන්න ඉඩ හදලා දුන්නා. එනිසා ඔහු අද කරන ප්‍රකාශ විහිළුවක්. සයිටම් විරෝධය හැල්ලු කරන්න තමයි ඔහු මෙවැනි ප්‍රකාශ කරන්නේ."

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# සයිටම් පරදා නිදහස් අධ්‍යාපනය රැකගත හැකි මඟ..

මාලබේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය හෙවත් සයිටම් ආයතනයට එරෙහි උද්ඝෝෂණය මේ වනවිට තීව්‍ර වී තිබේ. ඒ විශේෂයෙන්ම පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයේ සිසුන්ට වාසිදායක ලෙස ලබාදුන් නඩු තීන්දුව සමඟය. මෙම නඩු තීන්දුවට එරෙහිව මේ වනවිටත් යළි ශ්‍රේෂ්ඨාධිකරණයට යාමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව තීරණය කොට තිබේ. අනෙක් අතට වෛද්‍ය පීඨ ශිෂ්‍යයින්ද පොදුවේ විශ්වවිද්‍යාල සිසුන්ද වෛද්‍ය සංගම්ද විවිධ ස්ථාවර මත පිහිටාවුව සයිටම් විරෝධී උද්ඝෝෂණය තිව්‍ර කර තිබේ.

මේ අතර අධ්‍යාපනය පෞද්ගලීකරණය කිරීමේ ප්‍රතිපත්තියම තම පාලන කාලය තුළ ද ක්‍රියාවට නැගූ හා සයිටම් ආයතනය ප්‍රමිතියෙන් තොරව පටන් ගැනීමට අවස්ථාවදී, එයට රජයේ බැංකුවලින් රුපියල් මිලියන 400ක පමණ ණයක්ද ලබාදුන් රාජපක්ෂ පාලනයට සම්බන්ධව සිටි රාජපක්ෂ කල්ලියේ අයද වැලයන අතට මැස්ස ගැහීම සඳහා, සයිටම් විරෝධයේ පිහිනා හෝ බලය ලබාගත හැකිදැයි බැලීම සඳහා ලැජ්ජාවකින් තොරව සයිටම් විරෝධයේ වේදිකාවලට ගොඩවීමටද පටන්ගෙන තිබේ. දේශපාලන වශයෙන් අනාථවී සිටින රාජපක්ෂ කල්ලිය සයිටම් විරෝධී වේදිකාවට නංවා ඔවුනට නැති සුජාතභාවයක් ලබාදී පරණ පව් වැසීමට උදව් කරන්නේ, රාජපක්ෂ කණ්ඩායම සමග හිතවත් වෛද්‍යවරු කීපදෙනෙකි. සැබෑ ලෙසම සයිටම් පරදවා නිදහස් අධ්‍යාපනය රැක ගැනීමට වෙර දරනා සියලු බලවේග මෙම 'කපටි ආරක්ෂකයින්ගෙන්' පරෙස්සම් විය යුතුව තිබේ.

පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය යනු අත්වැරදීමක්වත් අහම්බයක්වත් නොව ධනපති ආණ්ඩුවල අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්තියේ එක් ප්‍රකාශනයක් පමණි. ලංකාවේ නිදහස අධ්‍යාපනය හෙවත් රාජ්‍ය අධ්‍යාපනය කප්පාදුකර එය පෞද්ගලීකරණය දෙසට හැරවීම නිශ්චිත ලෙසම ආරම්භ කරනු ලැබූයේ ජයවර්ධන පාලන සමයේය. ඒ, 1981 ගෙන එන ලද අධ්‍යාපන ධවල පත්‍රිකාව මගිනි. එය සකස්කරනු ලැබුවේ එවකට අධ්‍යපන ඇමතිකම දැරූ වත්මන් අගමැති රනිල් වික්‍රමසිංහය. එහිදී පක්ෂයක් ලෙස ජ.වි.පෙ.ත් ජ.වි.පෙ. නායකත්වයෙන් ක්‍රියාත්මකවූ ශිෂ්‍ය ව්‍යාපාරයත් දැඩි සටනකින් පසු තාවකාලිකව හෝ ධවල පත්‍රිකාව පරාජය කිරීමට සමත්විය. එසේම පසුව ගෙන ආ රාගම පෞද්ගලික වෛද්‍ය විදුහලද රජයට පවරා ගන්නාතුරු සටන් කොට එම සටන දිනීමට සමත්විය. මේ දක්වා මේ ප්‍රමාණයෙන් වුව නිදහස් අධ්‍යාපනය රැකී ඇත්තේ එම සටන් නිසාය.

ජයවර්ධන පාලනයෙන් පසු චන්ද්‍රිකා කුමාරණතුංගගේ පාලනයද රනිල්ගේ වසර දෙකේ පාලනයද මහින්දගේ පාලනයද දිගින් දිගටම අධ්‍යාපන කප්පාදුවත් අධ්‍යාපනය පෞද්ගලීකරණයත් කරගෙන ගිය අතර මේ වනවිට ඊට එරෙහිව සටන් හා අරගල මැද වුවද නිදහස් අධ්‍යාපනය පවතින්නේ ටිකෙන් ටික වුවත් අහෝසි වෙමිනි. මන්ද නිදහස් අධ්‍යාපනය කප්පාදු කිරීම ධනපති ආණ්ඩුවල ප්‍රතිපත්තියක් බවට පත්ව ඇති නිසාය. ආණ්ඩුවක හුදකලා ක්‍රියාමාර්ගයක් පැරදවීම පහසු වුවත් ධනපති ක්‍රමයක රාජ්‍ය ප්‍රතිපත්තියක් පැරදවීම පහසු නැත. විශේෂයෙන්ම ධනවාදයත් ධනපති ආණ්ඩුවත් පවතිද්දී ඔවුන්ගේ ප්‍රතිපත්ති පැරදවීම දුෂ්කරය. කළ හැක්කේ ඒවා ප්‍රමාද කිරීම, කල් දැමීම පමණි. එහෙත් ඒවා ටිකින් ටික ක්‍රියාත්මක වෙමින් නිදහස් අධ්‍යාපනය වළපල්ලට යවමින් තිබේ. සත්‍යය එයයි.

දැන් කළ යුත්තේ කුමක්ද? බොරුවට නොව සැබෑ ලෙසම නිදහස් අධ්‍යාපනය හෙවත් නොමිලයේ ලබාදෙන රාජ්‍ය අධ්‍යාපනය රැකගැනීමට හා එය තව තවත් පුළුල්කර ගැනීමට කැමති සියලු බලවේග මෙම ගැටලුව ගැඹුරින් තේරුම් ගත යුතුව ඇත. ධනපති ක්‍රමය පරාජය කරන්නේ නැතිව එහි "නරක ප්‍රතිපත්ති" පමණක් පැරදවිය නොහැක. එබැවින් දැන් කළ යුත්තේ 'සයිටම්' පැරදවීමේ සටන තීව්‍ර කරන අතරම ඒ සඳහා එකතු කළ හැකි සියලු බලවේග එකතුකරන අතරම සයිටම් හොර උපාධි කඩයට උපත දුන් හා දැන් එය රකින ධනපති කණ්ඩායම් දෙකත් ඔවුන් විසින් පවත්වාගෙන ආ ධනපති ක්‍රමයත් පැරදවීම සඳහාද නිදහස් අධ්‍යාපනයේ අයිතිය සැරැකෙන නව ජනතා පාලනයක් බිහිකිරීම සඳහාද ජනතා බලවේග පෙළගැස්වීමය. ඒ මඟ හැර නිදහස් අධ්‍යාපනය ස්ථිර ලෙසම රැකගැනීමට අන් මඟක් නැත.

# යහපත් සමාජයක් වෙනුවෙන් කාන්තාවන් බලමුළු ගැන්විය යුතුයි

## සමාජවාදී කාන්තා සංගමයේ ජාතික සංවිධායිකා සමන්මලී ගුණසිංහ සහෝදරිය

*නියමුවාඃ- ජාත්‍යන්තර කාන්තා දිනය ආණ්ඩු විසිනුත් වෙනත් සංවිධාන විසිනුත් වාර්ෂිකව සමරනු ලබන තවත් එක් අවස්ථාවක් ලෙස පවතිනවා. එහෙත් ලාංකේය කාන්තාවන් මුහුණ දෙන ගැටලු හා අභියෝග බොහොමයක් එලෙසමයි. මේ ඇයි?*

*සමන්මලී ගුණසිංහ සහෝදරියඃ-* ඇත්ත. ඔවුන්ට එය තවත් සැමරුම් දිනයක් විතරයි. ඒත් මීට අවුරුදු 107කට කලින් දෙවන ජාත්‍යන්තරය විසින් කාන්තා දිනය ප්‍රකාශයට පත් කරනු ලබන්නේ, එවකට කාන්තාව ශ්‍රමවහලියක් වීම හා ඔවුන්ගේ අයිතිවාසිකම් අහිමිවීමට එරෙහිව අරගල කරපු, එහෙම නැත්නම් ඒ අරගලය තුළින් ලෝකයේ කාන්තාවන්ගේ අයිතීන් දිනාගැනීම සඳහා බලමුළු ගැන්වෙන දිනයක් විදිහට. හැබැයි අපේ රටේ කාන්තා දිනය සමරනු ලබන්නේ, ඊට සපුරාම වෙනස් විදිහට තමයි. ලෝකයේ බොහෝ අය කාන්තා දිනය විලාසිතාවක් බවට පත්කරගෙන තියෙනවා. ඒ අර්ථයෙන් සැමරුවට ඒක කාන්තාවන්ගේ දිනයක් වෙන්නෙ නැහැ. එතනදි කාන්තාවන්ගේ ඇත්ත ප්‍රශ්න කතාකරන්නෙත් නැහැ. ඒක වෙන එකක්. අපේ රටෙත් ඒ විදිහට තමයි කාන්තා දිනය සමරන්නෙ. අපේ රටේ වැඩකරන, මහන්සි වෙන, දුක්විඳින කාන්තාවන්ගේ ප්‍රශ්න එහෙමම තියෙද්දි ඔවුන්ගේ ශ්‍රමය ආණ්ඩුවට ගන්නවා පමණයි. හැබැයි, එහාට ගිහින් ඔවුන්ගේ ඇත්ත ප්‍රශ්න කතාකරන, ඒවට විසඳුම් සොයන ඒ වෙනුවෙන් මැදිහත් වෙන පසුගිය ආණ්ඩු තිබුණෙ නැහැ. ඒකෙ ප්‍රතිඵලයක් විදිහට තමා අදත් අපේ රටේ කාන්තාවන්ගේ දින තිබුණත්, කාන්තා දින සැමරුවත් කාන්තා ප්‍රශ්න වැඩිවෙලා මිසක් අඩුවෙලා නැත්තේ. අර්බුදයක් දක්වා පත්වෙලා තියෙන්නේ.

සමාජවාදී කාන්තා සංගමය විදිහට අපි, කාන්තා දිනය සමරන්නේ එහෙම නොවෙයි. සෑම කාන්තා දිනයකදිම අපි, රටේ හා ලෝකයේ ඉන්න කාන්තාවන්ට පණිවිඩයක් දෙන, ඔවුන් දැනුවත් කරන, ඔවුන් බලමුළු ගන්වන කාන්තා දිනයක් විදිහට වැඩසටහන් පෙළගස්වනවා. ඒ වගේම මෙවර කාන්තා දිනයෙදිත් අපි 04 සහ 05 දවස් දෙක, සෑම දිස්ත්‍රික්කයකම කාන්තාවෝ දැනුවත් කරන වැඩසටහන් යොදාගෙන තියෙනවා. අපේ ලාංකික කාන්තාවන්ගේ ප්‍රශ්න සහ ඒ වෙනුවෙන් ඔවුන් අරගල කරන්න ඕන කියන පණිවුඩයක් එක්ක ඊට අමතරව 08දා රටේම සාමාජික කාන්තාවන් ගෙන්වා ඔවුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් සූදානම් කරගෙන තියෙනවා. අපි විශ්වාස කරන්නේ කාන්තාවන්ගේ අයිතිය ලැබෙන්නේ, කාන්තාවන්ට ගරුකිරීමක් ලැබෙන්නේ කාන්තාවන්ගේ ඇත්ත ප්‍රශ්නයට උත්තරයක් ලැබෙන්නේ, සාධාරණ හා ගරුකිරීමක් ලැබෙන වටපිටාවක් තුළ පමණයි. ඒ වෙනුවෙන් තමයි අපි කාන්තාවො විදිහට මේ සමාජය වෙනස් කරල යහපත් සමාජයක් උදෙසා බලමුළු ගැන්වෙන්න ඕනෑ.

*නියමුවාඃ- මහජන නියෝජිත ආයතන තුළ කාන්තා නියෝජනය අවම වීම පිළිබඳව විශාල සංවාදයක් තිබෙනවා. පළාත් පාලන ආයතන තුළ කාන්තා නියෝජනය 25%ක් විය යුතු බවට නීතිද සම්මත වුණා. එහෙත් මේ ගැටලුවට විසඳුම් ලැබෙයිද?*



*සමන්මලී ගුණසිංහ සහෝදරියඃ-* පහුගිය කාලෙ සෑම පළාත් පාලන ආයතනයකම කාන්තා නියෝජනය 25% ක් විය යුතුයි කියලා නීතියක් සම්මත වුණා. හැබැයි ඒ සම්මත වුණු නීතියේ පවා අඩුපාඩුකම් තියෙනවා. මොකද ලිස්ට් එකක් හදනවද, ඒ ලිස්ට් එකෙන් 25%ක් ද, එහෙම නැත්නම් තේරෙන අයගෙන් 25%ද, එහෙම නැත්නම් මේකෙ නියෝජනය බෙදෙන්නේ කොහොමද කියන එකට අදාළ නිශ්චිතම කාරණා ඒ නීතිය තුළ නොමැති නිසා.

> "කාන්තාවන් විසින් උපදවන ආදායමින් වැඩිකොටසක් ශ්‍රම සූරාකෑම මගින් විදේශවලට යනවා මිසක් ඔවුන්ට අයිති වෙන්නේ නැහැ. ඒ නිසා ඔවුන් ඩොලර් ගෙනෙන අය වුණාත් ඔවුන්ගේ ජීවිත හැමදාමත් ගතවෙන්නෙ ලයින් කාමරවල, පොල් අතු පැලේ. නැත්නම් ආර්ථික ප්‍රශ්න රාශියකට මැදිවුණු පිරිසක් ලෙස. මේ ක්‍රමය වෙනස් කරනකම් ඔවුන්ට ඒකෙන් ගොඩ ඒමක් නැහැ."

කෙසේ වෙතත් අපි දකින්නේ කාන්තාවන්ට 25% නියෝජනය වෙන්කිරීම හොඳ දෙයක්. ඒ කියන්නේ රටේ ජනතාවගෙන් 52%ක් ඉන්නෙ කාන්තාවො. හරිනම් නියෝජන ආයතනවල මීට වැඩිය 50% ක් තියෙන්න ඕනෑ. නමුත් ප්‍රායෝගිකව ගත්තොත් අපේ වගේ රටක එහෙම නීති ගෙනාව පමණින් පළාත් පාලන ආයතනවලට කාන්තාවෝ පත්වෙයිද කියන ප්‍රශ්නාර්ථය අද සමාජය තුළ තියෙනවා. මොකද අද තිබෙන පිරිහුණු දේශපාලනයට එන්න කාන්තාවන් මැළිකමක් දක්වනවා. ඒකට ප්‍රධාන කරුණු කිහිපයක් තියෙනවා. මොකද ඔවුන් දේශපාලනයට එන්න බයයි. මොකද වෙඩි තියාගන්න, සල්ලි විසිකරන්න ඔවුන්ට බැහැ. එහෙම නැත්නම් පරම්පරාවෙන් පරම්පරාවට දේශපාලනය කරන, ඒ අනුව ඇගයීම් කරන මේ ජරාජීර්ණවූ දේශපාලනය තුළ තම හැකියාවන් මත කුමන පක්ෂයකින්වත් කාන්තාවන් දේශපාලනයට එයිද කියන ප්‍රශ්නය තියෙනවා. ඔවුන්ට තම හැකියාවන් මත තරග කරලා දේශපාලනයට එන්න හැකියාවක් නැහැ. ඒ ආවත් අපි දකින දේ තමා, ඇයට නියෝජිතවරියක් විදිහට ආයතනය තුළ කටයුතු කරන්න තියෙන ආරක්ෂාව, කාන්තාවක් නිසාම ගෙදරින් පරිසරයෙන් ලැබෙන පහසුකම් ප්‍රමාණවත් නැහැ. ඇය මහජන සේවිකාවක් විදිහට, මහජන නියෝජිතවරියක් 15 වැනි පිටුවට



# Yes We Can

# නිදහස් අධ්‍යාපන අයිතිය රැකගැනීමට පෙරට එමු!

මාලඹේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය සම්බන්ධයෙන් දෙන ලද අධිකරණ තීන්දුවක් සමඟ සයිටම් විරෝධය රට පුරා පැනනගිමින්ද ඇත. උසස්පෙළ සමත් වුවද රජයේ සරසවිවල ඉඩකඩ නොමැතිකමේ ප්‍රශ්නය නිසා වසරකට සිසු සිසුවියන් ලක්ෂයකට පමණ සරසවි වරම් අහිමි වෙයි. එවන් තත්වයක් තුළ රුපියල් එක්කෝටි විසිලක්ෂයකට වෛද්‍ය උපාධිය විකිණීම අතිශය බරපතළ අසාධාරණයකි. නිදහස් අධ්‍යාපනයට මරු පහරකි. අනෙක් පසින් සයිටම් ආයතනය විසින් ආරම්භයේ සිටම ප්‍රකාශයට පත්කළ තොරතුරු ව්‍යාජ බව දැන් තහවුරුවී අවසන්ය. ඒ නිසා එය වෛද්‍ය විද්‍යාලයක අවම සුදුසුකම්වත් නොමැති කළු කඩයකි. මෙවැනි ආයතනයකින් වෛද්‍යවරුන් රටට බිහිකිරීම යනු මුළු රටේම රෝගී ජීවිතවලට මරණ සහතික ලියා දීමකි. මුළු සෞඛ්‍ය ක්ෂේත්‍රයම අනතුරේ හෙළීමකි. මෙම ප්‍රශ්නයේ බැරෑරුම්කම නිසාම ඊට එරෙහි ප්‍රගතිශීලී සංවිධාන රැසක සහභාගිත්වයෙන් වඩා පළල්තම වේදිකාවක්, රට තුළ මේවන විට ගොඩනැගී ඇත. එසේ වුවද සයිටම් හොර උපාධි කඩය පිළිබඳ රටේ පාලකයෝ මේ වන විටත් මුණිවත රකිමින් සිටිති. තවත් පිරිසක් ඒ වෙනුවෙන් නිර්ලජ්ජිත ලෙස පෙනීසිටිමින් සිටිති. එනිසාම සයිටම් පිටුපස තිබෙන දේශපාලනය හොඳින් අවබෝධ කර ගත යුතුය.

පැහැදිලිවම මෙහි ඇත්තේ, නිදහස් අධ්‍යාපනය අහෝසි කිරීමේ ක්‍රියාවලියේ පියවරවල් ගණනාවකි. අප වැනි රටකට නිදහස් අධ්‍යාපනය අවශ්‍යම දෙයකි. සෑම දරුවෙකුටම අධ්‍යාපන අයිතිය උරුමකරදීම ආණ්ඩුවේ වගකීමක්, එය එසේ වුවත් අප රටේ ආණ්ඩුව මේ වගකීම පැහැර හරිමින් සිටින්නේ අද ඊයක සිට නොවේ. රටේ මුදල් බලය හිමි ඉතා සුළු පිරිසකට පමණක් අධ්‍යාපන වරප්‍රසාදය සීමා කිරීම පාලක පංතියේ වුවමනාවයි. ප්‍රමිතියෙන් තොර ආයතනයකින් දොස්තරවරුන් බිහිකිරීමේ අනතුර අප වැනි සමාජයක කොපමණද යන්න අමුතුවෙන් කිවයුතු නැත. එබැවින් 1986 උතුරු කොළඹ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය එදා ලාංකේය ශිෂ්‍ය ව්‍යාපාරයත් රටේ ප්‍රගතිශීලී බලවේගයනුත් එක්ව පරාජය කළා සේම වර්තමානයේද සයිටම් ආයතනය වසා දැමීම දක්වා මෙම සටන් ඉදිරියට ගෙන යා යුතුව තිබේ.

ධනපති ආණ්ඩුව නිදහස් අධ්‍යාපනයට එල්ල කරන පහරවල් අතර සයිටම් යනු එකක් පමණි. තවත් බොහොමයක් ක්‍රියාමාර්ග ආණ්ඩුව විසින් මේ මොහොතේ ක්‍රියාවට නගා ඇත.

පාසලේ පළමු වසරට ඇතුළත් වන සිසුවාගේ සිට විශ්වවිද්‍යාල ශිෂ්‍යයා දක්වාමත් කාර්මික විද්‍යාල ඇතුළු අනෙකුත් සියලුම රාජ්‍ය අධ්‍යාපනය ලබා දෙන්නා වූ ආයතන තුළ අධ්‍යාපන අවස්ථා කප්පාදුවටත් ගුරුවරුන්ගේ හිඟකමේ සිට අනෙකුත් පසුකම් කප්පාදුව දක්වාත් අද වනවිට රාජ්‍ය අධ්‍යාපනයේ කප්පාදුව දිගහැරී ඇත. එබැවින් වත්මන් පරපුරේ අධ්‍යාපන අයිතිය තහවුරු කිරීම සඳහා සයිටම් එකෙන් ඔබ්බට ගිය නිදහස් අධ්‍යාපන අයිතිය සුරැකීමේ වගකීමත් අප සතුය. මේ මොහොතේ අපි ඒ වගකීමටත් උරදී වැඩ කිරීමත් සයිටම් පැරදවීමත් එකම අරගලයක් බවට පත්කරගත යුතුව ඇත.

# ආදරයට දෑවැද්ද එපා!



වැලන්ටයින් දිනය නිමිත්තෙන් පෙබරවාරි 14 දින සමාජවාදී තරුණ සංගමය විසින් මෙවරත් වැඩසටහන් රැසක් සංවිධානය කර තිබුණි. එහි තේමාව වූයේ "ආදරයට මිලක් නැති, දෑවැද්ද නැති, කුලමල නැති හෙටක්" යන්නයි. ඒ යටතේ දිවයින පුරා අත්පත්‍රිකා බෙදීම හා වීදිනාට්‍ය දර්ශන ඉදිරිපත් කිරීමේ වැඩසටහනක් පැවැත්විණි. එහි ප්‍රධාන වැඩසටහනට කොළඹ කොටුව දුම්රිය ස්ථානයෙන් ගමන් ආරම්භ කළ "ආදරයේ දුම්රියේ" නැගී සමාජවාදී තරුණ සංගමයේ සාමාජික සාමාජිකාවෝ මාතර බලා පිටත් වූහ. එදින සවස මාතර වෙරළ තීරයේ දී ගීත ප්‍රසංගයක් හා දේශන කිහිපයක්ද පැවැත්විණි. එහි විශේෂ අවස්ථා ඡායාරූපවලින් දැක්වේ.

















# ඔබත් පෙරට එන්න...

තාරුණ්‍යයේ මහා මංගල්‍යය... ඒ කියන්නේ සමාජවාදී තරුණ සංගමයේ 03 වන ජාතික මහා සමුළුව පවත්වලා මේ වෙනකොට අවුරුද්දක් ගෙවිලා ගිහින්. එදා සිට අද දක්වා රටේ සෑම තැනකම පාහේ ඉන්න තරුණ තරුණියන්ගේ වගේම විදෙස්ගත ශ්‍රී ලාංකේය තරුණ ප්‍රජාවගේත් අයිතීන් වෙනුවෙන් නායකත්වය දෙන්න සමාජවාදී තරුණ සංගමය සමත් වී තිබෙනවා. ඒ නිසා තමයි බාහිර උපාධි සටන තුළ, දුරකථන හා අන්තර්ජාල ගාස්තු මත පැනවූ අසාධාරණ බදුවලට එරෙහි සටන තුළ වගේම තරුණ තරුණියන්ගේ රැකියා හා අධ්‍යාපන සටන් තුළත් සමාජවාදී තරුණ සංගමය ඉදිරියෙන්ම සිට නායකත්වය දුන්නේ.

නමුත් තවමත් අපට දිනාගන්නට බොහෝ දේ තිබෙනවා. නෑසූ කන්ව සිටින මේ මෛත්‍රී - රනිල් හවුල් ආණ්ඩුවට එරෙහිව විශාල තරුණ බලයක් ගොඩනැගිය යුතුව තිබෙනවා. තරුණ අපේ බලය විසින් මේ ප්‍රෝඩාකාරී ආණ්ඩුව මට්ටු කළ යුතුව තිබෙනවා. ඒ නිසා අපේ රටේ තරුණ තරුණියන්ගේ ජවය මේ සටනට එක් කළ යුතුව තිබෙනවා.

ඒ නිසා අලුත් නායකත්ව මණ්ඩලයක් තුළින් මේ සටන තව තවත් ධෛර්යමත්ව, ශක්තිමත්ව ඉදිරියට ගෙන ඒමට කාලය එළැඹ තිබෙනවා. ගම්දනව් සිසාරා තරුණ සමිති පිහිටුවමින්, තරුණ බලමණ්ඩල හා දිස්ත්‍රික් තරුණ සමුළු බලමුළු ගන්වමින් ඒ නායකත්වය බලමුළු ගන්වන්නට සමාජවාදී තරුණ සංගමය මේ වෙනකොටත් කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒ නිසා මේ මාසය කියලා කියන්නේ රට පුරාම තරුණ ජවය ඒකරාශී වෙන මාසයක්. ඒ එකතු වෙන තරුණ ජවයෙන් තාරුණ්‍යයේ අයිතීන් දිනා දෙන සටනට පණපොවන මාසයක්.

අපේ අධ්‍යාපන අයිතිය වෙනුවෙන්, නව රාජ්‍ය සරසවි අලුතින් ආරම්භ කිරීම සඳහා ආණ්ඩුවට බලකිරීම වෙනුවෙන්, බාහිර උපාධි කප්පාදු කරන චක්‍රලේඛය අහෝසි කිරීම වෙනුවෙන්, අපේ රැකියා අයිතිය වෙනුවෙන්, රැකියා ලැබෙන තුරු විරැකියා දීමනාවක් ලැබීම වෙනුවෙන්, අසාධාරණ ලෙස පැනවූ දුරකථන හා අන්තර්ජාල බදු පහත හෙළීම වෙනුවෙන්, විෂමත්ද්‍රව්‍යයෙන් තාරුණ්‍යය මුදවා ගැනීම වෙනුවෙන් හා රටේ ජාතික සමගිය වෙනුවෙන් සටන් කරන්න අපි සූදානම්.

ඉදින් ඒ සටනට නායකත්වය දෙන්න, රට දිනන බලයට තරුණ ජවය එක් කරන්න, මේ මොහොතේදී ඊට ශක්තිය එක් කරන්න ඔබත් පෙරට එන්න...

"යන්නේ කොහේද කියල දන්නේ නැතිව යායුතු ආකාරය දැනගෙන සිටීම, යන්නේ කොහේද කියල දැනගෙන යායුතු ආකාරය නොදැන සිටීමට වඩා භයානකයි"

'කෙමාඩා' චිත්‍රපටය

## එළියක් ඕනෑ....

විනිවිදින්නට අඳුර
මුළු ලොවම වෙළාගත්
කළු වළා තල්ලු කොට
හිරු වළා නැගෙනතුරු
ක්ෂිතිජයේ මායිම් පැන...
ලොවක් නිපැයුම් කළ
අරුත් සොයන්නට
පසාරු කළහද
සොව නසා
හිනැහෙන්නට...
ඕනෑකර තිබේ...
එළියක්...
රවා ගොරවනවුන්
නිවා සනසනු වස්...

# ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය හා පුංචි ඡන්දය

පුංචි ඡන්දය හෙවත් පළාත් පාලන මැතිවරණය නොපවත්වා දිගින් දිගටම කල් දැමීම පිළිබඳ සමාජය තුළ කථාබහක් නිර්මාණය වී තිබේ. ආණ්ඩුවට සම්බන්ධ පාර්ශව විවිධ හේතු කියමින් ඡන්දය කල්දමන පැත්තට කටයුතු කරන අතර රාජපක්ෂ කල්ලිය, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන, ඡන්දය කෙසේ හෝ වහාම පැවත්විය යුතු බව කියති. අප කියන්නේද ඡන්දය වහාම පැවැත්විය යුතු බවය. එහෙත් ඊට පෙර පුංචි ඡන්දය පිළිබඳව විසඳාගත යුතු කරුණු කීපයක් තිබේ.

මැතිවරණයක් යනු ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රකාශයට පත් වන ප්‍රබල ආකාරයක් නම් ඡන්දය පැවැත්වීම මෙන්ම ඡන්දය පවත්වන ක්‍රමය හා ඡන්ද ක්‍රමයද ප්‍රජාතන්ත්‍රවාදී විය යුතුය. එහෙත් රාජපක්ෂ කල්ලිය කෑගසන්නේ ප්‍රජාතන්ත්‍රවාදයේ අර්ථයෙන් නොව තම පිලට බලය ගැනීමට ඇති, තම දෙවැනි තුන්වැනි පෙළට මන්ත්‍රීකම් නොමැති නිසා එය ලබා ගැනීමට ඇති ආශාවේ අර්ථයෙනි. එසේම මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම්වලටද ඡන්ද ක්‍රමය හොඳද නරකද යන්නට වඩා කුමන ක්‍රමයෙන් හෝ ඡන්දය පවත්වා ගැනීම වැදගත්ය. ඒ, ඔවුනට අරමුදල් ගලා එන්නේ ඡන්ද පවත්වන විටදී පමණක් වීම නිසාය. එසේ නැතිව ප්‍රජාතන්ත්‍රවාදයේ පැවැත්ම ගැන පමණක් සිතාම නොවේ. එහෙත් ප්‍රජාතන්ත්‍රවාදය සඳහා නම් ඡන්දය ප්‍රජාතන්ත්‍රවාදයට අනුවම පැවැත්විය යුතුය. එහෙත් මෙම කරුණේදී ධනපති ප්‍රජාතන්ත්‍රවාදය කොතරම් කුහකද යන්න එය තම භාවිතයෙන්ම ඔප්පුකර තිබේ.

ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව ලෙනින් වරක් මෙසේ පවසා තිබේ. "**මධ්‍යතනවාදය සමග සංසන්දනය කරන කල ධනපති ප්‍රජාතන්ත්‍රවාදයෙන් මහා ඓතිහාසික ඉදිරිග මනක් සලකුණු වන නමුත්, එය කවදත් සීමා කළ, කප්පාදු කළ, ව්‍යාජ හා වංචනික ප්‍රජාතන්ත්‍රවාදයක්ද ධනපතින්ට පාරාදීසයක් සහ සූරාකනු ලබන්නන්ට, දුප්පතුන්ට උගුලක් හා රැවටිල්ලක්ද වුයේය. ධනපති ක්‍රමය යටතේ එය එසේම පැවතීම නොවැළක්විය හැකිය." (ලෙනින්, තෝරාගත් කෘති, 9 වෙළුම, 23 පිටුව)** ලෙනින් විසින් ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ පවසා ඇති මේ සියලු ලක්ෂණ ධනපති මැතිවරණ හා මැතිවරණ ක්‍රම තුළ දැකිය හැකිය. ධනපති පාලකයෝ තමන්ට වාසිදායක වෙලාවට ඡන්ද නියමිත කාලයට කලින් පවා පවත්වන අතර තත්වය තමන්ට අවාසිදායක නම් විවිධ හේතු පෙන්වමින් ඡන්ද කල්දමති. ජේ. ආර්. ජයවර්ධන පාලනය තුළ 1983ට නියමිත මහ මැතිවරණය නොපවත්වා ජනමතවිචාරණයකින් ඡන්ද කොල්ලකා පාර්ලිමේන්තුවේ කාලය දිගුකර ගත්තේ ජ.වි.පෙ. පාර්ලිමේන්තු ඒම වැළැක්වීමටය. එවිට ධනපතීන්ගේ ඡන්ද ධනපති පාලකයින්ටම එපා වේ. එසේම මහින්ද රාජපක්ෂ පාලනය තුළ යුද්ධය නිමාවීමේ වාසිය තුළ නැති ඡන්ද හොයමින් මාස් පතා ඡන්ද පවත්වනු ලැබුයේද තම වාසිය සඳහාය. මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපතිවරණය වසර දෙකකට පෙර පැවැත්වූයේද (එය වැරදුණු කුරුමානමක් වුවත්) තමන්ට වාසි යයි සිතාය.

වත්මන් පාලනය දැන් පළාත් පාලන ඡන්දය ප්‍රමාද කරමින් සිටින්නේද තමන්ට එය අවාසිදායක නිසාය. ඒ සඳහා ඔවුනට ජනතාවට පැවසීමට විවිධ හේතු තිබුණත් සත්‍ය හේතුව නම් ඔවුන් ඡන්දයකට බියවී සිටීමය. පුංචි ඡන්දය පැවැත්වීමට ආණ්ඩුව අකමැත්තක් දක්වන්නේ ඇයි? එම ඡන්දයේදී බොහෝ විට වත්මන් ආණ්ඩුව නියෝජනය කරන පක්ෂ දෙක වූ එ.ජා.ප. හා ශ්‍රීල.නි.ප. වෙන වෙනම තරග වදිනු ඇත. එක්ව ආණ්ඩුවක් කරමින් පුංචි ඡන්දයකදී වෙන වෙනම ඡන්දය ඉල්ලා වේදිකාවල එකිනෙකා විවේචනය කරන විට දැනටත් දුර්වලව පවතින ආණ්ඩුවේ පැවැත්ම අභියෝගයට ලක්වන බව ඔවුන් දනිති. එය වළක්වා ගත හැක්කේ ඊළඟ මහ මැතිවරණය එන තුරු කුඩා ඡන්ද කල්දමා ගැනීමෙනි. එසේම පක්ෂයක් ලෙස එ.ජා.පයද තවම බිමේ බලය ගොඩනගාගත නොහැකිව දුර්වලව සිටී. ඒ නිසාම පුංචි ඡන්දයේ ජයග්‍රහණය පිළිබඳ ඔවුන් තුළ ඇත්තේ සැකයකි. දැන් ආණ්ඩුවිරෝධය වැඩිවෙමින් තිබෙන නිසාත් එහි වැඩිම විරෝධය පවතින්නේ එ.ජා.ප.යට එරෙහිව නිසාත් ජනතා කැමැත්ත මැනෙන කුඩා ඡන්දයකට යාමට ඔවුන් බිය වෙති.

අනෙක් අතට ජනාධිපතිවරයාට ද ඇත්තේ ඡන්දය පිළිබඳ බියකි. පුංචි ඡන්දය ආවිට ශ්‍රීල.නි.ප. තරග කරන්නේ කෙසේද යන්න කවුරුත් නොදනිති. බොහෝ විට රාජපක්ෂ පිල වෙනම කණ්ඩායමක් ඉදිරිපත් කිරීමට ඉඩ තිබේ. එවිට දැන් පවතින නිල නොවන ශ්‍රීල.නි.ප. බෙදීම නිල බවට පත්වේ. එය මෛත්‍රීපාල පිලට හොඳ නැත. එසේම මෛත්‍රීපාල පිලට වෙනම ඡන්දය කිරීමට සිදුවුව හොත් ජනාධිපතිවරයා සතු ඡන්ද ප්‍රමාණය මැනෙන අතර එවිට ජනාධිපති ධුරයේ බලයද අභියෝගයට ලක්වේ. මේ නිසා අතරමග පුංචි ඡන්ද නැති නම් ජනාධිපතිවරයාට හොඳය. මේ සියලු කාරණා ඡන්දය කල්යාමට හේතුවී තිබේ.

පුංචි ඡන්දය තුළ ඇති සැබෑ අනතුර හා අර්බුදය ඡන්දය කල්යාමම නොවේ. මෙම විකෘති ඡන්ද ක්‍රමය යටතේ ඡන්දය පැවැත්වුවහොත් ඉන් සිදුවන හානිය හා දේශපාලනය අපරාධයය.

ධනපති පාලන කණ්ඩායම් තමන්ට වාසිදායක කරුණු මත ඡන්දය පැවැත්වීම හෝ නොපැවැත්වීම තීරණය කරනවාක් මෙන්ම ඡන්ද ක්‍රමද ඒ අනුවම වෙනස් කරති. 78දී ජයවර්ධන මහතා විසින් පැවති ඡන්ද ක්‍රමය වෙනස් කර සමානුපාතික ක්‍රමය ගෙන ආවේ තම පක්ෂයට ඉන් සදාකාලිකව වාසිවේ යයි සිතාය. එහෙත් දැන් එම සමානුපාතික ක්‍රමයම පාලකයින්ට අර්බුදයක් වී පාරාවළල්ලක්ව තිබේ. එම ක්‍රමය තුළ ජ.වි.පෙ. වැනි වමේ බලවේග ජයග්‍රහණ ලබන නිසා දැන් වහාම ඡන්ද ක්‍රමය වෙනස් කළ යුතුය. ප්‍රජාතන්ත්‍රවාදය කප්පාදු කළ යුතුය. සීමාකළ යුතුය. රාජපක්ෂ පාලනය තුළ පුංචි ඡන්දය සඳහා අලුත් ක්‍රමයක් සම්මත කරගත්තේ ඒ අනුවය. අලුත් ක්‍රමය හැදීමේදී ප්‍රකාශිත හේතුව ලෙස මනාප ක්‍රමය නිසා ගැටලු ඇතිවීම පෙන්වුවද සත්‍ය හේතුව වුයේ, ජනතා විමුක්ති පෙරමුණ වැනි පක්ෂ මහජන නියෝජිත ආයතනවලින් පලවා හැර ධනපති පංතියේ ද්විපක්ෂ පාලනයක් තහවුරු කර ගැනීමය.

එබැවින් වර්තමානයේ පැවැත්වීමට නියමිත පළාත් පාලන ඡන්ද ක්‍රමයේ ඇත්ත ගැටලු පවතින්නේ, එහි ඇති තාක්ෂණික දෝෂ තුළ නොව දේශපාලන වශයෙන් එහි ඇති හානිය තුළය. පුංචි ඡන්දය සඳහා රාජපක්ෂවරු කොට්ඨාස සීමා නිර්ණයේදීද තමන්ට වාසි ලෙස ඒවා අක්‍රමවත්ව වෙන්කළහ. පසුගිය දිනවල කොමිසමක් මගින් එම වැරදි සමහරක් යළි සකස් කරන ලදී. ඒ අනුව සීමා නිර්ණයේ දෝෂ නිවැරදි කළ හැක. එසේම විවිධ තාක්ෂණික ගැටලුද විසඳිය හැක. එහෙත් මෙහි බරපතළම ගැටලුව වන ඡන්ද ක්‍රමයේ හරය තුළ පවතින ද්විපක්ෂ ක්‍රමයකට පදනම දමන හා අනෙක් පක්ෂ දේශපාලනයෙන් පිටමං කරන හානිදායක බව ඉහත තාක්ෂණික ගැටලු නිවැරදි කිරීමෙන් විසඳෙන්නේ නැත. අර්බුදය එයයි.

දැන් නව සීමා නිර්ණයන් ගැසට් කොට තිබේ. ඊළඟට එක් එක් පළාත් පාලන ආයතනයේ මන්ත්‍රී සංඛ්‍යාවද ගැසට් කළ යුතුය. එයද පහසු නැත. මන්ද නව ඡන්ද ක්‍රමය තුළ එක් එක් ආයතනයේ මන්ත්‍රී සංඛ්‍යාව ඡන්දයට පෙර නිශ්චිතව කිව නොහැකි නිසාය. එයද විසඳා ගත්තත් තවත් ගැටලු ඇත. පළාත් පාලන ආයතනවල කාන්තා නියෝජනය 25%ක් විය යුතු බවට පාර්ලිමේන්තුව තුළ නීතියක් සම්මත කරනු ලැබ තිබේ. ඒ අනුව පළාත් පාලන ආයතනවලට එම කාන්තා 25% නියෝජනය ඇතුල්කර ගන්නා ක්‍රමවේදය සකස් කොට එය පළාත් පාලන ඡනද පනතට ඇතුල් කළ යුතුය. එසේම මැතිවරණ කොමසාරිස්වරයා විසින් පෙන්වා දී තිබෙන අඩුපාඩු රැසක්ද පනතේ තිබේ. ඒ සියල්ල සකස් කිරීමට මැතිවරණ පනත සංශෝධනය කළ යුතුය. එයද කළ හැක. එහෙත් මේ එකකින්වත් ඡන්ද ක්‍රමයේ ඇති ප්‍රජාතන්ත්‍රවිරෝධී බව අහෝසි වන්නේ නැත. මහජන මතය විකෘතිවීමේ අනතුර නිවැරදි වන්නේ නැත. බරපතළ ප්‍රශ්නය එයයි.

එබැවින් ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන, සියලු ජනකණ්ඩායම්වල කැමැත්ත මහජන නියෝජිත ආයතන තුළ සාධාරණව නියෝජනය විය යුතුයයි විශ්වාස කරන, රටේ සමහර දේශපාලන බලවේග මැතිවරණ බිමෙන් ඉවත් කිරීම අනාගත ව්‍යසනයකට අත වැනීමක් යයි දකින, සියලු දෙනා අරගල කළ යුත්තේ සටන් කළ යුත්තේ කෙසේ හෝ ඉක්මනින් පුංචි ඡන්දය පැවැත්වීමට නොව, නිවැරදි හා ප්‍රජාතන්ත්‍රවාදී ඡන්ද ක්‍රමයකින් ඉක්මනින් පුංචි ඡන්දය පැවැත්වීමටය. එබැවින් දැනට පළාත් පාලන ඡන්ද සඳහා පමණක් සම්මත කොට තිබෙන විකෘති සහගත මැතිවරණ ක්‍රමය වෙනුවට සියලු මැතිවරණවලට යොදාගත හැකි නව සාධාරණ මැතිවරණ ක්‍රමයක් සකසා ගත යුතු අතරම

15 වැනි පිටුවට

> මැතිවරණ කොමසාරිස්වරයා විසින් පෙන්වා දී තිබෙන අඩුපාඩු රැසක්ද පනතේ තිබේ. ඒ සියල්ල සකස් කිරීමට මැතිවරණ පනත සංශෝධනය කළ යුතුය. එයද කළ හැක. එහෙත් මේ එකකින්වත් ඡන්ද ක්‍රමයේ ඇති ප්‍රජාතන්ත්‍රවිරෝධී බව අහෝසි වන්නේ නැත. මහජන මතය විකෘතිවීමේ අනතුර නිවැරදි වන්නේ නැත. බරපතළ ප්‍රශ්නය එයයි.





"අපි ධනපති පංතියට මෙසේ කීවෙමු: සූරාකන්නන් හා වංචනිකයින් වන නුඹලා ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන්නහුය. නමුත් ඒ අතරම, පීඩිත ජනතාව දේශපාලනයට සහභාගිවීමෙන් වැළැක්වීම පිණිස බාධක දහස් ගණන් ඉදි කරන්නහුය. අපි නුඹලා කියන දේ එසේ ගනිමින්, මෙම ජනතාවගේ යහපත පිණිස නුඹලා බලයෙන් පහකර දැමීමේ අරමුණ ඇතිව මෙම ජනතාව විප්ලවයට සූදානම් කරනු සඳහා නුඹලාගේ ප්‍රජාතන්ත්‍ර පුළුල් කරන ලෙස බල කරමු.''

**ලෙනින්,**
**තෝරාගත් කෘති,**
**9වැනි වෙළුම,**
**67 පිටුව**

# ජන අයිතිය බේරගන්න අපිත් එක්ක එකතු වෙන්න




ජනතාවට - අපි කියන්නේ
අධ්‍යාපනෙ-බේරගන්න
ජන අයිතිය - බේරගන්න
හොර සයිටම් - පරදවන්න
අපිත් එක්ක - එකතු වෙන්න ,
අපිත් එක්ක - පෙරට එන්න

පසුගිය පෙබරවාරි 23 වෙනිදා සයිටම් ආයතනයට සහ එයට පිටුපසින් එන අධ්‍යාපන පෞද්ගලීකරණ ක්‍රියාවලියට එරෙහිව ජනතා විමුක්ති පෙරමුණ විසින් උද්ඝෝෂණ පාගමනක් පවත්වන ලදී.

සුදුසුකම් නොමැති සයිටම් ආයතනයෙන් වෛද්‍ය උපාධිය ලබා දීමට කටයුතු කිරීම මේ මොහොත වන විට රටේ ප්‍රධාන ප්‍රශ්නයක් බවට පත්ව තිබේ. එනිසාම රට සයිටමයට පක්ෂ හා විපක්ෂ ලෙස පිල් බෙදෙමින් පවතී. සැබැවින්ම රටේ පාලක පංතිය මේ කරමින් සිටිනුයේ සයිටමය ඉදිරියට දමා නිදහස් අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම වළලා දැමීමට බව ඉතා පැහැදිලිය. රටේ ජනතාවගේ අයිතිවාසිකම් කප්පාදු වන සෑම මොහොතකම එයට එරෙහිව පළමු වෙඩි මුරය තැබුවේ ජ.වි.පෙ. ප්‍රමුඛ ප්‍රගතිශීලී ජනතාව විසිනි. විශේෂයෙන් ජනතාවගේ අධ්‍යාපන අයිතිවාසිකම් කප්පාදු වන සෑම මොහොතකම එය රැකගැනීමට කටයුතු කරනු ලැබුවේ ජ.වි.පෙ. නායකත්වය යටතේ මෙරට ශිෂ්‍ය ව්‍යාපාරය බව ඉතිහාසය කියාපායි.

අද දවසේද රටේ නිදහස් අධ්‍යාපනය රැක ගැනීම වෙනුවෙන් බලවේග සංවිධානය කළ හැකි එකම දේශපාලන ව්‍යාපාරය ජනතා විමුක්ති පෙරමුණ බව තහවුරු වී අවසානය.

පෙබරවාරි 23වැනිදා පැවති "නිදහස් අධ්‍යාපනය වනසන සයිටම් එපා!" යනුවෙන් මරදාන ටෙක්නිකල් හන්දියේ සිට කොටුව දුම්රියපොළ දක්වා පැමිණි මෙම උද්ඝෝෂණ පෙළපාලියට ජ.වි.පෙ. නායක අනුර දිසානායක, ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන බිමල් රත්නායක, නලින්ද ජයතිස්ස, නිහාල් ගලප්පත්ති, සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක රංගන දේවප්‍රිය යන සහෝදරවරුන්ද, සමස්ත ලංකා වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ ප්‍රධාන ලේකම් වෛද්‍ය ජයන්ත බණ්ඩාර, අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපති වසන්ත සමරසිංහ ඇතුළුව ජ.වි.පෙ. සාමාජික සාමාජිකාවෝ විශාල පිරිසක් සහභාගි වී සිටියහ.

# සයිටම් විරෝධය පුළුල් පෙරමුණකට



සයිටම් අර්බුදය මෙරට සමාජ දේශපාලන කතිකාව උණුසුම් කර හමාරය. සයිටම් ආයතනයෙන් ලබා දීමට නියමිත වෛද්‍ය උපාධියට එරෙහිව මෙන්ම පක්ෂවත් විවිධ සංවිධාන, දේශපාලන පක්ෂ කාලයක සිට විවිධ ආකාරයේ ක්‍රියාමාර්ග ගනිමින් සිටී. මෙයට පක්ෂව කටයුතු කරන පාර්ශව පසෙක තැබුවත් එයට එරෙහිව කටයුතු කරන ඇතැම් පාර්ශව තුළ පවා මෙය පරාජය කිරීමේ නිසි ඉලක්කයක් තිබුණේද යන්න වෙනම විමසා බැලිය යුතු කරුණකි.

ඇතැම් කුඩා දේශපාලන කණ්ඩායම් උත්සහ කළේ සයිටම් විරෝධය තමන් තුළම තබා ගනිමින් සටන පොදු නොකර එය තමන්ට කේන්ද්‍ර කරගනිමින් තම දේශපාලන ව්‍යපෘතිය බවට පත්කරගෙන පවත්වාගෙන යාමය. ඇතැම් සංවිධාන රාජපක්ෂ පාලනයට අවශ්‍ය ආකාරයට සයිටම් විරෝධය කළමනාකරණය කරන්නට විය. එනිසාම මේ අවස්ථාවාදී සෑම කොටසක්ම සයිටම් අර්බුදය හමුවේ ජ.වි.පෙ. පසක තබා කටයුතු කිරීමට වගබලා ගත්තද ජ.වි.පෙ. අධ්‍යාපනය පෞද්ගලීකරණය කිරීමට එරෙහිව තම ක්‍රියාමාර්ග අඛණ්ඩව රැගෙන යන ලදී.

සැබෑ ලෙසම ගත හොත් රටේ අධ්‍යාපන කප්පාදුවට එරෙහි වීමේ සුජාතභාවය ඇත්තේ ජ.වි.පෙ. ප්‍රමුඛ මෙරට ශිෂ්‍ය ව්‍යාපාරයටය. එම අයිතිවාසිකම් කප්පාදු කිරීම්වලට එරෙහි වීම හේතුවෙන් ජීවිතවලින් පවා වන්දි ගෙවීමට සිදුවූ ඉතිහාසයක් ජ.වි.පෙ.ට තිබේ.

කෙසේ නමුත් රනිල් - මෛත්‍රී හවුල් පාලනය තුළ මේ අර්බුදය තීව්‍ර වීම හේතුවෙන් සයිටම් විරෝධය වෙනුවෙන් පෙනී සිටින සියලු පාර්ශවයන්ට එකම වේදිකාවකට ගොඩවීමට තත්වයන් විසින් බල කෙරුණි.

මෙවන් වටපිටාවක් තුළ පසුගිය පෙබරවාරි හයවනදා රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය සහ ජ.වි.පෙ. නායක අනුර දිසානායක, ජාතික සංවිධායක බිමල් රත්නායක යන සහෝදරවරුන් සමග බත්තරමුල්ල පැලවත්ත පිහිටි ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී සයිටම් ආයතනය අහෝසි කිරීම සම්බන්ධයෙන් එක්ව ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ සාකච්ඡාවක් පවත්වනු ලැබූ අතර වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය නියෝජනය කරමින් වෛද්‍ය අනුරුද්ධ පාදෙණිය, වෛද්‍ය නවීන් සොයිසා යන මහත්වරුන් ප්‍රමුඛ නිලධාරි කිහිප දෙනෙක් සහභාගි වූහ.

එසේම පෙබරවාරි අටවෙනිදා වෛද්‍ය පීඨ ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුව, අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයද සයිටම් ආයතනයට එරෙහිව ගත හැකි ඒකාබද්ධ ක්‍රියාමාර්ග පිළිබඳව ජ.වි.පෙ. සමග සාකච්ඡාවක නිරත විය.

# වන්දි නැත - කොමිස් ඇත

රටේ ජනාධිපතිවරයාද, කෘෂිකර්ම ඇමතිවරයාද ගොවිජනපදවලින් පැමිණියවුන් බවට ඇතැම් වෙලාවක ඔවුන්ද නැතිනම් වෙනත් අයවළුන් විසින්ද පාරම්බාන ආකාරය අපි නොයෙක් විට දැක ඇත්තෙමු. මෙවන් ප්‍රකාශවල යටි අරුත වන්නේ තමන්ගේ එකෙක් රටේ පාලන තන්ත්‍රයේ සිටින බව අඟවා එම ගොවි බිම්වල වෙසෙන ජනතාවගේ සිත් සතන් සැනසීම මිස වෙන කිසිවකුත් නොවේ.

මේ මොහොත වන විට රනිල් - මෛත්‍රී හවුල් පාලනය ඉතිහාසය පැවති දුර්වලම ආණ්ඩුව බවට පත් වෙමින් තිබේ. එනිසාම සෑම ක්ෂේත්‍රයක්ම බිඳ වැටීමකට ලක් වි ඇති අතර රටේ ජනතාවගේ මූලික අයිතිවාසිකම් දිනෙන් දින කප්පාදු වෙමින් පවතී. රට කරවනවුන්ගේ මූලිකම අරමුණ වී ඇත්තේ, තමන්ට ලැබෙන කොමිස් මුදල මිස වෙන කිසිවක් නොවේ. සෞඛ්‍ය , අධ්‍යාපනය මෙන්ම කෘෂිකර්මාන්තයද අද දවසේ සීඝ්‍ර ලෙස බිඳ වැටෙමින් තිබේ. ඒ බව ගොවි ජනපද පදනම් කරගනිමින් ආණ්ඩුවට එරෙහිව නැගෙමින් එන ගොවි අරගල මගින් කිසියම් ප්‍රමාණයකට වටහා ගත හැකිව තිබේ.

මෑත කාලයේ පැවති ගොවි අරගල සම්බන්ධයෙන් අවධානය යොමු කරන විට පෙනී යන මූලික කාරණයක් වී තිබෙන්නේ එහි නායකත්වය ජ.වි.පෙ. ගොවි සංවිධානය වන සමස්ත ලංකා ගොවිජන සම්මේලනයට හිමිව ඇති බවය. ගොවි ජනතාව එදිනෙදා මුහුණ දුන් පොහොර සහනාධාරය , අස්වැන්න විකුණාගැනීම, සහල් අර්බුදය ආදී විවිධ ගැටලු හමුවේ කිසියම්ම පමණක හෝ සහනයක් ලබා දීමට ගොවිජන සම්මේලනයට හැකි විය. පසුගිය පෙබරවාරි මාසයේදී මාස් කන්නයේ වගා අහිමි වූ ගොවීන්ට අක්කරයකට රු.50,000ක වන්දි මුදලක් ලබා දෙන ලෙස බල කරමින් අනුරාධපුර, පොළොන්නරුව සහ ඇඹිලිපිටිය යන පෙදෙස්වල උද්ඝෝෂණ මාලාවක් සංවිධානය කරන ලදී.

මෙසේ ගොවි ජනයාගේ වන්දි මුදල් දීමට කර අරින ආණ්ඩුව කෘෂිකර්ම අමාත්‍යංශය ගෙන එනවායි කියන හිස් ගොඩනැගිල්ලකට මාස අටකට අධික කාලයකි රුපියල් කෝටි ගණනක මුදලක් නිරපරාදේ යෙදවීමට විරෝධය පාමින් පසුගිය පෙබරවාරි 16 වෙනිදා කොළඹ රාජගිරියේ පිහිටි එම ගොඩනැගිල්ල ඉදිරිපිට ගොවිජන සම්මේලනය විසින් උද්ඝෝෂණයක් පවත්වන ලදී. උද්ඝෝෂණය පැවති මොහොත වන විටත් රුපියල් කෝටි 89කට අධික මුදලක් එම හිස් ගොඩනැගිල්ල වෙනුවෙන් ගෙවා ඇති අතර ඒ වෙනුවෙන් වෙන්වන සම්පූර්ණ මුදල රුපියල් කෝටි 208 කට අධික බවත් මේ වෙනුවෙන් කෘෂිකර්ම ඇමති දුමින්ද දිසානායකට විශාල කොමිස් මුදලක් ලැබී ඇති බවට බලවත් සැකයක් පවතින්නේ යැයිද ඔවුහු එහිදී අවධාරණය කළහ.

මේ අවස්ථාව සඳහා සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ ජාතික සංවිධායක නාමල් කරුණාරත්න සහෝදරයා ඇතුළුව එහි සාමාජිකයෝ රැසක් සහභාගිවී සිටියහ.




# ගමින් ගමට



බොහෝ දේශපාලන පක්ෂ ජනතාව ඉදිරියට ගමන් කරනුයේ ඡන්දයක් අභිමුවය. රටේ ජනතාවත් හුරු වී ඇත්තේ ඒ ආකාරයටය. අදාළ ඡන්ද ව්‍යාපාරයෙන් පසු ජනතාව තමන්ගේ පාඩුවේ එදිනෙදා තම කටයුතු කරගෙන යන අතර ඡන්දයෙන් ජය ලැබුවන්ද ජනතාව පසෙක තබා තමන්ගේ මඩි තර කර ගැනීමේ ව්‍යාපෘතිද පාඩුවේ සිදුකරගෙන යනු ලබයි.

ඡන්දයක් අභියස දේශපාලනයේ සැබෑ තතු ජනතාවට ඒත්තු ගැන්වීමට තරමක් අසීරුය. එසේ වී ඇත්තේ බොහෝ පිරිස් සත්‍යය කෙසේ වෙතත් තම කර තබාගෙන ආ පක්ෂය දිනවීමේ තරගයකට අවතීර්ණ වී සිටිමයි. ජ.වි.පෙ. එයට වෙනස් ආකාරයක් තෝරා ගනිමින් ඡන්දයක් පෙනෙන ඉසව්වකවත් නොමැති මොහොතක රටේ ඇත්ත තතු පහදා දීමට ජනතාව අතරට යාමට තීරණය කරන ලදී.

පසුගිය ජනවාරි මාසයේ අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් ඇරඹි මෙම දිස්ත්‍රික් මෙහෙයුම පෙබරවාරි 16 -19 මාතර දිස්ත්‍රික්කයේදීත් පෙබරවාරි 24 -27 කුරුණෑගල දිස්ත්‍රික්කයේදීත් පැවැත්වුණු අතර එම ජන හමු සහ රැස්වීම් සඳහා එම පෙදෙස්වල විද්වතුන්, ව්‍යාපාරිකයන්, ආගමික නායකයන්, ගොවීන්, කාන්තාවන් ඇතුළු විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් පිරිස් සහභාගි වූහ.

මෙම මෙහෙයුම් සඳහා ජ.වි.පෙ. නායක අනුර දිසානායක, ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා, ප්‍රචාරක ලේකම් විජිත හේරත්, දේශපාලන මණ්ඩල සභික ලාල් කාන්ත, ජාතික සංවිධායක බිමල් රත්නායක, සුනිල් හඳුන්නෙත්ති යන සහෝදරවරුද ජ.වි.පෙ. ප්‍රාදේශීය නායකයයෝ රැසක්ද සහභාගි වූහ.

# සමාජවාදය තුළ විරැකියාවක් තිබේද?






"යම්කිසි එක් රටක සමාජවාදී ආණ්ඩුවක් ජය ලැබූ මොහොතේ සිට, ප්‍රශ්න විසඳිය යුත්තේ, එක් හෝ තවත් අධිරාජ්‍යවාදයක් වඩාත් යෝග්‍යයද යන්න අනුව නොව, දැනටමත් ආරම්භ වී ඇති සමාජවාදී විප්ලවයේ වර්ධනයට හා තහවුරු වීමට අදාළ තත්වයන්ගේ සුවිශේෂී දෘෂ්ටි කෝණය අනුවය."

**ලෙනින්,**
**විප්ලවවාදී වාග් පාඨ,**
**11 පිටුව**

සමාජවාදය පිළිබඳ පතුරුවා ඇති මිථ්‍යා මතවලින් එකක් වන්නේ, සමාජවාදය තුළදී බලහත්කාරයෙන් වැඩ ගන්නේය යන්නය. එනම් සමාජවාදය තුළදී බලහත්කාරී ක්‍රමයක් පවතින බවය.

එහෙත් ඇත්ත වශයෙන්ම බලහත්කාරී ශ්‍රමය පවතින්නේ, සමාජවාදය තුළ නොව ධනවාදය තුළය. ධනවාදය තුළදී සමාජයේ සාතිශය බහුතරයක් වැටුප් ශ්‍රමිකයන් බවට පත් කොට තිබේ. ඔවුන්ට සිය දෛනික අවශ්‍යතා, එනම් ආහාර, ඉඳුම්-හිටුම්, ඇඳුම්-පැළඳුම්, ඖෂධ ආදිය ලබාගැනීමට නම් රැකියාවක් කිරීමට සිදුවේ. එහෙත් ඒ අතරම ධනවාදය තුළදී රැකියාවක් සොයා ගැනීම ලෙහෙසි නැත. එක් අතකින් රැකියා නැත්තවුන් මිලියන ගණනක් සිටිති. අනෙත් අතින් රැකියා අවස්ථා හිඟය. මේ නිසා වැටුප් ශ්‍රමිකයාට ඉතා අවාසි සහගත කොන්දේසි යටතේ අඩු වැටුපකට රැකියාවක් කර සිය දෛනික අවශ්‍යතා සපුරා ගැනීමට බල කෙරේ.

එහෙත් ඒ අතරම ඔවුන්ගේ ශ්‍රමයෙන් ලාභ ලබන අතළොස්සක් කිසිදු ඵලදායී ශ්‍රම වැගිරීමකින් තොරවම සුඛෝපභෝගී ජීවිත ගත කරති.

සමාජවාදයේදී ජනතාවගේ වැඩිවන ද්‍රව්‍යමය හා අධ්‍යාත්මික වුවමනාවන් හැකි උපරිමයෙන් තෘප්ත කිරීමට සමාජවාදී රජය උත්සාහ කරයි. ඒ සඳහා රටේ නිෂ්පාදනය ඉහළ දැමිය යුතු වන්නේය. රටේ නිෂ්පාදනය ඉහළ නැංවීම ජනගහනයේ සියලු දෙනාම දායක කර ගැනීමෙන් තොරව සිදුකළ හැකි නොවේ. මේ නිසා ධනවාදයේදී මෙන් නොව සමාජවාදයේදී ආර්ථිකයේ ඉඩ ප්‍රස්ථා පුළුල් වේ. වැඩි වැඩියෙන් කර්මාන්තශාලා, ගොවිබිම්, පාසල්, රෝහල්, මංමාවත් ඉදිවේ. ඒ සමගම රැකියා අවස්ථා නිර්මාණය වේ.

රටේ නිෂ්පාදනය ඉහළ යන ප්‍රමාණයට එහි ප්‍රතිලාභ යළි ජනතාව වෙත ළඟාවේ. මේ නිසා සමාජවාදයේදී ඔවුන් ශ්‍රමය වගුරන්නේ, ධනවාදයේදී මෙන් තත්වයන් විසින් බලකරනු ලදුව, අකමැත්තෙන් නොවේ; ස්වේච්ඡාවෙනි.

මේ නිසා විරැකියාව තුරන් කළ හැක්කේ සමාජවාදයට පමණි. විරැකියාව තුරන් කළ ලෝකයේ ප්‍රථම රට වන්නේ, සමාජවාදී සෝවියට් දේශයයි. පහතින් පළවන්නේ එම කථාන්තරයයි.

## රැකියා විරහිතයන්ගේ අන්තිමයා

රැකියාවක් කිරීමේ අයිතිය සහ වටිනා ජීවිතයක් ගත කිරීම සඳහා අවශ්‍ය තත්වයන් නිර්මාණය කිරීමට ළදරු සෝවියට් රජයට පහසු වූයේ නැත. සෝවියට් රජයට සාර් රුසියාවේ උරුම වූයේ, පළමු ලෝක යුද්ධයෙන් හා සිවිල් යුද්ධයෙන් විනාශ වූ රටක් සහ හීතලෙන්, සාගින්නෙන්, විරැකියාවෙන්, අත්හැර දමනු ලැබූ කර්මාන්තශාලාවලින් පිරුණු රටකි.

එය දුෂ්කර කාලයක් විය. 1920 වසරේදී සාගින්නෙන් මිදීම සඳහා මිලියන ගණනක් ගොවීහු රැකියාවක් බලාපොරොත්තුවෙන් නගරවලට පලා ආහ. විරැකියාව වඩ වඩාත් උග්‍ර කර තිබුණේ තාක්ෂණයේ පසුගාමීත්වය විසින් සහ ප්‍රතිවිප්ලවවාදීන් දියත් කළ සිවිල් යුද්ධයෙන් ආර්ථිකය පීලි පන්නා තිබීමෙනි. 1923දී 641,000ක් විරැකියාවෙන් පෙලුණි. 1926 වසර වෙද්දී මිලියනයකට වැඩි පිරිසක් රැකියා විරහිතයෝ වූහ.

ඒ කෙසේ වෙතත් සෝවියට් රජය විරැකියාව මුලිනුපුටා දැමීම සඳහා එහි බල සීමාව තුළ කළ හැකි හැම දෙයක්ම කළේය.

සෝවියට් රජයේ මුල් කාලයේදීම එනම්, 1918 ලෙනින් ශ්‍රම හුවමාරු කාර්යාංශය පිළිබඳ නීතියක් පැනවීය. මෙම නීතියට අනුව ශ්‍රම හුවමාරු කාර්යාංශයේ වගකීම වන්නේ, රැකියා විරහිතයන්ට නොමිලේ රැකියාවක් සපයා දීම සහ විරැකියා සහන ලබාදීමය. 1921 දී සෝවියට් රජය වැඩකරන ජනතාවට රැකියා අහිමිවීමකදී හෝ ආබාධිත තත්වයට පත්වීමේදී භාවිත කළ හැකි සමාජ රක්ෂණයක් හඳුන්වා දෙනු ලැබීය. 1925දී විරැකියා සහනය මසකට රූබල් 8-10ත් අතර විය. ඒ සමයේදී කාර්මික කම්කරුවෙකුගේ සාමාන්‍ය මාසික වැටුප රූබල් 24ක් පමණ විය. රැකියා නැත්තවුන් සියලු බදුවලින් නිදහස් කෙරුණු අතර, නිවාස කුලී සහ සමාජමය සේවා සඳහා ගෙවිය යුතු මුදලද අඩු විය.

> 1930 මාර්තු 13 වැනිදා මොස්කව්හි ශ්‍රම හුවමාරු කාර්යාංශය අන්තිම රැකියා විරහිතයාට ස්ථිර රැකියාවක් ලබාදුන් අතර, කාර්යාංශය වසා දමන ලදී. පුරාවෘත්තයක් බවට පත් සෝවියට් දේශයේ අවසන් රැකියා විරහිතයා මිහායිල් ෂුකනෝව්ය.

1930 මාර්තු 13 වැනිදා මොස්කව්හි ශ්‍රම හුවමාරු කාර්යාංශය අන්තිම රැකියා විරහිතයාට ස්ථිර රැකියාවක් ලබාදුන් අතර, කාර්යාංශය වසා දමන ලදී. පුරාවෘත්තයක් බවට පත් සෝවියට් දේශයේ අවසන් රැකියා විරහිතයා මිහායිල් ෂුකනෝව්ය.

මිහයිල් ෂුකනෝව් මොස්කව්හි රක්මැනෝව්ස්කි වීදියේ පිහිටා තිබූ ශ්‍රම හුවමාරු කාර්යාංශයේ රැකියා විරහිතයෙකු ලෙස ලියාපදිංචි වූයේ, ඊට අවුරුදු 08කට පෙරදීය. ඉතා කෙටි කාල අන්තරයන් ප්‍රමාණයක් හැරුණු විට ඔහුද අනෙක් රැකියා විරහිතයන් මෙන් රැකියාවක් බලාපොරොත්තුවෙන් රැකියා පෝලිමේ සිටියේය.

"මට ලාබාල වියේදීම රැකියාවකට යාමට සිදුවුවා. මට වයස අවුරුදු 12දී මගේ පියා මිය ගියා. මගේ මවට දරුවන් තුන්දෙනෙකු රැකබලා ගැනීම ලෙහෙසි වූයේ නැහැ. මා අවුරුදු 02ක් බොයිලේරු කාමරයක වැඩකළා. ඉන් පසු මා ලෝහ කාර්මිකයෙකු බවට පත්වීමේ අදහස ඇතිව පයිප්ප වැඩ ආධුනිකයෙකු ලෙස පුහුණුව ලැබුවා. ඒ කාලයේදී අවශ්‍ය තරම් ඉන්ධන හෝ අමුද්‍රව්‍ය තිබුණේ නැහැ. මා තීරණය කළා, ශ්‍රම හුවමාරු කාර්යාංශයට යාමට. ඒ අතර සමහර වෙලාවට මම පොඩි පොඩි වැඩ කළා. අවුරුද්දකට පසුව මාව ලොන්ඩ්‍රියක් සාදන ස්ථානයක් වෙත යොමු කළා. නමුත් එතන වැඩ කිරීමට පුළුවන් වූයේ මාසයක් හෝ දෙකක් පමණයි. මා නැවත ශ්‍රම හුවමාරු කාර්යාංශයට ගියා."

"නමුත් කෙතරම් දුෂ්කර කාල වකවානුවක් වුවත් අපට දැනුණේ සහ අප විශ්වාස කළේ, එය තාවකාලික බවයි."

"තත්ත්වය එන්න එන්නම පහසු වුණා. දුෂ්කරතා අඩුවුණා. කර්මාන්තය සජීවීව පැවතුණා. එකක් පසුපස එකක් කර්මාන්ත ශාලා ක්‍රියාත්මක වන්නට පටන් ගත්තා. වැඩි වැඩියෙන් කම්කරුවන් අවශ්‍ය වුණා. පළමුව මගේ බිරිඳ දුෂ්යාට ස්ථිර රැකියාවක් ලැබුණා. 1930 මාර්තු මට මොස්කව් ශ්‍රම හුවමාරු කාර්යාංශය වසා දමන්නා බවට පත්වීමට වාසනාව ලැබුණා."

"මම අවුරුදු 30කට වැඩි කාලයක් රතු කුරියර් හම් කර්මාන්ත ශාලාවේ වැඩ කළා. එක් කාලයක් පමණක් එනම්, 1941 වසරේදී මම ස්වේච්ඡාවෙන් පෙරමුණට ගියා. මම ස්ටාලින්ග්‍රාඩ්වල සටනේදී බරපතළ ලෙස තුවාල ලැබුවා. මගේ බිරිඳ යෙවුදොකියා ෆෙඩොරොවුනා සහ මම දැන් විශ්‍රාමිකයි. මගේ දරුවන් තුන්දෙනාම දැන් ස්වාධීනව ජීවත්වෙනවා. ඔවුන් සියලු දෙනාම රැකියා කරනවා. ඔවුන් විරැකියාව ගැනත් ශ්‍රම හුවමාරු කාර්යාංශය ගැනත් දැනගත්තේ මා කියූ දේවලින් සහ පොත් පත්වලින්." මිහායිල් ෂුකනෝව් පැවසීය. (1985)

ඉන්පසු සෝවියට් දේශය ප්‍රමුඛ සමාජවාදී කඳවුර බිඳ වැටෙන තුරුම සෝවියට් සංගමය තුළ රැකියා විරහිතයන් සිටියේ නැත.

# එක්සත් ජනපදය:
# දඩබ්බර ට්‍රම්ප් වැඩ අරඹයි




එක්සත් ජනපදයේ නව ජනාධිපති ඩොනල් ට්‍රම්ප් දිවුරුම් දී පෙබරවාරි 20 වන දිනට මාසයක කාලයක් සම්පූර්ණ විය. මේ කාලය තුළදී ඔහු කළ ප්‍රකාශයන් හා ඔහු ගත් ක්‍රියාමාර්ග යළිත් වරක් ජාත්‍යන්තර දේශපාලනය තුළ දැවැන්ත ආන්දෝලනයක් ඇති කරන ලද්දේය.

ඔහුගේ ආරම්භක දේශනයද මින් පෙර එක්සත් ජනපද ජනාධිපතිවරුන්ගේ මෙන් එක්සත් ජනපදයේ සුවිශේෂීභාවය ඉස්මතු කළ දීර්ඝ දේශනයක් නොවීය. ඔහු රටේ අභ්‍යන්තර නගරවල ඇති දුගීභාවය පිළිබඳ කම්පා වූ අතර කර්මාන්ත ශාලා රට පුරා සොහොන් කොත් මෙන් විසිරී ඇතැයිද අධ්‍යාපන ක්‍රමය අසාර්ථක වී ඇතැයිද යටිතල පහසුකම් නඩත්තු නොකිරීමෙන් විනාශ වී ඇතැයිද ජාතියේ සැඟවුණු විභවයන්, අපරාධ, විෂ මත්ද්‍රව්‍ය හා මැර කණ්ඩායම් විසින් සොරකම් කර ඇතැයිද පැවසීය. තමන් 'ඇමෙරිකානු සංහාරය' නවත්වන ලදැයි ඔහු කීවේය.

ඇතැමෙකුට ඔහුගේ දේශනය එක්සත් ජනපද විරෝධී එකක් සේ පෙනුණද දුගීභාවයෙන්, විෂ මත්ද්‍රව්‍යවලින්, අපරාධවලින් පීඩනයට පත් මිලියන ගණනක් එක්සත් ජනපද වැසියන්ට නම් එය නව ජීවය සැපයූ යථාර්ථවාදී ප්‍රකාශයක් වූයේ යැයි කියැවේ.

ඔහු එහිදී, එක් එක් රටෙහි වුවමනාවන් ප්‍රමුඛව තබා ගැනීමේ පදනම මත එක්සත් ජනපදය සෑම රටක් සමගම මිත්‍රත්වය ගොඩනගා ගැනීමට සූදානම් බව පැවසීය. එමගින් ඔහු විදේශීය රටවලට අඟවන ලද්දේ, එක්සත් ජනපදය තවදුරටත් යුදමය ගැටුම්වලට මැදිහත් නොවන්නේය යන්න විය හැකිය. (එසේ කළ හැකිද යන්න වෙනම කරුණකි.)

ජනාධිපති ධුරයේ පළමු සතියේදීම ඔහු මෙක්සිකෝ දේශසීමාවේ තාප්පය ඉදිකිරීමට අදාළ විධායක නීතියට අත්සන් තැබීය. එහිදී ඔහු ප්‍රකාශ කළේ, තාප්පය සඳහා යන වියදම් මෙක්සිකෝව විසින් ගෙවිය යුතු බවයි. ඊට විරෝධය පළ කරමින් මෙක්සිකෝවේ ජනාධිපතිවරයා ජනාධිපති ට්‍රම්ප් මුණ ගැසීමට සැලසුම් කර තිබූ අවස්ථාවද අවලංගු කළේය.

දෙවන සතිය මුලදී ඔහු මුස්ලිම්වරුන් බහුතරයක් වෙසෙන රටවල් හතකින් එක්සත් ජනපදයට සංක්‍රමණිකයන් ලෙස පැමිණීම තාවකාලිකව තහනම් කරමින් විධානයක් පැනවීය. කෙසේ වුවද එක්සත් ජනපදය තුළින්ම එයට දැවැන්ත විරෝධයක් එල්ල විය.

දෙවන සතිය අවසානයේදී ඔහු ඉරානයට අවවාද කළේය. ට්‍රම්ගේ තෙවන සතිය ආරම්භ වූයේ පසුබෑමකිනි. මුස්ලිම් සංග්‍රමණිකයන් වෙත ඔහු පැනවූ විධානය තාවකාලිකව අත්හිටුවමින් අධිකරණ නියෝගයක් නිකුත් විය. ට්‍රම්ප් ඊට ප්‍රතිචාර දැක්වූයේ එක්සත් ජනපදය තුළ කිසියම් සිදුවීමක් සිදුවුවහොත් (ත්‍රස්ත ප්‍රහාරයක්) ඊට මෙම නඩු තීන්දුව දුන් විනිශ්චයකාරවරයා වගකිව යුතු යැයි පවසමිනි. පසුව තුන්දෙනෙකුගෙන් යුත් ජූරි සභාවකින් මෙම තීන්දුව තවදුරටත් තහවුරු කරනු ලැබීය.

ජනාධිපති ධුරයේ හතරවන සතියේදී ට්‍රම්ප්ට තවත් පරාජයකට මුහුණ දීමට සිදුවිය. එනම් ඔහු විසින් පත් කළ ජාතික ආරක්ෂක උපදේශකයා වූ මයිකල් ෆ්ලින්ට ඉල්ලා අස්වීමට සිදුවීමයි. ඔහුට ඉදිරිපත් වූ චෝදනාව වූයේ රුසියාව සමග රහසිගත ගනු දෙනු පවත්වා ගෙන යාමය.

ට්‍රම්ප් ඔහුගේ පළමු මාධ්‍ය සාකච්ඡාවේදීම, යළිත් වරක් මාධ්‍ය සමග ගැටුම් ඇතිකර ගත්තේය. එහිදී ඔහු තමන්ට සලකන ආකාරය ගැන මාධ්‍යයට බැණ වැදුණේය.

මේ වන විට නව ජනාධිපතිවරයා කටයුතු කරමින් සිටින්නේ මෙතෙක් එක්සත් ජනපද ජනාධිපතිවරුන් කටයුතු කළ ආකාරයටම නොවන බව පෙනෙන්නට තිබේ. එක්සත් ජනපදය තුළ මතුවී ඇති ආර්ථික හා දේශපාලන අර්බුදයේ ගැඹුර විසින් මේ තත්වය උද්ගත කර ඇති බවට සැකයක් නැත.

කෙසේ වෙතත්, එක්සත් ජනපදයේ අධිරාජ්‍යවාදී වුවමනාවන්ට හානිවන පරිද්දෙන් දැනුවත්ව හෝ නොදැනුවත්ව නව ජනාධිපතිවරයා කටයුතු කරන්නේ නම්, එය කෙතරම් දුරකට එක්සත් ජනපදයේ ස්ථාපිත ක්‍රමය විසින් කොතෙක් කලක් ඉවසාවිදැයි පැවසිය නොහැකිය.

## පිලිපීනය:
## සාම කතා බිඳවැටෙන ලකුණු



පිලිපීනයේ නව ජනාධිපති රොඩ්‍රිගෝ ඩුටර්ට් පසුගිය පෙබරවාරි 09වැනිදා පිලිපීනයේ නව ජනතා හමුදාවට එරෙහිව හමුදා ක්‍රියාමාර්ග යළි අරඹන ලෙසට දැනුම් දුන්නේය. මතු වූ නව තත්වයන් සමඟ පිලිපීන රජය හා නව ජනතා හමුදාව අතර ඇරඹි සාම සාකච්ඡා බිඳ වැටීමේ අවදානමක් ඇති වී තිබේ.

නව ජනතා හමුදාව පිලිපීන කොමියුනිස්ට් පක්ෂයේ සන්නද්ධ අංශය ලෙස ක්‍රියාත්මක වේ. 1969 වසරේ සිට සන්නද්ධ ක්‍රියාමාර්ගවල නිරත වී සිටින එය දැනට පිලිපීනයේ ඇතැම් ප්‍රදේශවල සිය බලය තහවුරු කරගෙන සිටී.

නව ජනාධිපතිවරයා තේරී පත්වීමෙන් පසු පිලිපීන රජය සහ නව ජනතා හමුදාව අතර සාම සාකච්ඡා ආරම්භ වූයේ, පසුගිය අගෝස්තුවේ ඔස්ලෝ නුවරදීය. එතැන් සිට සාකච්ඡා වට 05ක් පමණ පැවැත්වුණි. තෙවැනි සාකච්ඡා වටය පැවැත්වූයේ, ඉතාලියේ රෝම නගරයේදීය. එහිදී පෙබරවාරි 22 දින නෙදර්ලන්තයේදී නැවත මුණ ගැසීමට ඔවුන් කතිකා කරගත් අතර, හතරවන වටය අප්‍රේල් 02 නෝර්වේහිදී පැවැත්වීමට නියමිතව ඇත.

නව ජනතා හමුදාව පාර්ශ්වයෙන් සාම සාකච්ඡා සඳහා මැදිහත් වන්නේ, පිලිපීන කොමියුනිස්ට් පක්ෂයේ දේශපාලන අංශය වන පිලිපීනයේ ජාතික ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණයි.

## ඉක්වදෝරය:
## ජනාධිපතිවරණ සටන තවත් වටයකට



ඉක්වදෝරයේ මීළඟ ජනාධිපතිවරයා, උප ජනාධිපතිවරයා සහ එරට පාර්ලිමේන්තුව තෝරා පත්කර ගැනීම සඳහා වන මැතිවරණය පසුගිය දා පැවැත්වුණි. මෙහිදී ඡන්දදායකයන් මිලියන 14 දහසකට වඩා වැඩි ප්‍රමාණයක් ඡන්දය ප්‍රකාශ කිරීමට නියමිතව තිබුණි.

ජනාධිපතිවරයා සහ උප ජනාධිපතිවරයා තේරීමේදී ජය ගැනීමට නම් අඩු වශයෙන් වලංගු ඡන්ද ප්‍රමාණයෙන් 40%ක් සහ දෙවැන්නාට වඩා 10%ක වැඩි ඡන්ද ප්‍රතිශතයක් ලබාගත යුතුය. එසේ නොවුණහොත් මැතිවරණයේ දෙවන වටය පැවැත්වෙන අතර, එය අප්‍රේල් 02 දිනට යොදා තිබේ.

මෙම ලිපිය ලියන මොහොත වන විට ඡන්දවලින් 99.5%ක් ගැන අවසන් කර ඇත. ඉන් 39.3%ක් ජනාධිපති රෆායෙල් කොරයාගේ පක්ෂය වන Alianza Pais පක්ෂයේ අපේක්ෂකයා වූ ලෙනින් මොරියෝ ලබාගෙන ඇත. දෙවන ස්ථානයට පත්ව ඇත්තේ CREO - SUMA පක්ෂයේ අපේක්ෂකයා වු ගුයිලිමෝ ලැසෝය. ඔහු 28.1%ක ඡන්ද ප්‍රතිශතයක් ලබාගෙන තිබේ. පළමු අපේක්ෂකයා 40%ක ඡන්ද ලබාගැනීමට අසමත් වී ඇති බැවින් දෙවන වටයකට යෑමට සිදුවනු ඇත.

පාර්ලිමේන්තු ඡන්ද ප්‍රතිඵලයෙන් 135ක් වූ මුළු ආසන ගණනින් ආසන 75ක් දිනා ගැනීමට රෆායෙල් කොරයාගේ පක්ෂය සමත්වී ඇත.

කෙසේ වෙතත් අවසන් ප්‍රතිඵලය තව දින 2-3ක් ඇතුළත නිකුත් කිරීමට හැකිවෙනු ඇතැයි ඉක්වදෝරයේ ජාතික මැතිවරණ කොමිසම ප්‍රකාශ කර තිබේ.

## මැදපෙරදිග:
## ISIS අවසානයේ ආරම්භයක



ISIS ත්‍රස්තවාදීන්ගේ 'ව්‍යාපාරික මොඩලය' බිඳ වැටෙමින් පවතින බැවින් ඔවුන් බරපතළ මූල්‍ය අර්බුදයකට මුහුණ දී සිටින බව වාර්තා වේ. ISIS ත්‍රස්තවාදීන් ලෝකයේ ධනවත්ම ත්‍රස්තවාදී කණ්ඩායම ලෙස සැලකේ. ඔවුන් තෙල් සම්පත කොල්ලකන අතර තමන් පාලනය කරන ප්‍රදේශවල හිරවූ සාමාන්‍ය වැසියන්ගෙන් බදු අයකර ගනී. පෞරාණික භාණ්ඩ අලෙවියෙන් ආදායම් ලබයි. ඔවුන් ප්‍රදේශ යටත් කරගත් මොහොතේ විශාල වශයෙන් බැංකු, තෙල් ළිං සහ ආයුධ ගබඩා තමන් භාරයට ගෙන තිබුණි.

එහෙත් මේ වන විට ඔවුන් යටත් කරගෙන තිබූ භූමි ප්‍රමාණයෙන් විශාල කොටසක් ඔවුනට අහිමි වී ඇත.

ISIS ත්‍රස්තවාදීන් කණ්ඩායමක් පමණක්ම නොවේ. ඔවුන් ප්‍රදේශද පාලනය කරයි. එවිට ඔවුන්ට එකී ප්‍රදේශවල යටිතල පහසුකම්ද නඩත්තු කිරීමට සිදුවේ. මේ නිසා ඔවුන්ට අනෙක් ත්‍රස්තවාදී කණ්ඩායම් මෙන් නොව විශාල වියදම් පාර්ශ්වයක්ද පවතී.

කෙසේ වෙතත් මේ වන විට ISIS ත්‍රස්තවාදීන් තවදුරටත් ශක්තිමත් හෝ ආකර්ෂණීය ත්‍රස්තවාදී කණ්ඩායමක් නොවේ.

# කෝප් හෙළිදරව්ව

## එදා හොරු සහ අද හොරු

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (කෝප් කමිටුව), තම තුන්වන වාර්තාවද පාර්ලිමේන්තුවට පසුගියදා ඉදිරිපත් කරන ලදී. එම වාර්තාව මගින් 2016.05.01 සිට 2016.08.31 දක්වා කාලය සඳහා එම කාරක සභාවට කැඳවන ලද රාජ්‍ය ව්‍යාපාර ආයතන 15ක පසුගිය අවුරුදු 4ක පමණ කාලයක් තුළ (රාජපක්ෂ පාලනයේ අවසාන වසරවල) සිදුවී ඇති මූල්‍ය අක්‍රමිකතාවයන් නාස්තිකාර වියදම්, දූෂණ හෙළිදරව් කරනු ලැබ ඇත.

මීට කලින්ද මෙවැනිම වාර්තාවක් (රාජ්‍ය ව්‍යාපාර ආයතන 19කට) අදාළව පසුගිය වසරේ අගෝස්තු මාසයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර ආසන්න වශයෙන් එම ආයතනවල සිදුවූ අක්‍රමිකතා රු. කෝටි 33,000ක් පමණ වේ යැයි විගණකාධිපතිවරයාගේ ගණනය කිරීම විය. මෙම නව වාර්තාව මගින්ද හෙළිදරව් කර ඇති, රජයට සිදුකර ඇති පාඩුව ආසන්න වශයෙන් රු. කෝටි 11,000ක් පමණ වේ යැයි ගණනය කර ඇත.

මීට කලින් වසරකට එක වාර්තාවක් පමණක් වත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොවී පැවති සම්ප්‍රදායික ක්‍රමවේදයන් බිඳ දමා කෝප් කාරක සභාව සක්‍රීය දූෂණ වංචා හෙළිදරව් කිරීමට හැකි යාන්ත්‍රණයක් බවට පත් කර ඇත්තේ, එම කාරක සභාව තුළ ජ.වි.පෙ. විසින් සභාපතිත්වය දරමින් ඉටුකරන සුවිශේෂ කාර්යය නිසා වුවත්, එම හෙළිදරව් කිරීම හොරාගෙම මැණියන්ගෙන් පේන අහන මට්ටමට පත්ව තිබේදැයි සිතන මට්ටමට පත්ව ඇත්තේ එම හෙළිදරව් කිරීමෙන් පසු ඉන් ඉදිරියට පියවර ගැනීමක් නොමැති නිසාය.

ණය ගෙවීමට මුදල් නැතැයි කියමින් රටේ ජාතික සම්පත් විකිණීමට පමණක් බලා සිටින රනිල්-මෛත්‍රී හවුල මෙම රටට කෝටි ගණනින් වංචා සිදුකළ දූෂිතයන්ට දඬුවම් දීමට හෝ එම අලාභයන් සිදුකළ අයගෙන් අයකර ගැනීමට කිසිදු උනන්දුවක් නොදක්වයි. ආණ්ඩුව රටේ සම්පත් විකිණීමට දරන මහන්සිය, හොරුන්ට දඬුවම් දීමට නොගන්නා බව ඉතා පැහැදිලිය. නමුත්, තවමත් ජනතාව විසින් පරාජය කළ රාජපක්ෂ රෙජීමයේ කළු දශකයට සුදු හුණු ගාන්නට ඇතැම් බලවේග කුමන්ත්‍රණ කරන බවද පැහැදිලි නිසා, එම කෝප් වාර්තාවේ හෙළිදරව් කිරීම යම් පමණකට හෝ පුළුල්ව පැහැදිලි කර ගැනීම ජනතාව දැනුවත් කිරීමට දායක වන බලවේගයන්ට වැදගත්ය.

### මඟනැගුම සහ හොරු හැදුම

රාජපක්ෂ පාලනය ජනතාව රවටන ලද එක් දැවැන්ත ව්‍යාපෘතියක් වූයේ අතුරු පාරවල්වල සිට ප්‍රධාන මාර්ග දක්වා කාපට් කිරීමය. ඒ මගින් ගමට පාරක් ලැබීමේ ප්‍රීතිය ජනතාව භුක්ති වින්ද අතරේ ගමේ ප්‍රාදේශීය සභා



මන්ත්‍රීවරයාගේ සිට ඉහළම මාර්ග ඉදිකිරීම් සමාගම දක්වා කොන්ත්‍රාත් ලබාගත් රාජපක්ෂ ගජමිතුරෝද ප්‍රීතිප්‍රමෝදයට පත්වූහ. ගමේ ජනතාවට වඩා සැබෑ ලෙසටම මඟ නැගුමෙන් තෘප්තියට පත්වූයේ එම හොරු රැළ බව කෝප් වාර්තාවේ විමර්ශනවලින් හෙළිදරව් වී තිබේ.

මාර්ග සංවර්ධන අධිකාරිය තෝරාගත් මාර්ග 64ක් (දිග කිඃ මීඃ 1434ක්) දේශීය වාණිජ බැංකු 07කින් ලබාගත් රුපියල් බිලියන 151.77 (කෝටි 1517ක්) ණය මුදලක් යොදවා දේශීය කොන්ත්‍රාත්කරුවන් මගින් ප්‍රතිසංස්කරණය කිරීමක් සිදුකර ඇත.

මෙම ගනුදෙනුවේ විමර්ශනයේ අපූරු හෙළිදරව්ව වන්නේ, එක් මාර්ගයක ඉදිකිරීම් වෙනුවෙන් මිල ගණන් ඉදිරිපත් කර ඇත්තේ එක් කොන්ත්‍රාත්කරුවෙකු බැගින් පමණක් වීමයි; ඊට අමතරව පාරවල් පිළිබඳව මිල ඇගයීමේ තාක්ෂණික ඇගයීම් කමිටුව පාරවල් 54කට ඔවුන්ගේ නිර්දේශය රුපියල් බිලියන 146.553ක් ලෙස (රුපියල් කෝටි 14655) නිර්දේශ කළ ද, අමාත්‍ය මණ්ඩලයේ පත් කළ ප්‍රසම්පාදන කමිටුව එය රුපියල් බිලියන 155.79ක් ලෙස තාක්ෂණික ඇගයීමට වඩා රුපියල් බිලියන 9.242ක් වැඩි අගයකට අනුමත කිරීමය. ඒ අනුව සිදුවී ඇති පසුව පමණක් රුපියල් බිලියන 9.242ක් (රුපියල් කෝටි 924ක් වේ. මීට අමතරව තවත් රුපියල් මිලියන 28,000ක් (කෝටි 2800ක්) මඟනැගුම මඟින් වියදම් කළ ආකාරයවත් සොයා ගැනීමට හැකියාවක් නැත. එම වියදම අතරේ ඇඹිලිපිටියේ ජනාධිපති නිල නිවසක් ඉදිකිරීමටත් රුපියල් ලක්ෂ 184.5ක් වියදම් කර ඇත. 2015.12.31 වන විට භෞතිකව 50%ක් වත් සාර්ථක නොකළ රුපියල් මිලියන 25,103ක් වියදම් ඇස්තමේන්තු කළ ව්‍යාපෘති 259ක් මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මකව පැවැති අතර, එයින් 206ක්ම මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ග සඳහා මුදල් යොදවන ලද "දේශපාලන පාරවල්" බව කෝප් වාර්තාවෙන් හෙළිවේ. ඒ රාජපක්ෂ යුගයේ එදා හොරකම්ය. එම හොරකම් නතර කරන බවට ජනතාව රවටමින් බලයට පත් වර්තමාන එ.ජා.ප.ය තම පාලනය ආරම්භ කළේම, මාර්ග සංවර්ධන අධිකාරියේ නිසි අනුමැතියකින් තොරව, මාසිකව ලක්ෂ 58ක් වියදම් කරමින් උපදේශකවරුන් 54ක් සහ මහජන සම්බන්ධතා නිලධාරීන් 94 දෙනෙකුත් ඇමතිවරයා වෙනුවෙන් පත්කර ගනිමිනි.

> "තවත් රුපියල් මිලියන 28,000ක් (කෝටි 2800ක්) මඟනැගුම මඟින් වියදම් කළ ආකාරයවත් සොයා ගැනීමට හැකියාවක් නැත. එම වියදම අතරේ ඇඹිලිපිටියේ ජනාධිපති නිල නිවසක් ඉදිකිරීමටත් රුපියල් ලක්ෂ 184.5ක් වියදම් කර ඇත. 2015.12.31 වන විට භෞතිකව 50%ක් වත් සාර්ථක නොකළ රුපියල් මිලියන 25,103ක් වියදම් ඇස්තමේන්තු කළ ව්‍යාපෘති 259ක් මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මකව පැවැති අතර, එයින් 206ක්ම මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ග සඳහා මුදල් යොදවන ලද "දේශපාලන පාරවල්" බව කෝප් වාර්තාවෙන් හෙළිවේ."

### සූරියවැව ක්‍රීඩාංගණය

රාජපක්ෂ පාලන සමයේ හම්බන්තොට සූරියවැව ක්‍රීඩාපිටියක් ඉදිකර ඇත්තේ, අවශ්‍යතාව පිළිබඳව කිසිදු ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකරමිනි. එය හුදෙක් හම්බන්තොට වරාය ඉදිකිරීම භාරගත් චයිනා හාබර් සමාගම මගින් එවකට පැවැති රාජපක්ෂ බලය යොදා ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් හම්බන්තොට වරායේම කොටසක් ලෙස කරනු ලැබූ ඉදිකිරීමකි.

ඉදිකරන විට එම ක්‍රීඩාංගණයේ වියදම රුපියල් මිලියන 1207කි. එය පවරන විට බිල්පත් ඉදිරිපත් කර ඇති ප්‍රමාණය රුපියල් මිලියන 2800කි. වර්තමානය වන විට පොලී, ප්‍රමාද ගාස්තු සමඟ ඉදිකළ චයිනා හාබර් සමාගමට එක්කෝ වරාය අධිකාරිය නැතිනම් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ගෙවිය යුතු මුදල (2016 අවසානයට) රුපියල් මිලියන 5400කි. නමුත් රජයේ ඇස්තමේන්තුව රුපියල් මිලියන 915ක් පමණකි. රාජපක්ෂවරුන්ගේ දේශපාලන ප්‍රතිරූපය පිම්බීමට නාස්තිකාරව ඉදිකළ සූරියවැව ක්‍රීඩාපිටිය අද රටට ජනතාවට තවත් ණය බරකි. නමුත්, ඉදිකිරීමට තීරණය ගත් හොරුන් අදත් නිදැල්ලේය.

### විදුලි සංදේශන නියාමන කොමිසම

පසුගිය රාජපක්ෂ පාලන සමයේ විදුලි සංදේශ නියාමන කොමිසම සම්පූර්ණයෙන්ම රාජපක්ෂකරණය වූ ආයතනයක් බව කෝප් වාර්තාවෙන් කරුණු සහිතව හෙළිවී තිබේ. රාජපක්ෂ ප්‍රතිරූපය ගොඩනැගීමට ඉදිකළ නෙළුම් පොකුණ ව්‍යාපෘතිය එවැන්නකි. මුළු කොන්ත්‍රාත් වටිනාකම ඩොලර් මිලියන 164.3න් ඩොලර් මිලියන 88.65ක් රක්ෂණය කිරීම සඳහා රක්ෂණ ගිවිසුමකින් තොරව රුපියල් මිලියන 1185ක් රක්ෂණ සමාගමකට ගෙවා ඇත.

එසේම, හම්බන්තොට ඉදිකළ අත්හැර දැමූ තොරතුරු තාක්ෂණ උද්‍යානයද මෙවැනිම නාස්තිකාර වියදමකි. එහි මුළු ඇස්තමේන්තු වටිනාකම රුපියල් මිලියන 2663ක් වන අතර එයින් 19%ක් එනම් මිලියන 508ක් වියදම් කර එම ව්‍යාපෘතිය අත්හැර දමා ඇත. 2015 ජනාධිපතිවරණය ඉලක්ක කර 2014.12.15 දින වැඩිහිටියන්ට සිල් රෙදි බෙදීමට වියදම් කළ මුදල රුපියල් මිලියන 600කි. ගෝඨාභය රාජපක්ෂ නියමයට අනුව, ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය වෙනුවෙන් ඉදිකළ දක්ෂිණ විශ්වවිද්‍යාලයට රුපියල් මිලියන 250ක් ලබාදීම, එවැනි තමන්ගේ විෂයට අයිති නැති වියදම් දැරීමකි. රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ (ගෝඨාභය ලේකම්වරයාගේ) අවශ්‍යතාවයකට දහම් පාසල් පොත් ලක්ෂ 5ක් මුද්‍රණය කිරීමට රුපියල් ලක්ෂ 25ක් වියදම කළ බව ප්‍රකාශ කළද ඊට අදාළ ලිපිලේඛන ඉදිරිපත් කිරීමට පවා නොහැකි වී තිබේ.

### ඉංජිනේරු සංස්ථාව - වීරවංශකරණය

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ විෂය පථය අනුව කාර්ය භාරය රජයේ ඉංජිනේරුමය කටයුතු වුවත් පසුගිය කාලවකවානුවේ සිදුකර ඇත්තේ රාජපක්ෂ පාලනයේ මැතිවරණ ප්‍රචාරක කටයුතුය. වීරවංශ පවුල්කරණයට ලක් වූ ආයතනයක් බවට ඉංජිනේරු සංස්ථාව පත්ව තිබීමද විශේෂත්වයකි. 2015 දෙසැම්බර් 31 වන විට සේවකයන් 99 දෙනෙකු සංස්ථාව තුළ අතිරික්තව සිටියදී තවත් සේවකයන් 179 දෙනෙකු අනියම් පුහුණු ලෙස භාණ්ඩාගාර අනුමැතියකින් තොරව බඳවාගනු ලැබ ඇත. 2016 මාර්තු 31 දිනට ඉංජිනේරු සංස්ථාවේ සිටිය යුතු කාර්ය මණ්ඩලය 344ක් වුවත් එදිනට සිටි ප්‍රමාණය 602ක් විය. එසේම සංස්ථාවේ නමට තනතුරු සකස් කර පිටස්තර ස්ථානවල සේවය කරන පුද්ගලයන් 40ක් සහ විවිධ තනතුරු 41ක් සඳහා බඳවා ගත් පුද්ගලයන් 273 දෙනෙකුගේ නාම ලේඛනයක් කෝප් කමිටු වාර්තාවේ අඩංගුය.

එසේම, 2015 මැතිවරණ සමයේදී වැඩබිම් 84ක සේවකයන් 98 දෙනෙකු වැටුප් හා අතිකාල ගෙවමින් මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා යොදවා ඇති බවද අනාවරණය වී ඇත. මැතිවරණ ප්‍රචාරන කටයුතුවලට සංස්ථාවෙන් දරා ඇති ප්‍රචාරන වියදම

15 වැනි පිටුවට



"ඔවුහු අල්ලසෙන් හා දූෂණයෙන් ආණ්ඩුවේ බලය අල්ලා ගත්හ. ඔවුහු සමපේක්ෂණයන් සහ මහජන සොරාකෑම් විද්‍යාවක් බවට පත් කළහ. ඔවුහු ජාතියත් රාජ්‍යයත් රටත් නගරයත් ණයබරිත කළහ."

**ඩෙනිස් කර්නි**
**(1847-1907)**

# ජාත්‍යන්තර කාන්තා දිනය

# නොකෙලෙසා සැමරීමට නම්...

සමාජය තුළ අප ජීවත්වන්නේ පොදු සාමූහික පැවැත්ම උදෙසා අප විසින්ම තනාගත් ආචාර ධර්ම පද්ධතියකට අනුවය. නැතහොත් යම්කිසි සදාචාරයකට යටත්වය. යමෙකුට හොඳ, නරක, යුක්තිය. අයුක්තිය, ගරුත්වය, අගෞරවය ආදී දේවල් තෝරා බේරාගෙන ජීවත්වන ආකාරය ලාබාල වියේ සිටම වැඩිහිටියන්, ගුරුවරුන් විසින් කියා දෙමින් පුරුදු පුහුණු කරයි. එහෙත් වත්මන් සමාජය තුළ විවිධ මාධ්‍ය මගින් වාර්තාවන සිදුවීම්වලින් බොහෝ ප්‍රමාණයක් සදාචාර විරෝධී ක්‍රියාවන්ගෙන් යුත් සිදුවීම්ය.

107 වන ජාත්‍යන්තර කාන්තා දිනයට දින කිහිපයක් තිබියදී ගැබිණි මාතාවකට අත්විඳින්නට වූ සිදුවීමක් මාධ්‍යවල පළවිණි. අදාළ ගැබිණි මව බසයකින් ගමන් කරමින් සිටියදී බසය තුළ වමනය යාම හේතුවෙන් ගමනාන්තය දක්වා ඇය රැගෙන ගොස් බසය පිරිසිදු කරවාගෙන තිබුණි. මෙවැනි සිදුවීම්වල සිට අතිශය කුරිරු සිදුවීම් දක්වා සිදුවීම් දාමයක් ලෙස කාන්තාවන්ට එරෙහිව සිදුවන මානසික හා ශාරීරික හිංසනයන් වර්ධනය වෙමින් තිබීම ශෝචනීය තත්වයකි.

අද දවසේ අප මුහුණ දී ඇත්තේ කෙබඳු තත්වයකටද? සෑම විනාඩි 90කට වරක් කාන්තාවක් ලිංගික අතවරයකට ලක්වන, පොදු ප්‍රවාහන සේවයේ ගමන් කරන වයස අවුරුදු 15ත් 45ත් අතර ගැහැණු ළමුන් හා කාන්තාවන්ගෙන් 70% කට ලිංගික අඩන්තේට්ටම්වලට ලක්වීමට සිදුවන, පවුල තුළදී 24%ක් ස්වාමි පුරුෂයන් අතින් අඩන්තේට්ටම්වලට ලක්වී රෝහල්ගත වීමට සිදුවන කාන්තා අයිතිවාසිකම් අහිමිවෙමින් යන හිංසනයෙන් පිරි සමාජයකය.

සියල්ල මුදල මත තීරණය වන ධනවාදී සමාජය තුළ ඉතා ඈත ඉතිහාසයේදීද කාන්තාවන් තමන්ගේ අයිතීන් වෙනුවෙන් අරගල කළ අවස්ථාවන් අපට දැකිය හැකිය. ජාත්‍යන්තර කාන්තා දිනය නම් කිරීමට හේතු වන්නේද කම්කරු කාන්තාවන් විසින් කළ එවන් අරගල ඉතිහාසයය. තමන්ට ජීවත්වීමට සරිලන සාධාරණ වැටුපක් ලබාදෙන ලෙසත් පැය 16ක් 14ක් වූ වැඩ කාලය කෙටි කරන ලෙසත් පිරිමි කම්කරුවන්ට සමානව කාන්තාවන්ටද සලකන ලෙසත් ඡන්ද අයිතිය ලබාදෙන ලෙසත් ළමා ශ්‍රමය නතර කරන

**"ජාත්‍යන්තර කාන්තා දිනය නම් කිරීමට හේතු වන්නේද කම්කරු කාන්තාවන් විසින් කළ එවන් අරගල ඉතිහාසයය."**



ලෙසත් ඉල්ලා ධනවාදී සමාජය තුළ ආරම්භ වූ කර්මාන්තශාලාවල වැඩ කළ කම්කරු කාන්තාවෝ එදා අරගල කළහ. 1908 මාර්තු 08 දින එක්සත් ජනපදයේ මැන්හැට්න් නගරයේ රුට්ගා(ර්)ස් චතුරස්‍රයට කම්කරු කාන්තාවන් 15,000ක් පමණ පිරිසක් රැස් වී කළ උද්ඝෝෂණය එවැනි විරෝධතා උද්ඝෝෂණවලින් සුවිශේෂී එකකි.

1910 ඩෙන්මාර්කයේ කෝපන්හේගන් නගරයේ පැවැති සමාජවාදී කාන්තාවන්ගේ දෙවන ජාත්‍යන්තර සමුළුවේදී ජර්මනියේ සමාජවාදී නායිකාවක් වූ ක්ලාරා සෙට්කින් විසින් කාන්තා අයිතිවාසිකම් හා කාන්තාවන් සඳහා සර්වජන ඡන්ද බලය ඉල්ලා සටන් වැදුණු කාන්තාවන් සැමරීම වෙනුවෙන් ජාත්‍යන්තර කාන්තා දිනයක් නම් කළ යුතු බවට යෝජනාවක්



ගෙන ඒමට හේතු පාදක වූයේද එදා කාන්තාවන් තම අයිතීන් වෙනුවෙන් කළ අරගලයන්ය. එහි ප්‍රතිඵලයක් ලෙස පළමුවරට 1911 වසරේ සිට ජාත්‍යන්තර කාන්තා දිනය සමරනු ලැබිණි.

අද ලෝකයේ බොහෝ ස්ථානවල සමරනු ලබන කාන්තා දින, කාන්තා දිනයේ සැබෑ අරමුණෙන් බැහැරව කරනු ලබන ඒවා බවට පත් වී ඇත. පැවැත්වීමට නියමිත කාන්තා දින වැඩසටහන්වල දැන්වීම් මෙරට මාධ්‍යවලින් දැනටමත් ප්‍රචාරය වෙමින් පවතී. රූපලාවන්‍ය, ඉවුම් පිහුම්, අත්කම් වැඩමුළු, විලාසිතා වැඩසටහන් ඉන් ප්‍රධාන තැනක් ගනී.

මෙවැනි වැඩසටහන්වලින් කාන්තාවන් මුහුණ දී ඇති ආර්ථික හා සමාජීය අර්බුදයන්ගෙන් ගොඩගත හැකිද යන්න අප කල්පනා කළ යුතුය. බොහෝ විට කාන්තා කටයුතු අමාත්‍යාංශය මගින්ද කරනු ලබන්නේ මෙවැනිම ආකාරයේ වූ කාන්තා දින සැමරුම්ය. කාන්තා දිනය බිහිවූයේ කෙසේද යන්නවත් නොදන්නා ධනපති කාන්තා නායිකාවනුත් කාන්තා නිවේදිකාවනුත් විවිධ සංවිධානත් ජාත්‍යන්තර කාන්තා දිනය සමරනු වෙනුවට සිදු කරන්නේ එය කෙලෙසීමය.

ජාත්‍යන්තර කාන්තා දිනයේ සැබෑ අර්ථය වන්නේ තම පීඩාවට එරෙහිව සමගි වීමත් සිය අයිතීන් වෙනුවෙන් සටන් වැදීමත් ඉන් නතර නොවී තමා පීඩාවට පත්වන ධනවාදී සමාජය වෙනස් කොට තම අයිතීන් සැබෑ ලෙසම රැකෙන නව සමාජයක් ගොඩ නැගීම වෙනුවෙන් පෙරට ඒමත්ය. අද දවසේ පීඩාවට පත් කාන්තාවන්ගේ වගකීම වන්නේ එයය. එසේ නොමැතිව ධනපති දේශපාලන නෝනාවරුන්ට හෝ කාන්තා දිනය වෙළඳාමක් බවට පත්කර ගන්නා සේරිවාණිජලාට ගොදුරුවීම නොවේ.

## නාලිනී එන්න මල් පිපී දැයි බලන්න

ගං තෙරේ ඇවිද
මද පවන විඳ
හිම කිරම පහසින්
ජීවිතය හිරි වට්ටා
හිමිගේ අතේ එල්ලී
නාලිනී එන්න
මල් පිපී දැයි බලන්න

අරුණටත් පළමු නැගිට
හදවතේ ගිනි අවුලා
කුටුම්බය රකිනු රිසි සේ
සැප සේ දුකම දරනා

වැඩට යන එන අතර
බස් රියේ නිදි කිරනා
උපාසක බළලුන්
රහසේම හිරි ඔතප් බිඳිනා

පැය අටේ වැඩ මුරය
අතිකාල ජරමරය
වැඩිපුර සොච්චමක් ඕනෑමයි
හිමිගෙන් කරදරය

මැරී නොමැරී බාගෙට
නැගී පාපුවරුවේ ගැට්ටට
තැලී පොඩි වී පදමට
අඳුරේම ගෙට ගාටන
නාලිනී දුටුවාද
පිපුණු මල්වල අරුම

දහවලක් නොදැක
අඳුරද අඳුරක්ම වූ සඳ
නාලිනී කොහොම එන්නද
පිපුණු මල් දැක ගන්න



**"කාන්තාවන්ට විමුක්තිදායක නීති කොතරම් තිබුණත්, ඈ තවදුරටත් ගෙදර වහලියක්ම වන්නීය. එසේ වන්නේ, අවශේෂ ගෙදර වැඩ විසින් ඇය පෙළනු ලබන, ඇගේ බෙල්ල හිරකරනු ලබන, ඇය ඔබා තබනු ලබන හා ඇය කුස්සියටත්, ළදරුවන් බලාගැනීමටත් බැඳ තබනු ලබන හෙයිනි. එනිසා ඇයට සිදුවන්නේ අමානුෂික තරම් අඩු ඵලදායක වූද, අති අවශේෂ වූද, මනස්තාපය දල්වන්නාවූද, අවහිර ගෙන දෙන්නාවූද දාස වැඩ කරමින් ස්වකීය ශ්‍රමය අපතේ හැරීමටය. කාන්තාවන්ගේ නියම විමුක්තිය, නියම කොමියුනිස්ට් ක්‍රමය ආරම්භ වන්නේ (රාජ්‍ය බලය මෙහෙයවන නිර්ධන පංතියේ නායකත්වය යටතේ) මෙම අවශේෂ ගෙදර වැඩට විරුද්ධව සමා නැති අරගලයක් ආරම්භවූ විට, නැතහොත්, එය සම්පූර්ණයෙන්ම මහා පරිමාණ සමාජවාදී ආර්ථිකයකට පරිනාමණය වීම ආරම්භ වූ විට පමණකි."**

**ලෙනින්**

**තෝරාගත් කෘති, 9වන වෙළුම, 228-229 පිටු**

## සිව්දෙසින්

### සරසවි සිසුවියන් 'ෂුගර් ඩේටින්' ලෝකයට...




යුරෝපයේ දිනෙන් දින ඉහළ යන විශ්ව විද්‍යාල ගාස්තු සඳහා අවශ්‍ය මුදල් සොයා ගැනීමට නොහැකි සිසුවියන් විශාල ප්‍රමාණයක් වයසින් වැඩි ධනවතුන් සමග ලිංගික සම්බන්ධතා පැවැත්වීමේ ප්‍රවණතාව මේ වනවිට ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති බව විදෙස් මාධ්‍ය වාර්තා කරයි.

'ෂුගර් ඩේටින් ලෙස හඳුන්වන මෙය ඊට අදාළ නියෝජිත ආයතන මගින් පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවි හරහා ධනවතුන් හා සිසුවියන් මුණ ගස්වන අතර 'ෂුගර් ඩැඩී' නමින් හඳුන්වන මෙම ධනවතුන් සිසුවියන් වෙනුවෙන් විශ්ව විද්‍යාලයේ එක් මාසික ගාස්තුවක් ගෙවනු ලබයි.

එවැනි එක්තරා අමෙරිකානු සමාගමක කළමණාකාරිනියක් පවසා ඇත්තේ, ලොව පුරා රටවල මිලියන 4කට අධික පිරිසක් තම ආයතනයේ ලියාපදිංචි වී සිටින බව හා ෂුගර් ඩැඩීලට අමතරව ෂුගර් මමීලත් බොහෝ සිටින බවත්ය. එහි ලියාපදිංචි වී ඇති රටවල් අතරින් ඉදිරියෙන්ම සිටින 5 වන්නේ අමෙරිකාව, කැනඩාව, එංගලන්තය, ඕස්ට්‍රේලියාව, ප්‍රංශය බව ඇය පවසයි.

අධ්‍යාපනය මුදලට විකුණන දියුණු රටවල පවා මෙවැනි තත්වයක් උද්ගතව ඇත්නම් පුද්ගලික විශ්ව විද්‍යාල අරඹා ඇති අපේ රටේ තත්වය කෙබඳුවේදැයි සිතා ගැනීම අපහසු නොවනු ඇත. මෙය ධනවාදයේ බේදවාචකය පෙන්වාදෙන තවත් එක් පැතිකඩකි.

### ලොව වටා ගිය පළමු කත...



අමෙරිකානු ජාතික 27 හැවිරිදි කැසී ඩි පෙකෝල් මාස 18ක් සහ දින 26ක් ඇතුළත රටවල් 196කට සංචාරය කරමින් ගිනස් ලෝක වාර්තා පොතට එක්විය.

ඉතා කෙටි කාලයකින් ලෝකයේ සියලුම රටවල සංචාරය කළ ලොව පළමු කාන්තාව වන ඇය 2015 වසරේ ජුලි ආරම්භ කළ සංචාරය 2017 පෙබරවාරි 2 දින අවසන් කළාය.

ලෝකයේ ජනතාව සමග සම්බන්ධ වීම ඇගේ අරමුණ වූ බව ප්‍රකාශ කළ ඇය එම සංචාරයේදී ලෝකයේ පුරවැසියෙක් ලෙස ලෝක සාමය උදෙසා බැනරයක් රැගෙන ගිය බවත් පැවසීය.

ඇයට පෙර මෙම වාර්තාව තබා තිබුණේ අමෙරිකානු ජාතික යිලී ලියු වන අතර ඔහු 2007 සැප්තැම්බර් සිට 2010 දෙසැම්බර් දක්වා වසර 3ක් හා මාස 3කදී රටවල් 194ක සංචාරය කර තිබුණි.

දැනුම සමාජය හා චින්තනය 14

# සාවද්‍ය පරාවර්තනයේ හේතු





"ධනපති ශිෂ්ටාචාරයේ, ධනපති ප්‍රජාතන්ත්‍රවාදයේ සහ ධනපති පාර්ලිමේන්තු ක්‍රමයේ පංති ස්වභාවය පැහැදිලි කිරීමේදී සමාජවාදීන් සියලු දෙනාම කළේ, මාක්ස් හා එංගල්ස් ඉමහත් විද්‍යාත්මක යථාතථ්‍යතාවයකින් විස්තර කළ ඒ අදහස, එනම්, ඉතාමත් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව වුවද ධනපති පංතිය විසින් කම්කරු පංතිය මර්දනය කරනු ලැබීම සඳහා, ධනපතියන් ස්වල්ප දෙනෙක් විසින් වැඩකරන ජනතාව මර්දනය කරනු ලැබීම සඳහා ගන්නා අවියක් මිස අන් කිසිවක් නොවේය යන්න ප්‍රකාශ කිරීමය."

**ලෙනින්,**
**තෝරාගත් කෘති,**
**9වැනි වෙළුම,**
**120, 121 පිටු**

මානව සමාජයේ ප්‍රගතියට, ප්‍රගමනයට විශාල වශයෙන් බාධාකරන කරුණක් වී ඇත්තේ, මිනිසුන් ලෝකය නිවැරදිව අවබෝධකර නොගැනීමය. මිනිසා තමාත් තමා අවට සියල්ලත් නිවැරදිව පරාවර්තනය කර ගැනීමට සමත් නම් බොහෝ ගැටලු විසඳීම පහසුය. එහෙත් පොදුවේ මිනිසුන් තුළ සිදුවන වැරදි වටහා ගැනීම හෙවත් සාවද්‍ය පරාවර්තනය නිසා මානව සමාජයත්, සොබා දහමත් ගැටලු රැසකට මුහුණ දී සිටින අතර එම ගැටලු විසඳා ගැනීමද ප්‍රමාදකර ගනිමින් සිටී. මිනිසාට තමා අවට ලෝකය නිවැරදිව තේරුම් ගැනීමට නොහැකි කාලයක් තිබිණි. ඒ, මිනිසා බිහිවීමෙන් පසු එළඹි මුල් යුගයයි. විද්‍යාව හෝ දර්ශනය වර්ධනය නොවී තිබූ එම අවදියේ ලෝකය තේරුම් ගැනීම දුෂ්කර වුවත් වර්තමානය එසේ නොවේ. මේ වනවිට විද්‍යාව, තාක්ෂණය, පිම් පනිමින් වර්ධනයවී තිබෙන අතර මිනිසාට ලෝකය අවබෝධකර ගැනීමට පහසු කරවන දර්ශනයක් ලෙස මාක්ස්වාදයද බිහිවී තිබේ. එහෙත් මානව සමාජය තවමත් සාවද්‍ය පරාවර්තනයක් තුළ සිටී. එය එසේ වන්නේ ඇයිද යන්න තේරුම් ගැනීම ඉතාම වැදගත්ය.

### ගතානුගතික බව

මෙයට පෙරද මෙම ලිපි මාලාවේදී අප සඳහන් කළ පරිදි මිනිසා තුළ සිදුවන සාවද්‍ය පරාවර්තනයට බලපාන ප්‍රධාන සාධක වන්නේ, මිනිසා තුළ පවතින සම්ප්‍රදායක බව හෙවත් ගතානුගතික බවත්, අනෙක් අතට ධනවාදය විසින් තම පංති පාලනයේ පහසුව සඳහා මිනිසුන් අතාර්කික හා වැරදි මතවාද තුළ සිරකොට තබනු ලැබීමත්ය. ගතානුගතිකත්වය නිසා, පාරම්පරික සම්ප්‍රදායික චින්තනය නිසා නව දේවල් තේරුම් ගැනීමට, නව මානයකින් ලෝකය දෙස බැලීමට, ලෝකය නිවැරදිව අවබෝධකර ගැනීමට මිනිසාට බාධාකරයි. එසේම ධනවාදී දෘෂ්ටිවාදය පතුරවන ආගමික ආයතන, පාසල්, මතවාද බිහිකරන හා බෙදාහරින ආයතන (ජනමාධ්‍ය) විසින්ද ජනතාව කිසිවක් නිවැරදිව තේරුම් ගැනීමට නොහැකි අය බවට පත්කොට 'පඹ ගාලක' පැටලවීම කරගෙන යයි. මේ නිසාම ජනතාව වෙත විද්‍යාව හා දර්ශනය තුළ ඇති ලෝකය නිවැරදිව තේරුම් ගැනීමේ ආකාර ගෙනයාමත් අනෙක් අතට ධනවාදය පැරදවීමත් මානව ප්‍රගතිය සඳහා අත්‍යාවශ්‍ය සාධක බවට පත්ව තිබේ.

කිසියම් ගැටලුවක සියලු පැති විමසා බැලීම, එම ගැටලුව ඓතිහාසිකවත්, විෂයමූලිකවත්, ඒ වටා ඇති විවිධ සම්බන්ධතාවන් තුළත් තබා තේරුම් ගැනීම, තාර්කිකව කල්පනා කිරීම, හදිසි නිගමනවලට නොයා සත්‍ය සාධක මත තීරණ ගැනීම නිවැරදි පරාවර්තනයක් සඳහා අවශ්‍ය වේ. ඒ සඳහා මඟ පෙන්වන දයලෙක්තික අධ්‍යයන ක්‍රමය අපට හමුවන්නේ මාක්ස්වාදය තුළිනි. අප පසුගිය ලිපි මගින් සාකච්ඡා කළ ප්‍රකෘතිය තේරුම් ගැනීමේ පොදු ආකාර අපට වැදගත් වන්නේ එහිදීය.

### සාර සංග්‍රහවාදය

ධනවාදය තුළදී ධනවාදී දෘෂ්ටියේ බලපෑම සමාජය තුළ පවතින්නේ විවිධ ආකාරයෙන්ය. අධ්‍යාපනික නොවන සාමාන්‍ය ජනයා තුළ එය පවතින්නේ ගතානුගතික, අතීත සම්ප්‍රදායන් තුළ එල්බගත් මතවාදයන් තුළය. නැතිනම් ආගමික මතවාදයන් ලෙසය. ඒ අතර ධනේශ්වර අධ්‍යාපනය ලැබූ, දාර්ශනික ආකාරයෙන් සිතන බව පෙන්වන අය තුළ පවතින මතවාදයක් වන්නේ සාරසංග්‍රහවාදයයි. සාරසංග්‍රවාවාදය යනු විවිධ මත (එකිනෙකට නොගැලපෙන පරස්පර විරෝධී මත පවා) එකම ගොඩකට දමා කලවම්කර සකස්කරගත් මතවාදයකි. එය එකම අවුල් ජාලයකි. ඒ තුළ ධනවාදී අදහස්ද, සමාජවාදී ලෙස පෙනෙන අදහස්ද, ආගමික මතද, විද්‍යාවේ ඉගැන්වීම්ද, විඥානවාදයද, අතීත සම්ප්‍රදායන්ද ආදී සියල්ල එකට කලතා තිබේ. මෙය බැලූ බැල්මට දර්ශනික දෘෂ්ටිවාදයක් ලෙස පෙනුණද, මෙම මතය ප්‍රකාශකරන අය හැම දේම දන්නා අය ලෙස පෙනුණද, කිසියම් පාණ්ඩිත්‍යයකින් හෙබි පෙනුමක් තිබුණද එය ලෝකය අවබෝධකර ගැනීමට මිනිසාට විශාලතම බාධාව නිර්මාණය කරන හා මිනිසුන් අවුල් ජාලාවක පටලවා අතරමං කරන මතවාදයක් වේ. ධනවාදය තුළ මෙවැනි පුද්ගලයින් බොහෝවිට මුණගැසේ. විශේෂයෙන්ම උගතුන් ලෙස පෙනී සිටින සමහර අය මෙම ගණයට වැටේ. කිසිම දර්ශනයක්, මතවාදයක් නිවැරදිව හා හරියාකාරව අවබෝධකර නොගෙන බොහෝ වර්ගයේ මතවාද දෘෂ්ටීන් උඩින් පල්ලෙන් අහුලාගෙන එක ගොඩකට දමා ඒ මගින් දේවල් විග්‍රහ කිරීම මෙම වර්ගයේ අයගේ ස්වභාවය වේ. මෙවැනි අය හැමදේම දන්නා අය ලෙස පෙනුණද සැබවින්ම කිසිවක් ගැඹුරින් හා සම්පූර්ණයෙන් නොදන්නා අය නිසා ඔවුන්ගෙන් සිදුවන හානිය විශාලය.

> ධනවාදී ක්‍රමය තුළ ධනපති ආණ්ඩු කාලයක් තිස්සේ ජනතාව රවටා තිබෙන තත්වය තුළ " කවුරු ආවත් ඔහොම තමයි" යනුවෙන් වන මතයට විශාල ඉඩක් ලැබේ. සැබවින්ම එය සංශයවාදී මතයකි. "බලයට ආවම කවුරුත් ඔහොම තමයි" යනුවෙන් පැවසෙන්නේද එයමය. එය සේවය කරන්නේ කාටද? සැබැවින්ම එම මතය සේවය කරන්නේ, පවතින ආණ්ඩුවටය.

### සංශයවාදයට වැටීම

ධනවාදී දෘෂ්ටිය මගින් කරනු ලබන තවත් හානිකර දෙයක් වන්නේ, මිනිසා සංශයවාදයට ඇද දැමීමය. සංශයවාදය යනු සියල්ල සැක කිරීම මගින් මතුවන දෘෂ්ටිමය ප්‍රවණතාවයකි. සැකකිරීම නරක නැත. විද්‍යාවේ එක් පදනමක් වන්නේද 'සැක' කිරීමය. මාක්ස්ගේ එක් පාඨයක් වූයේද "සියල්ල සැක කරනු" යන්නය. එහෙත් එම සැක කිරීම සහ සංශයවාදය යනු දෙකක් මිස එකක් නොවේ. ලෝකය නිවැරදිව තේරුම් ගැනීමට, නව දැනුම සොයා ගැනීමට, දැනුමේ ගැඹුරට යාමට 'සැක' කිරීම අවශ්‍ය වේ. දැනට පවතින තහවුරු නොකළ දේ සැක කිරීම නව දේ සොයා ගැනීමට අවශ්‍යය. එම සැක කිරීම බැඳී ඇත්තේ, විද්‍යාත්මක ගවේෂණයත් පර්යේෂණයත් හා නිරීක්ෂණයත් සමගය. එහෙත් සංශයවාදය යනු සියල්ල සැක කරමින් නිෂ්ක්‍රිය වීමය. සංශයවාදයේ සැක කිරීම හැම විටම පවතින පැරණි දෙයට අනියමින් සේවය කරයි.

ධනවාදී ක්‍රමය තුළ ධනපති ආණ්ඩු කාලයක් තිස්සේ ජනතාව රවටා තිබෙන තත්වය තුළ "කවුරු ආවත් ඔහොම තමයි" යනුවෙන් වන මතයට විශාල ඉඩක් ලැබේ. සැබැවින්ම එය සංශයවාදී මතයකි. "බලයට ආවම කවුරුත් ඔහොම තමයි" යනුවෙන් පැවසෙන්නේද එයමය. එය සේවය කරන්නේ කාටද? සැබැවින්ම එම මතය සේවය කරන්නේ, පවතින ආණ්ඩුවටය. මන්ද ඉහත මතය විසින් නව අත්හදා බැලීමකට ඇති ඉඩ අහුරන නිසාය. පවතින ධනවාදී සමාජය වෙනුවට මීට වඩා හොඳ වඩා සාධාරණ සමාජවාදී සමාජයක් නිර්මාණය කළ හැකිය යන්න සංශයවාදය ප්‍රතික්ෂේප කරයි. ඔවුන් කියන්නේ "ඕව කරන්න පුළුවන් දේවල් නොවෙයි" යනුවෙනි. එය නව දේවල් හා නව සමාජයක් නිර්මාණය කිරීමේ මිනිස් හැකියාව සැකයට භාජනය කරන නිසා ප්‍රතිගාමී වේ.

මෙම මතවාදය සමාජ සංවර්ධනය සමාජයේ ප්‍රගතිය ප්‍රතික්ෂේප කරන අතර එය අසුබවාදී සිතිවිලි ඇතිකරයි. අසුබවාදය පෝෂණය කරයි. මිනිසුන් අභියෝග දිනීමට සටන් කරන පිරිසක් බවට පත් කරනවා වෙනුවට ඔවුන් අක්‍රීය පිරිසක් බවට, පරාධීන පිරිසක් බවට පත් කරයි.

ලෝකය නිවැරදිව තේරුම් ගැනීමට නොහැකි වූ විට සමාජ සංවර්ධනය හා එහි නියාමනයන් වටහාගැනීමට නොහැකිවූ විට බිහිවන වැරදි මතවාදයන් හා දෘෂ්ටිවාදයන් විසින් සමාජයට කරන හානිය විශාලය. එය පවතින සමාජ ක්‍රමය රකින එකකි. සමාජ සංවර්ධනයට බාධා පමුණුවන එකකි. ලෝකය නිවැරදිව වටහා ගැනීමේ ආකාරයත් උගත යුත්තේත්, ඒවා ජීවිතය තුළ භාවිතයට ගැනීමට හුරුවිය යුත්තේත් මේ නිසාය.

# මකර කටට වැටීමට ආසන්න පුල්මුඩේ කළු රත්තරන් නිධිය



ආණ්ඩුවේ ලොකු ලොක්කෝ කථා කරන වචන 10කට එක බැගින් ණය බර ගැන නන් දොඩවති. 1948 සුද්දන් රටේ දේශපාලන ක්‍රියාවලියෙන් ඉවත් වූ පසු තට්ටු මාරුවට දේශපාලනය පැමිණි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ නඩයත් එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ නඩයත් අවසානයේ තප්පුලන්නේ ණය බරක රට සිරවී ඇති බවටය. මුලදී ලෝක බැංකුවටත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලටත් ණයකරුවෙකු වූ ශ්‍රී ලංකාව අද වන විට හතර දිග්භාග යෙන්ම ණය ගෙන ඇමරිකාවටත් චීනයටත් ඉන්දියාවටත් ආදී වශයෙන් ණයකරුවෙකු වී ඇත.

ආර්ථිකයේ මහා පෙරළිකාරයන් බව කියමින් නව ලිබරල්වාදයේ ඔස්තාර්ලා ලෙසත් පෙනී සිටින පල්හොරු රැළක් අවසානයේ රට ගෙනවිත් ඇත්තේ කොතනකටදැයි නොපෙනෙන්නෝ තවමත් සිටිත්ද?

**බංකොලොත් ණයකාරයාගේ බංකොලොත් ආර්ථික උපක්‍රම**

අද දවස වන විට අපට හතර දිග්භාගයෙන්ම ඇසෙන්නේ ණය උගුලෙන් බේරුණු පසු දිව්‍ය ලෝකය මවන බව වන කථාය. 2015 දී කීවේ රටේ ණය අර්බුදය හේතුවෙන් 2015 දී ජනතාව ඉවසා සිටිය යුතු බවත් 2016 දී රට නිසි මාවතට ගෙන එන බවත්ය. 2016 දී කීවේ ජනතාව ප්‍රතිලාභ ලබන්නේ 2017 වසරේ දී බවත්ය. දැන් 2017 උදාවී ඇත. ආණ්ඩුව කියන්නේ ජනතාවගේ අතට සල්ලි බෙදන්නේ අනාගතයේ... අනාගතයේ... බවය. එසේ කියමින් කල්මරන ආණ්ඩුව තම දෛනික 'රෝල' ගෙනයාම වෙනුවෙන් රටේ සම්පත් කුණු කොල්ලයට විකුණා දැමීමට සැලසුම් සකස් කරමින් සිටී. ඒ අතර වරාය, බැංකු, තෙල්, රේගු, දේශීය ආදායම් වැනි රාජ්‍ය ආයතනද දකුණේ ඉඩම්, මුහුදු වෙරළ තීරු, ඛනිජ සම්පත් නිධි ආදියද ඇතුළත්ය.

**පළමු බිල්ල 'කළු රන් නිධිය'ද?**

බංකොලොත් ආණ්ඩුවේ පළමු බිලි අතර ඉහළින්ම පවතින ස්වභාවික සම්පතක් බවට පුල්මුඩේ ඛනිජවැලි නිධිය පත්ව ඇත. මුලතිව් හා ත්‍රිකුණාමලය අතර පිහිටි පුල්මුඩේ ඛනිජවැලි නිධිය ලෝක ප්‍රකටව ඇති අන්වර්ථ නාමය වන්නේ "ශ්‍රී ලංකාවේ කළු රත්තරන් නිධිය" (Black Gold) වශයෙනි.

ලොව පවතින ඛනිජවැලි නිධි අතරින් අති උසස්තම පිරිසිදු ඛනිජවැලි හමුවන ලොව අංක එකේ ඛනිජවැලි නිධිය සන්තකව ඇත්තේ ශ්‍රී ලංකාවටය. ඒ, මේ අප කථා කරමින් සිටින පුල්මුඩේ ඛනිජවැලි නිධියය.

අතිශය ආර්ථිකමය වාසි ගෙනදෙන නිෂ්පාදනයන් ගණනාවක් කළ හැකි අමුද්‍රව්‍ය සපයන මහඟු සම්පතක් වන පුල්මුඩේ ඛනිජවැලි නිධිය තුළ පහත සඳහන් අමුද්‍රව්‍ය ඇත්තේය.

ඉල්මනයිට් (ILMENITE)
රුටයිල් (RUTILE)
සර්කෝන් (ZIRCON) - මැණික් වර්ගයකි
මොනසයිට් (MONOZITE)
ගාර්නට් (GARNET)

එමෙන්ම තවමත් නිසි පරිදි සොයා නොගත් ඛනිජවැලි වර්ග ටොන් මිලියන 12.5ක් පමණ පවතින බවටද ගණන් බලා ඇත.

**ලොව "අනාගත ලෝහය" (METAL OF THE FUTURE)**

ලොව අනාගත ලෝහය ලෙස විරුදාවලි ලබන්නේ ටයිටේනියම් (TITANIUM) නම් මූල ද්‍රව්‍යයය. ගුවන්යානා නිෂ්පාදන ක්ෂේත්‍රයේදී අතිශය ඉහළ ඉල්ලුමක් පවතින මෙම ටයිටේනියම් මුහුදු වතුරේදීත්, රාජ අම්ලය නම් රසායනිකය තුළත්, ක්ලෝරීන් රසායනිකය තුළත් මල නොබැඳී පවතී. සනත්වයෙන් ඉතා අඩු නමුත් ඉතා ශක්තිමත්ය. වර්ණ, කඩදාසි, දත්බෙහෙත්, ප්ලාස්ටික් හා සිමෙන්ති වැනි නිෂ්පාදනවලදීත් මැණික් කර්මාන්තය, අභ්‍යවකාශ කටයුතු, නාවික කටයුතු, මෝටර් රථ කර්මාන්තය, ගෘහ භාණ්ඩ කර්මාන්තය ආදියේදීත් අද නැතිවම බැරි මූලද්‍රව්‍යයක් ලෙස ටයිටේනිම් භාවිත කෙරේ.

මෙතරම් අත්‍යවශ්‍ය ටයිටේනියම් තැන්පත්ව ඇත්තේ, 'ඉල්මනයිට්'' හා 'රුටයිල්' ඛනිජවැලි තුළය.

පුල්මුඩේ ඛනිජවැලි නිධිය ඉල්මනයිට්වලින් අති පොහොසත්ය. ගණන් බලා ඇති අකාරයට මෙම ඛනිජවැලි නිධියේ පළල කිලෝමීටර් 100ක් පමණ වන අතර කි.මී. 10ක් පමණ දුරකට පැතිරී පවතී.

එමෙන්ම එහි ඇති ඉල්මනයිට් ප්‍රතිශතය 70%-72%ත් අතර ද රුටයිල් ප්‍රතිශතය 8% පමණ වෙතැයිද ගණන් බලා ඇත. ඉල්මනයිට් වැල්ලේ ටයිටේනියම් 53%ක් පමණ අඩංගු අතර රුටයිල් වැල්ලේ 95%ක් පමණ ටයිටේනියම් අඩංගුය.

මෙම ඛනිජවැලි නිධිය කෙතරම් වටිනාකමක් සහිතද යන්නත් එහි අනාගත වැදගත්කම කොපමණද යන්නත් ඉහත තොරතුරු අනුව වටහාගත හැක.

ආසන්න වශයෙන් ගණන් බලා ඇති ආකාරයට මෙම නිධිය තුල ඉල්මනයිට් මෙට්‍රික් ටොන් 903 000ක් පමණ පවතින අතර රුටයිල් මෙට්‍රික් ටොන් 9 500ක් පමණ ඇත.

**තවත් වටිනා ඛනිජ ද්‍රව්‍ය රැසක්**

සර්කෝන් හා ගාර්නට් යනු මැණික් වර්ග වේ. ගණන් බලා ඇති ආකාරයට මෙම නිධියේ සර්කොන් මෙට්‍රික් ටොන් 39,000ක් පමණ ඇත. එමෙන්ම ඉල්මනයිට්, රුටයිල් හා සර්කොන් පිරිපහදුවේදී එන අතුරුඵලයක් වන මොනොසයිට්ද වටිනා ඛනිජ ද්‍රව්‍යයකි. පුල්මුඩේ ඛනිජවැලි නිධියේ ඇති මොනොසයිට ප්‍රමාණය දෙවැනි වන්නේ චීනයේ පිහිටි එවැනි නිධියකට පමණක් බවද පැවසේ.

> මේ සා විශාල සම්පතක් විදේශීය සමාගමකට විකුණා දමා සිදුකිරීමට යන මහා අපරාධය වළකා දැමිය යුතුයමය. තම තමන්ගේ නොහැකියාවත් බැරිකමත් බංකොලොත්කමත් වසා ගැනීමට ගෙදර වළං පිඟන් විකුණා විසඳුම් සෙවිය නොහැකිය.

**මෙපමණ කලක් කළ දෙයක් නැත**

මෙතරම් වටිනා සම්පතක් තිබුණත් ඉන් ගත් ප්‍රයෝජනය කුමක්දැයි විමසුවහොත් මෙරට පාලකයන් තවත් ලැජ්ජා විය යුතුය. ඊසාන දිග මෝසම් සුළගේ බලයෙන් තරංග නගන නැගෙනහිර මුහුදෙන් ගොඩග සන මෙම මහාර්ඝ සම්පත කුණු කොල්ලයට එලෙසින්ම පිටරට පැටවීම හැර අන් ප්‍රයෝජනයක් මෙතෙක් කලක් ගෙන නැත. 1957දී වර්ෂයේදී ස්ථාපිත කළ ඛනිජවැලි සංයුක්ත මණ්ඩලය පසුව ලංකා ඛනිජවැලි සමාගම බවට පත්කරන ලදී. ඛනිජවැලි සංස්ථාව රජය යටතේ පැවතියා සේම ඛනිජවැලි සමාගමද රාජ්‍ය සමාගමකි. නම් වෙනස් වූවද ක්‍රියාවෙන් වෙනසක් වී නැත. වැලි පිරිපහදුකර විකිණීම හැර වෙනත් කර්මාන්තයක් නොමැත. රටේ පාලකයන් විසින් මෙවැනි සම්පතක් අප සතුවීමේ භාග්‍යයට පයින් ගසා ඇත. එසේ පයින් ගසා අද වන විට රනිල් මෛත්‍රී ආණ්ඩුව සූදානම් වන්නේ කීයක් හෝ හොයාගැනීම සඳහා පුල්මුඩේ ඛනිජවැලි නිධියද තුට්ටු දෙකකට විකුණා දැමීමටය. මේ වන විට චීනයේත් ජපානයේත් ආයෝජකයන් මේ සඳහා මෙරටට පැමිණ සාකච්ඡා කර ඇත.

**විකිණීමට එරෙහි බාධා ඉවත් කිරීම**

අද වන විට මෙ ඛනිජවැලි නිධියේ අයිතිය විදේශයකට ලියාදී ඩොලර් ලබාගැනීම සඳහා පවතින බාධා ඉවත් කරමින් සිටින බව පෙනී යයි. දේශපාලනයට යටත් නොවූ සමාගමේ නිසි බලධාරියා ලෙස කටයුතු කළ, රාජ්‍ය දේපළ විකිණීමට එරෙහි වූ අශෝක පීරිස් මහතා වහාම එම තනතුරින් ඉවත්කර ඇත. ඒ වෙනුවට වංචාකාරී පුද්ගලයෙකු බවට චෝදනා ලැබූ පුද්ගලයෙකු එහි සභාපති පුටුවේ වාඩි කරවා ඇත. මේ සූදානම් වන්නේ රනිල් මෛත්‍රී ආණ්ඩුව හැරෙන්නේ පොල් පැළය කාදැමීමට බව නොකිවමනාය.

**ජනතාවට තවත් සටනක්**

මේ සා විශාල සම්පතක් විදේශීය සමාගමකට විකුණා දමා සිදුකිරීමට යන මහා අපරාධය වළකා දැමිය යුතුයමය. තම තමන්ගේ නොහැකියාවත් බැරිකමත් බංකොලොත්කමත් වසා ගැනීමට ගෙදර වළං පිඟන් විකුණා විසඳුම් සෙවිය නොහැකිය. මෙම මහඟු සම්පත රටට අහිමිකර බංකොලොත් ධනපති පාලකයන් නටන නාඩගම නවතා දැමිය යුතුය. එය අද දවසේ කළ හැකි වන්නේ, ශක්තිමත්ව නැගී සිටින ජනතා ව්‍යාපාරයකට පමණි.


15වැනි පිටුවට

ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස්
වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.

2017 පෙබරවාරි 07

# "පොලිස් නිලධාරීන් සිටිය යුත්තේ හැංගී සිට දඩ ගැසීමට නෙමෙයි"

පාර්ලිමේන්තු මන්ත්‍රී
**වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා**



අපේ රටේ ජනතාවගේ ජීවිත ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් අදාළ වන නීති සහ මාර්ග සලකුණු, සංඥා පිළිබඳව තමයි අපි මේ සාකච්ඡාව කරන්නේ. මේ මාර්ග නීති, සලකුණු, සංඥා සියල්ල වුවමනා කරන්නේ, ජනතාවගේ ජීවිත ආරක්ෂා කරන්නයි. එහෙම නැතිව පාර දෙපැත්තේ ලස්සනට බෝඩ් හිටවලා පරිසරය අලංකාර කරන්න නොවෙයි. **මේ නීති පද්ධතිය කෙසේ තිබුණත් අද වෙනකොට අපේ රටේ ජනතාවගේ ජීවිත බිලිගන්නා මාරකයක් බවට මේ මාර්ග අනතුරු පත්වෙලා තිබෙනවා. ලෝක සෞඛ්‍ය සංවිධානයේ 2014 වාර්තාවන් අනුව අපේ රටේ මාර්ග අනතුරු නිසා සිදුවූ මරණ සංඛ්‍යාව 2,773ක් වන අතර, 2015 වර්ෂයේදී එය 2,801 දක්වා වර්ධනය වෙලා තිබෙනවා. ඒ අනුව රටේ සිදුවන මුළු මරණවලින් සියයට 2.19ක් පමණ මාර්ග අනතුරු නිසා සිදුවන මරණ වෙනවා.**

මේ විධියට දිනකට දළ වශයෙන් සියයට 7.6ක පමණ මරණ ප්‍රමාණයක් මාර්ග අනතුරු නිසා සිදු වන රටක් අපේ රට. අපේ රටේ කොතනක හෝ පැය තුනකට වරක් ඒ කියන්නේ, අපි මේ සාකච්ඡා කරන මොහොතේදී පවා හදිසි අනතුරු නිසා, මාර්ග අනතුරු නිසා ජීවිතයක් නැති වෙනවා. තත්වය මොහම වුණත් අපි පාරට බැහැලා බැලුවොත් හන්දියක් හන්දියක් ගානේ, වංගුවක් වංගුවක් ගානේ පොලිසියෙන් ඉන්නවා. එක වංගුවක් පසු කරගෙන ටික දුරක් යන කොට ආයෙත් පොලිසියේ මහත්වරු ඉන්නවා. දඩ ගහන්න බලාගෙන. ඔවුන් ඉන්නේ බදු අයකැමිවරුන් වාගේ දඩ අය කරන්නද, එහෙම නැත්නම් ජනතාවගේ ජීවිත ආරක්ෂා කරන්නද? පසුගිය කාලයක් පුරාවට බලයට පත් වුණු ආණ්ඩු, ඒවායේ කැබිනට් මණ්ඩල විසින් ගත්ත තීන්දු තීරණ අනුව ඒ පොලිස් නිලධාරින්ට බල කර තිබෙන්නේ ජනතාවගේ ජීවිත ආරක්ෂා කිරීම වෙනුවට, හැංගිලා ඉඳලා දඩ ගහන්නයි. ඒ පොලීසියේ මහත්වරු රියැදුරන්ට පෙනෙන්න හිටියොත් තමයි රථ වාහන අනතුරු අවම වෙන්නේ, වේගය සීමා වෙන්නේ; නීතියට අනුව රථය ධාවනය කරන්නේ; විනයානුකූලව පාරේ ගමන් කරන්නේ. එහෙම නම් මේක බරපතළ තත්වයක්. ඒ නිසා අපි අවධානය යොමු කරන්න ඕනෑ මේ සියලු පද්ධති, රාජ්‍ය යන්ත්‍රණය මෙහෙය විය යුත්තේ ජනතාවගේ ජීවිත ආරක්ෂා කිරීමට විනා, භාණ්ඩාගාරය පිරවීමට නොවෙයි කියන කාරණයට.

නීති පද්ධතිය කෙසේ තිබුණත් අද වෙනකොට අපේ රටේ ජනතාවගේ ජීවිත බිලිගන්නා මාරකයක් බවට මේ මාර්ග අනතුරු පත්වෙලා තිබෙනවා. ලෝක සෞඛ්‍ය සංවිධානයේ 2014 වාර්තාවන් අනුව අපේ රටේ මාර්ග අනතුරු නිසා සිදුවූ මරණ සංඛ්‍යාව 2,773ක් වන අතර, 2015 වර්ෂයේදී එය 2,801 දක්වා වර්ධනය වෙලා තිබෙනවා. ඒ අනුව රටේ සිදුවන මුළු මරණවලින් සියයට 2.19ක් පමණ මාර්ග අනතුරු නිසා සිදුවන මරණ වෙනවා.

මා අතේ තිබෙනවා, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව. ඒ අනුව, 2016 ජනවාරි මාසයේදී විගණකාධිපති දෙපාර්තමේන්තුව ඉල්ලා සිටියා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ලිපිගොනු ප්‍රමාණයක්, ඒවා හොයා ගෙන යනකොට ලිපිගොනු 597ක් අස්ථාන ගත වෙලා තිබෙනවා. ඒ නියැදියේ ලිපිගොනු 597ක් අස්ථානගත වෙලා තිබෙනවා. මේවා වැස්සට තෙමිලා, කාවෝ කාලා, මීයෝ කාලා විනාශ වෙන ඒවා නොවෙයි.

හැබැයි අවසානයේදී කියනවා, ඒ විගණනයට ඉල්ලා තිබූ ලිපිගොනු 597න් 21ක් පමණයි ඉදිරිපත් කරගන්න පුළුවන් වුණේ කියලා. තවමත් ඒ ලිපි ගොනු ආරක්ෂා කරගන්න ක්‍රමවේදයක් නැහැ. ලිපි ගොනු ආරක්ෂා කිරීම සඳහා ක්‍රමවේද හදන්න මොන තරම් උත්සාහ කළත්, හදන්න දෙන්නේත් නැහැ. එහෙමත් ප්‍රශ්නයක් මෙතැන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කටයුතු විධිමත් කිරීමේ අරමුණින් ඒ කටයුතු පරිගණක ජාලගත කිරීම සඳහා 2009 අවුරුද්දේ සිට 2015 දක්වා වූ වසර 6 තුළ වෙන් කර තිබෙනවා. රුපියල් මිලියන 740ක ප්‍රතිපාදන, එම වසර 6 තුළ ඒ කටයුතු පරිගණක ජාලගත කිරීම සඳහා රුපියල් මිලියන 740ක ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. නමුත් තවමත් **15වැනි පිටුවට**

2017 පෙබරවාරි 08

# "රාජ්‍ය සම්පත් අයිතිය විකිණීම නතර කරන්න"

පාර්ලිමේන්තු මන්ත්‍රී
**සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා**

අද සාමාන්‍ය ජනතාවට තිබෙන ප්‍රශ්න තමයි හාල් කිලෝවක මිල රුපියල් සියයට වඩා වැඩි වෙයිද, ඒක පාලනය කරන්න ක්‍රමයක් තිබෙනවාද, නැද්ද; තමන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය මුදලට විකිණෙනවාද, නැද්ද? කියන ඒවා. ඉගෙන ගන්නා කෙනෙකුට ඉගෙන ගැනීමේ අර්ථය මනින මිනුම බවට මුදල් පත්වෙන තත්වයකට දැන් ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම හෙට දවසේදී දරුවන් තීරණය කරන්න පුළුවන් "මේ ක්‍රමයට ඉගෙන ගෙන අපට වෛද්‍යවරයෙක් වෙන්න බැහැ: ඒ නිසා සාමාන්‍ය පෙළ පාස් වුණාට පසුව උසස් පෙළ වැඩ තුනක් තිබුණාම ඇති; ඉතුරු ටික සඳහා බැංකුවක් කඩලා හෝ මංකොල්ල කාලා හෝ සල්ලි හොයා ගත්තාම එය සම්පූර්ණ කර ගන්න පුළුවන්." කියලා. එවැනි තත්වයකටයි මේ ගමන් කරමින් තිබෙන්නේ.

**පුල්මුඩේ**

තවත් කාරණයක් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. පසුගිය දවසක පාර්ලිමේන්තුව හමුවට කැඳෙව්ව. පුල්මුඩේ ඛනිජ වැලි සමාගම. පුල්මුඩේ ඛනිජ වැලි සමාගම මා පෞද්ගලිකව ගිහිල්ලා බැලුවා. ඒ සමාගම ඛනිජ වැලි හැටියට හාරලා ගන්නේ මුහුදු වෙරළේ හතරක සීමාවේ ඒවා. නමුත්, අපට මුහුදු වෙරළේ කිලෝමීටර් 18ක දිග ප්‍රමාණයක් තිබෙනවා. හොඳම ඛනිජ වැලි හොයන ඕස්ට්‍රේලියාවට අමු වැලි මෙට්‍රික්ටොන් එකක් හෝදලා ගත්තාම ඔවුන්ට ගන්න පුළුවන් වෙන්නේ ඛනිජ වැලි සියයට 10යි. හැහැයි, ලංකාවේ අපට අමුවැලි මෙට්‍රික් ටොන් එකක් හෝදලා ගත්තාම සියයට 80ක් ඛනිජ වැලි ගන්න පුළුවන්.

අපට ඉල්මනයිට් හොයා ගන්න පුළුවන්. හැබැයි, අපට ඒක විකුණා ගන්න බැහැ. ඒ නිසා අද ඇති වෙලා තිබෙන තත්වය තමයි පුල්මුඩේ ඛනිජවැලි සංස්ථාව ස්වභාවික මරණයකට පත් කරලා. එය පෞද්ගලික අංශයට විකිණීම සඳහා කටයුතු සැලසුම් කර තිබීම. ඒ වෙනුවෙන් ඛනිජ වැලි සමාගමට නිධියේ කැණීම් කටයුතු කරන්න අවසරය දුන්නේ නැහැ. භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයෙන් අවසර දීම නතර කර තිබෙනවා. හැබැයි, පෞද්ගලික අංශයට අවසර දෙනවා. රජයට අවසර දෙන්නේ නැහැ. රජයේ ආයතනය. ඒ මොකද? තිබෙන තොගය විකුණා ඉවර වුණාට පස්සේ, පඩි ගෙව්වාට පස්සේ අලාභයි කියලා වෙන්දේසි කරන්න පුළුවන්.

**කහටගහපතල**

ඒ වාගේමයි කහටගහ පතලේ තත්වයත්. දැන් මේ ආණ්ඩුව පෞද්ගලිකරණය කරන්නේ නැහැ. ඒක තමයි අදහස. "පෞද්ගලිකරණය" කියන වචනය මේකට ගන්න බැහැ. ඒ නිසා මේකට අරගෙන තිබෙනවා, "ප්‍රතිව්‍යුහගත කිරීම" කියන එක. එහෙම නැත්නම් පෞද්ගලික-රාජ්‍ය සහභාගිත්වය කියන එක. ඒ කෙසේ වුවත්, අවසානයේ සිද්ධ වෙන්නේ මොකක්ද? විකිණීම තමයි. ඒ විකිණීම යටතේ දැන් කහටගහ පතලට ව්‍යාපෘතියක් හදලා තිබෙනවා. කහටගහ පතලේ මේ වෙන කොට මෙට්‍රික් ටොන්



1,072ක තොගයක් තිබෙනවා. ඊළඟට, මාසිකව මෙට්‍රික්ටොන් හැට, හැත්තෑව ගණනේ එකතු කරනවා. දැන් ඒක විකුණන්න අය හොයා ගෙන, විකිණීම සඳහා වන කැබිනට් පත්‍රිකා හදලා තිබෙනවා. සේවකයින් 126ක් එක්ක මේක විකිණීමට අවශ්‍ය කරන මූලික ලේඛන දැන් සකස් කරගෙන තිබෙනවා.

**හිඟුරාන සීනි**

හිඟුරාන සීනි කර්මාන්තශාලාව ගැනත් ඔබතුමා හොඳින් දන්නවා. රජය යටතේයි ඒ ආයතනය තිබෙන්නේ. හෙක්ටෙයාර ප්‍රමාණය ගත්තොත්, ඒකෙන් සියයට 51ක අයිතිය රජයට තබාගෙන ගල්ඔය වැවිලි සමාගම හැදුවා. දැන් නැවත හිඟුරාන සීනි කර්මාන්ත ආයතනය ඇවර කරන්න කැබිනට් තීරණ අරගෙන තිබෙනවා. ප්‍රශ්නය තිබෙන්නේ, දේපොළ කොච්චර තිබෙනවාද කියලා අපි දන්නේ නැහැ. වත්කම් කොච්චර තිබෙනවාද කියලා අපි දන්නේ නැහැ.

හිඟුරානේ තිබුණා ස්කාගාරයක්. අද ඒ ස්කාගාරය නැහැ; යකඩවලට කපලා විකුණනවා. මීට කලින් 1990 ගණන්වල හිඟ තියපු, මැරයෝ අරගෙන ගිහිල්ලා බැහැපු වීරබාහුලා අදත් නැහැ. හිඟුරානට රුපියල් මිලියන 110ක් තවම ගෙවලා නැහැ.

විකුණලා බලයේ ඉඳලා, වැජඹිලා යන්නත් පුළුවන්. හැබැයි අපි අහනවා, එතකොට අපේ රටේ ජනතාවට මොකක්ද ඉතුරු වෙන්නේ කියලා. මෙහෙම විකුණලා ණය ගෙවන්න පුළුවන්ද? අපි හිතමු. ණය ගෙවන්න විකුණනවා කියලා. දැන් මේ තර්කය තිබෙන්නේ ඒක නේ. ණය ගෙවන්න පුළුවන්ද, මේ විධියට විකුණලා?

**ජනවරමට පිටුපෑම**

2015 මහ මැතිවරණයේදී ජනතාව ඉතා පැහැදිලි තීරණයක් දීලා තිබෙනවා. ඒ පැහැදිලි තීරණය තමයි එක්සත් ජාතික පක්ෂයට තනියෙන් ආණ්ඩුවක් හදන්න බලයක් දීලා නැති එක. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බලයක් දීලාත් නැහැ. එකක් එපා වෙනකොට එකක් මාරු කරගෙන ඔබතුමන්ලා හැමදාම මේ රටේ දේශපාලනය කළාට, ජනතාව ජනවරමක් දීලා නැහැ, තනිව ආණ්ඩු පිහිටුවලා තමන්ගේ පක්ෂයට විකිණීමේ ක්‍රියාවලියක් ගොඩ නඟන්න. ජනතාවගේ ජනවරමේ බලය තමයි ඔබතුමන්ලා මේ පාර්ලිමේන්තුවේ ඔළු ගෙඩිවලින් වෙනස් කරගෙන තිබෙන්නේ. ඒ නිසා මම විශ්වාස කරනවා, කහටගහ පතල විකිණීමේ යෝජනාව මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා බහුතර බලයෙන් සම්මත කරගන්න ඔබතුමන්ලාට පුළුවන් කියලා. පුල්මුඩේ ඛනිජ වැලි නිධිය ස්වාභාවිකව මරණයට පත් කරලා පාඩුයි. කර කියා ගන්න දෙයක් නැහැ. පඩි ගෙවා ගන්න විධියක් නැහැ. දැන් මිනිරන්, එහෙම නැත්නම් ඉල්මනයිට්, රූටයිල් හදන්නේ නැහැ කියලා ඒ ඛනිජ සම්පත් ටික විකුණන්න පුළුවන්.

**විකුණලා බලයේ ඉඳලා, වැජඹිලා යන්නත් පුළුවන්. හැබැයි අපි අහනවා, එතකොට අපේ රටේ ජනතාවට මොකක්ද ඉතුරු වෙන්නේ කියලා. මෙහෙම විකුණලා ණය ගෙවන්න පුළුවන්ද? අපි හිතමු. ණය ගෙවන්න විකුණනවා කියලා. දැන් මේ තර්කය තිබෙන්නේ ඒක නේ. ණය ගෙවන්න පුළුවන්ද, මේ විධියට විකුණලා?**

මේ අවුරුද්දේ හම්බන්තොට වරායෙන් බේරෙනවා. ලබන අවුරුද්දේ ත්‍රිකුණාමල වරායයි, තෙල් ටැංකි ටිකයි දීලා බේරෙනවා. ඊළඟ අවුරුද්දේ? මේ විධියට විකිණුවොත් ඔබතුමන්ලාට අඩු තරමේ 2020 වසර වෙනකල්වත් විකුණන්න දේවල් ඉතුරු වෙන්නේ නැහැ.

**හම්බන්තොට වරාය**

දැන් තිබෙන මේ ප්‍රශ්නය හරියාකාරව තේරුම් ගන්න ඕනෑ. අපි කවුරුත් යථාර්ථය පිළිගන්නවා. රට ණය වෙලා නොවෙයි. රට ණය කරලා තිබෙනවා. ඒක තමයි යථාර්ථය. ණය වෙලා තිබෙන්නේ මොන හේතුවටද කියා අපි බලන්න ඕනෑ. හම්බන්තොට වරායෙන් අද මිලියන 37,134ක් ණයයි; පාඩුයි. හැබැයි, එම පාඩුව වුණේ ඇයි? අපිට වරායක් ඕනෑ. ඒක ඇත්ත. හැබැයි, මේ වරායේ මොකද කරන්නේ කියා ශක්‍යතා අධ්‍යයනයක් තිබෙනවාද? එහෙම තිබුණේ නැහැ.

එදා, රාජපක්ෂ මහත්මයාගේ පාලන කාලයේ හම්බන්තොට වරාය හදනකොට, වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ වාගෙ'ම අද තමුන්නාන්සේලා පුල්මුඩේ ඛනිජ වැලි නිධිය විකුණන්න හදනකොට, කහටගහ පතල විකුණන්න කැබිනට් පත්‍රිකා ගෙනෙනකොට, හිඟුරාන ඇවර කරන්න ගෙනෙනකොට තිබෙන සැලැස්ම මොකක්ද? අපි අහන්නේ ඒකයි. ආණ්ඩුවේ සල්ලි මිලියන 10,800ක් වියදම් කරලා කොළඹ වාරායේ නැගෙනහිර ජැටිය හැදුවා. අද නැගෙනහිර ජැටියෙන් ආණ්ඩුවට සියයට 15ක අයිතිය තබා ගෙන සියයට 85ක් දෙන්න යනවා නම්, සාධාරණත්වය මොකක්ද? ලාභ ලබන ආයතනයක්. **15වැනි පිටුවට**

කවුළුව හැරමි තබමි

# උන්ගේ ණය - මුන්ගේ ණය හා අපි ගෙවන ණය

වත්මන් අණ්ඩුවට අනුව රට මේ ප්‍රපාතයට වැටුණේ රාජපක්ෂ ආණ්ඩුව ලබාගත් ණය කන්දරාව නිසාය. එම ණය තමන්ට ගෙවීමට සිදුවී ඇති බව රනිල් පවසයි. රටේ සංවර්ධන වේගය අඩාල වන්නේ එනිසා යැයිද ඔහු කියයි. රටේ ජනතාවට සහන ලබාදීමට අසීරු වී ඇති බවද ඔහු පවසයි. මීට පිළිතුරු ලෙස මහින්ද රාජපක්ෂ පවසා සිටියේ රනිල්ලා ගත් ණය එදා තමාට ගෙවීමට සිදුවූ බවයි.

මේ දෙගොල්ලෝම එකතුවී රට ණය කළේ කුමකටද? එම ණයවලින් කළේ මෙනවාද කියා අද මුළු රටම දනී. මේ අය කථා කරන්නේ හරියට ඒ අයගේ සාක්කුවෙන් මේ ණය කන්දරාව ගෙවා දමන බවක් මවා පාමිනි. ඒ සඳහා මේ අණ්ඩුවේ එකම උත්තරය වී ඇත්තේ රට තව තවත් ණය කිරීම හා රට විකිණීමය. එයාගේ ණය මෙයාට ගෙවීමට සිදුවී ඇත. මෙයාගේ ණය එයාට ගෙවීමට සිදුවී ඇත. යන කථාවේන් ඔප්පු වන්නේ, මොවුන් දෙගොල්ලම එකතුවී කළ එකම දෙය රට ණය කරවීම බවය. මේ වන විට රටේ එක පුරවැසියෙක් ලක්ෂ 5කට වඩා ණය කර ඇත. ඒවා පියවීමට යැයි කියමින් රටේ පුරවැසියා මත තව තවත් දඩ සහ බදු පිට බදු පටවමින් සිටී. අනෙක් අතින් රටේ සම්පත් වෙන්දේසියේ දමා ඇත. පසුගිය තිස් වසර පුරාම රටේ පාලකයන් බලය පවත්වාගෙන ගියේ යුද්ධය පෙන්වමින්ය. දැන් එය කරන්නේ රටේ ණය කන්දරාව ඉදිරියට දමාගෙනය.

අවසානයේ මේ දෙගොල්ලන්ම කර ඇත්තේ එකිනෙකා මත වරද පටවමින් මුළු රටම උකසට තබා තම පවුල් සංස්ථා සහ වරිගයා පෝෂණය කිරීම පමණි; රට සංවර්ධනය කිරීමට යැයි කියමින් රටේ ණය බර සංවර්ධනය කිරීම පමණි. ජනතාවගේ දුගී බව සංවර්ධනය කිරීම පමණි. ජනතාව තලා පෙළා රටේ ප්‍රශ්න වර්ධනය කිරීම පමණි. ජනතාවගේ ජීවන බර සහ ගැටලු වර්ධනය කිරීම පමණි.

අපේ ප්‍රශ්නය මේ අමන සූදුව රටේ ජනයා තව කොතෙක් දුරට ඉවසා දරාගෙන සිටිය යුතුද යන්නය. එය ඉදිරියේ තව කොතෙක් කල් නිද්‍රාගතව සිටිය යුතුද යන්නය.




# පොලිටිකල් පංතිය

පොලිටික්ක උදේම පංතියට ඇවිත් මේසෙ උඩ තියාගෙන බර පොතක් කියෝනව. පංතියට එන ළමයි එකා දෙන්නා ගුඩ් මෝනිං කියන්න ගිහින් ගිලගන්නව, පොලිටික්කගෙ මූඩ් එක දන්නෙ නැති හින්ද.

"ගුඩ් මෝනිං සර්," බලන් ඉන්න බැරිම තැන වසන්තිය කිවුව.

"වෙරි ගුඩ් මෝනිං සර්" වෙන දෙයක් වසන්තියටත් එක්කමනෙ කියල අනුරුද්දියත් කියල දැම්ම.

"ආ ඔය ළමයි ඇවිල්ලනෙ... මම දැක්කෙත් නෑ... පොත බල බලනෙ හිටියෙ" කණ්ණාඩිය යටින් ළමයි එනව බලපු පොලිටික්ක ගල් පැලෙන බොරුවක් කිවුව.

"මේක බොහොම වැදගත් පොතක්..." පොලිටික්ක කිවුවෙ මොන තරම් අවධානෙන් කියෙව්වද කියල පෙන්නන්න. "වෛද්‍ය ශාස්ත්‍රය ගැන තියෙන්නෙ."

"ඇයි සර් දොස්තර විභාගෙ ගන්නවත්ද?" මංජුව කුණුහරුප කතාවක් කිවුව.

"ළමයො මිනිස්සු කියවන්නෙ විභාගවලට ලියන්නම නෙමෙයි. දැනුම ගන්න." පොලිටික්ක කියද්දි කනිය 'ජයවේවා' කිවුව.

"එහෙනම් සර් මම අර සඟරාව බලනකොට ඇහුවෙ ඕකෙන් විභාගෙට එනවද කියල," මංජුව පරණ වාඩුවක් ගන්න බැලුව.

"මම එහෙම කිවුවද?... මට මතක නෑ." පොලිටික්ක දුමින්ද තියරිය දැම්ම.

"කියවන්නෙ දැනුම ගන්න. දැනුම ඕනෙ ලෝකෙ තේරුම් ගන්න. හැබැයි තේරුම් යන මිනිස්සු මේ ක්‍රමේට අවුල්. ඒ හින්දා අපේ විභාගවලින් තෝරන්නෙ කටපාඩම් කිරීමේ හැකියාව." සමන දර්ශනේ කෑල්ලක් ඔබා ගත්ත.

"ඒක නෙමෙයි ළමයිනේ, බලන්න සයිටම් ළමයින්ට තාමත් රෙජිස්ටර් වෙන්න දෙන්නෙ නැහැනෙ." "බලන්න අපේ දුවකට ලක්ෂ සීයකට කිට්ටු වියදම්." පොලිටික්කගෙ ඈතින් ඥාති වෙන දුවක් ගැන හිතල පොලිටික්ක කම්පාවෙ.

"ඔය කිවුවෙ කෝටියක් වියදම් කරන්න පුළුවන් ඥාතියො ඉන්නව කියල පෙන්නන්න." චමිය කනියට කෙඳිරුව. "එයාට මතක නැහැ පිස්සු නැටුව ඔය දුවට එස් තුනයි ලැබුණෙ කියලා අපිට බණ දෙසුව කියල."

"දැන් මහින්ද මහත්තය ජනාධිපති කාලෙ සයිටම් එක හදන්න උදව් කළා. ණය දුන්න. තමන් ගැන සිංදුව කියපු ළමය ඒකට දැම්ම. ශිෂ්‍යත්ව කියලා සයිටම් එකේ වියදමෙන් ඉගෙන ගන්න ළමයි දහදෙනෙක් දැම්ම. දැන් මිනිස්සු විරුද්ධ වෙනකොට කුරුණෑගල විපක්ෂෙ මන්ත්‍රී නිසා විරුද්ධයි කියනවා... මොන ලැජ්ජ නැතිකමක්ද?" සමනගෙ කතාවට කවුරුත් හිතපු නැති විදිහට පොලිටික්ක ලොක් වුණා.

"මෙහෙමයි, දේශපාලනේ කියන්නෙ එහෙම තමයි." පොලිටික්ක දේශපාලනෙයි ඥාතිකමයි අතරෙ දෝලනේ. "කවුරු මොනව කිවුවත් දැන් අධිකරණ තීරණයක් තියෙනවනෙ." පොලිටික්ක බණ්ඩක්ක තියරියට බැස්ස.

"අධිකරණෙ තීරණේ ආවෙ නිකම් නෙමෙයිනෙ. පැමිණිලිකාරයයි විත්තිකාරයයි දෙගොල්ලම එකතු වෙලා එකම කතාව කිවුව හින්දනෙ. මහින්දලයි රනිල්ලයි එකම කුට්ටමනෙ අනන්නෙ. මුල ඉඳල අද වෙනකම් යටින් උඩින් ගේම. සයිටම් එක පටන්ගන්න අවසර දුන්නෙ ගේමක් ගහල. නැත්නම් මේ තරම් වංගු ගහපු එකට උපාධි දෙන්න අවසර දෙන්නෙ කවුද? රුසියාවට සම්බන්ධයි කිවුව. පස්සෙ නෑ කිවුව. ඇමති අනුමැතිය තියෙනව කිවුව. සායනික පුහුණුව දෙන්න රෝහලක් තියෙනව කිවුව. ඒකෙ ලෙඩ්ඩු නෑ කියල රජයේ රෝහල් ඉල්ලුව. කීයක් නම් දේවල් කිවුවද?" සමන බොක්කම අදිනව.

"ඇයි ළමයින්ට ඉගෙන ගන්න ඇත්ත මිනී ඇටකටු තියෙනව කියල පෙන්නන්න තාජුඩීන්ගෙ අස්ථීත් හොරකම් කරලා ගෙනිච්චෙ." මංජුව ඌණ පූර්ණය කරනව.

"ඇයි පරිපාලන ලොක්ක, සීඊඕ, හොර දොස්තර කියන්නෙ. අර වෙඩි තිබ්බා කියලා රඟපෑවේ. " කනියගෙ කණටත් නිවුස් වැදිල.

"ඔහොම බලනකොට මේක හොර ගුහාවක්නෙ. නැද්ද සර්" මංජුව පොලිටික්කව ඇදල ගන්න හොයනකොට එයා ලොකු පොත හම් මල්ලටත් දානව, කැන්ටිමට පහුබහින්න.

# ලොකු බබා සහ පොඩි බබා



බොරු SAITM විරෝධීන් සහ ඇත්ත SAITM විරෝධීන් හඳුනා ගැනීමට බැරි තරම් අද SAITM විරෝධී සටන සංකීර්ණ වී ඇත.

මහින්ද රාජපක්ෂ ද අංශක 180ක් ආපසු කැරකී අද SAITM විරෝධීයෙක් වී ඇත. SAITM ආයතනය පිහිටු වීම සඳහා පූර්ණ රාජ්‍ය අනුග්‍රහය දුන්නේ රාජපක්ෂ පාලනය බව රටම දන්නා කරුණකි. එහෙත් වාසු 'බබා' එය නොදනී. ඔහු "අපිටත් කොළේ වහල මහින්ද මේක කළානේ" කියමින් ඇඟිල්ල සූප්පු කරමින් හඬා වැටේ . අද ඉන්න මහින්දට ඊයේ උන් මහින්දව අමතක වී දැන් මහින්ද ලොකු බබාද SAITM විරෝධී 'කෝටුව' අතට ගෙන ඇත. දැන් මේ සියල්ලෝම සූප්පු උරන බබාලා වගේ රඟපාති. මුළු රටම සූප්පු කර හපයක් බවට පත් කළේ මේ බබාලාම බව අමුතුවෙන් කියාදිය යුතු නැත.

මේ උක්කුං බබා කථාවලින් තම හෙළුව වසාගැනීමට නම් මෙරට දේශපාළුවන් හරි හපන්ය. ඇත්ත සටන් යටපත් කිරීමට බොරු සටන් නිර්මාණය කිරීම මෙරට දේශපාලුවන් හැමදාම දියත් කළ උපක්‍රමයකි. මහින්ද ලොකු බබා වාසු පොඩි බබා රැවටුවාට රටේ ජනයා නම් රැවටිය නොහැක.

මොවුන් මේ සෙල්ලම් කරන්නේ රටේ සිසු පරපුරේ ජීවිත සමඟ පමණක් නොව රටේ ජනයාගේද ජීවිත සමඟිනි. කොළ නිල් බබාලා හැමදාම කළේද එයමය. වරප්‍රසාද ලත් අතළොස්සක් වෙනුවෙන් මුළු රටම ඔවුන් බිලිදීමට සැදී පැහැදී සිටින මේ දෙවර්ගයේ දේශපාලුවන්ට කබරගොයා තලගොයා කිරීමට ගත වෙන්නේ නිමේෂයකි.

කබරගොයා අහිංසක සතෙකි. එහෙත් ඉහත වර්ගයේ දේශපාලුවන් නම් මකරාක්ෂයන් වැනිය. උන් මුළු රටම කාදමීමට පළමුව මේ මකරාක්ෂයන් නිවැරදිව අඳුනාගත යුතුය. ඊළඟ කාර්ය උන් මුළුමණින්ම පළවා හැරීමය. නරා වලක් බවට පත් කර ඇති මේ රට සුද්ද පවිත්‍ර කර හැක්කේ එවිටය.

# වැඩකරන කත සහ ලොලිපොප් කත

අප වෙසෙන ලෝකයේ නානාප්‍රකාර සැමරුම් දින තිබේ. ඒ අනුව මාර්තු 08 වන දිනට ජාත්‍යන්තර කාන්තා දිනය යෙදේ. එදාට ලංකාවේ එන්ජීඕ සංවිධානවල ඉන්නා සමහර මධ්‍යම පාංතික නෝනලා ලිප්ටන් වටරවුමට රැස්වී ලොලිපොප් කකා සුපුරුදු පරිදි කාන්තා අයිතීන් වෙනුවෙන් මොරදෙනු ඇත. කාන්තාව පුරුෂාධිපත්‍යයෙන් බේරා ගැනීම ඔවුන්ගේ මූලික තේමාවයි. 'සාදය' මාර්තු 08 දිනෙන් අවසන් වේ. මේ කිසිවෙකුත් ජාත්‍යන්තර කාන්තා දිනය බිහිවූයේ ඇයිද යන්න හෝ එහි සැබෑ අරුත දන්නේදැයි අපි නොදන්නෙමු.

කාන්තා විමුක්තියේ මූලික කොන්දේසිය කාන්තාව ගෘහස්ත වහල්භාවයෙන් මුදාගැනීම බව වරක් එංගල්ස් පැවසීය. එසේ කිරීමට නම් මේ පෞද්ගලික දේපොළ සහිත සමාජ ක්‍රමය වෙනස් කළ යුතු බවද ඔහු අවධාරණය කළේය. එය අහෝසි කළ යුතුය. එය කළ යුත්තේ නිර්ධන පංතියේ නායකත්වයෙනි. එය පංති සටන හා බැඳී පවතින්නකි. එම සටනින් වියුක්ත කර කාන්තාවට වෙනම විමුක්තිය ලබා දීමට කතාකිරීම තනිකරම විහිළුවකි.

ලෝකයේ අඩක් පමණ වන කාන්තාවන් සංවිධාන නොකර කළ හැකි සමාජවාදී විප්ලවයක් නැති බව වරක් විජේවීර සහෝදරයා පෙන්වා දුන්නේය. කිසිම ධනවාදී රාජ්‍යයක, ඉතාමත් නිදහස් සමූහාණ්ඩුවේ පවා කාන්තාවන් පූර්ණ සමානත්වය භුක්ති විඳින්නේ නැතැයි ලෙනින් අවධාරණය කළේය.

කාන්තාවන්ගේ විමුක්තිය සමාජවාදය සඳහා කම්කරුවන් ගෙනයන මුළු මහත් අරගලය හා සමග අඛණ්ඩ ලෙස බැඳී ඇති බවද ඔහු පෙන්වා දුන්නේය. කන්තාවන් හා පුරුෂයන් අතර අයිතිවාසිකම්වල පූර්ණ සමානත්වය ඇතිකළ හැක්කේ එම අරගලය මගින් පමණමය. කාන්තා අයිතිවාසිකම් අහිමි කිරීම හා ලිංගික සූරාකෑම ලෝකයේ මුල්වරට අහෝසි කළේ රුසියානු සමාජවාදී විප්ලවයෙනි. තතු එසේ හෙයින් හැම වසරකම කාන්තා දිනය වෙනුවෙන් විවිධ සංවිධාන විසින් පවත්වන විසූක සංදර්ශනවලින් කාන්තා විමුක්තිය ලබාදිය නොහැක. එය ඩොලර් මලු ඩැහැගන්නා බඩ වඩා ගැනීමේ ව්‍යාපාරවලින් ගලවාගත යුතුය. නිර්ධන පංතියේ නායකත්වයෙන් කාන්තාවන්ද සංවිධානය කර සමස්ත සමාජ වෙනසක් වෙනුවෙන් සටන් වැදීමකින් තොරව කාන්තා විමුක්තිය ගැන කතා කිරීම සිහිනයක්ම පමණි.



## ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය...

05 පිටුවෙන්

එයට කිසියම් කාලයක් ගතවන්නේ නම් එතෙක් පුංචි ඡන්දය ප්‍රමාද කළ යුතු නැති නිසා හැකි ඉක්මනින් එය පැවැත්විය යුතුය. ඒ සඳහා මේ වරට පමණක් පැවති පැරණි ඡන්ද ක්‍රමය භාවිත කළ හැක. එය එසේ නොකොට තාක්ෂණික ප්‍රශ්න පෙන්වමින් ඡන්දය කල්දැමීමේ ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍රවිරෝධී උත්සාහයත් විකෘති සහගත ඡන්ද ක්‍රමයෙන් වහාම ඡන්දය පවත්වන ලෙස ඉල්ලන දේශපාලන තක්කඩින්ගේ හා මුදල් ගැන පමණක් සිතන ඊනියා මැතිවරණ නිරීක්ෂකයන්ගේ උත්සාහයත් පරාජය කළ යුතුය. ප්‍රජතන්ත්‍රවාදය සැබෑ ලෙසම තහවුරු කිරීම සඳහා වහාම පුංචි ඡන්දය පවත්වන ලෙසත් ඒ සඳහා නිවැරදි හා ප්‍රජාතන්ත්‍රවාදයට පටහැණි නොවන ඡන්ද ක්‍රමයක් අනුගමනය කරන ලෙසත් ආණ්ඩුවට බලකළ යුතුය. ප්‍රජාතන්ත්‍රවාදය සැබැවින්ම රැකෙන්නේ එවිටය. අප සටන් වැදිය යුත්තේ ඒ සඳහාය.

13 පිටුවෙන්

## පොලිස් නිලධාරීන්...



ඒ පරිගණක පද්ධතියේ දුර්වලතා මඟ හරවන්න, වැරැදි, වංචා, අක්‍රමිකතා වළක්වන්න, වැරැදි අනාවරණ කරගන්න පුළුවන් විධියට ඒ තාක්ෂණය පාවිච්චි කරගන්නේ නැහැ. තවමත් අර පරණ ක්‍රමයට යන්න තමයි කැමැති. මෙතරම් මුදලක් වෙන් කර තිබෙද්දීත් පැරැණි ක්‍රමයටම යන්න තමයි වැඩිපුර කැමැත්ත තිබෙන්නේ.

සුදුසුකම් නැති ඇස් පෙනෙන්නේ නැති, කන් ඇසීමේ දුර්වලතාවක් තිබෙන, ස්නායු පද්ධතියේ දුර්වලකමක් තිබෙන කෙනෙක් පගාවක් දීලා රියැදුරු බලපත්‍රයක් අරගෙන වාහනයක් පාරේ ධාවනය කරවන කොට ඔහු අතින් සිද්ධ වන මරණයට වග කියන්නේ කවුද? මම කලින් සඳහන් කළා, වාහන අනතුරුවලට හේතු වන රියැදුරන් 1/4කට රියැදුරු බලපත්‍ර නැහැ කියලා. බලපත්‍ර තිබෙන අයටත් ඒ රියැදුරු බලපත් නිකුත් කිරීමේදී සිදු වූ බරපතළ අක්‍රමිකතා තිබෙනවා. එහෙම කෙනෙකුට ලයිසන් එක දුන්නාට පසුව මොකද වෙන්නේ? රජයේ ආයතනයකින් රියැදුරු බලපත්‍රයක් නිකුත් කරනවාය කියන්නේ. වගකීමක්. එය නිකම්ම නිකම් කාඩ් එකක් දෙන එකක් නොවෙයි. එය, ජීවිත රාශියක් පිළිබඳ වගකීමක්. ඒ වගකීම ගන්නේ කවුද? නුසුදුස්සන්ට රියැදුරු බලපත්‍ර ලබා දුන් තැනට දඬුවම් කරන්නේ නැතිව, එතැනට විනය ක්‍රියා මාර්ග ගන්නේ නැතව කොහොමද එතැන නිවැරැදි කරන්නේ?

තවත් කාරණයක් කෙරෙහි මා මේ වෙලාවේ අවධානය යොමු කරන්න කැමැතියි. අපේ රටේ විශාල ජාවාරමක් තිබෙනවා වාහන අමතර කොටස් ගෙන්වීම, වාහන එකලස් කිරීම සම්බන්ධයෙන්. ඒක දේශපාලන රැකවරණ සහිතව සිදු වූ ජාවාරමක්, එහෙම වාහන කොටස් ආනයනය කරන සමාගමක් තමයි 'වෙහිකල් ලංකා පුද්ගලික සමාගම'. එම සමාගම විසින් රජයට බදු ගෙවන්නේ නැතිව ගෙන්වන ලද වාහන අමතර කොටස් කන්ටේනර් අටක් රේගුවේ තිබුණා. අභියාචනාධිකරණයත්, ශ්‍රේෂ්ඨාධිකරණයත් පැහැදිලි තීන්දු ලබා දීලා තිබෙනවා. බදු ගෙවීමකින් තොරව වාහන කොටස් එකලස් කරන්න, ආනයනය කරන්න ඔහුට අයිතියක් නැහැ කියලා. එසේ තිබියදී 2017 ජනවාරි මාසයේ 24 වනදා මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට ලිපියකින් දැනුම් දී තිබෙනවා. ඒ කන්ටේනර් අට නිදහස් කරන්න කියලා. මෙහෙම අධිකරණ තීන්දු අරථ නිරූපණය කර ගන්න මුදල් අමාත්‍යාංශයට හෝ ආණ්ඩුවට තිබෙන අයිතිය මොකක්ද කියලායි මම අහන්නේ.

පසුගිය අවුරුදු දෙක ඇතුළතදී මුදල් අමාත්‍යාංශය සම්බන්ධ වෙලා සිදු වුණු පළමුවන මගඩිය මෙය නොවෙයි. ප්‍රාඩෝ රථ ගෙන්වනකොට සිදු වුණු වංචා ගැන අපි මේ පාර්ලිමේන්තුවේදී හෙළිදරව් කළා. වංචාව, දූෂණය නැති කරනවා කියලා, ඒ වෙනුවෙන් ලක්ෂ හැටදෙකක ජනවරමක් අරගෙන පත් වුණු ජනාධිපතිවරයා තමන් මූලිකත්වය ගන්නා කැබිනට් මණ්ඩලය හරහා මේ තීන්දු තීරණ ගන්නකොට ඒවාට එරෙහිව ගත් ක්‍රියාමාර්ගය මොකක්ද කියලායි අපි අහන්නේ.

## රාජ්‍ය සම්පත්...



ගැඹුර අතින් හොඳම තැන අපට. මොකක්ද, තිබෙන සාධාරණත්වය? රාජ්‍ය සම්පත් කියන්නේ ආණ්ඩුවේ සම්පත් නොවෙයි. රාජ්‍ය සම්පත් කියන්නේ යුඇන්පී එකේ සම්පත් නොවෙයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සම්පත් නොවෙයි. රාජ්‍ය සම්පත්. රජය; රජය. මේ සභා ගරභයේ මැද තිබෙන සීමාව නැතුව, මේ මැද තිබෙන තීරුව නැතුව හිතන්න.

99 අවුරුද්දකින් පසුව, 39 අවුරුද්දකින් පසුව නැවත මිනිරන් පතල ගන්න පුළුවන් කියා ඔබතුමන්ලා හිතනවා නම්, එය ගන්න බැහැ. පුල්මුඩේ ඛනිජ වැලි නිධියේ අපට මහන්සි වෙලා කරන්න මහා දෙයක් නැහැ. අපි ගියාම එතැන වැඩ කරන සේවකයෝ කිව්වා, "මන්ත්‍රීතුමනි, උදේට සූරා ගත්තාම, හවසට පිරෙනවා" කියා. උදේට සූරා ගත්තාම, ස්වාභාවිකව හවසට පිරෙනවා. හැබැයි ඕස්ට්‍රේලියාවේ ඛනිජ සම්පත් ගන්නකොට, ඒ ගොල්ලන් කිලෝමීටර ගණන් කැණීම් කරන්න ඕනෑ. අපිට කැණීම් කරන්න දෙයක් නැහැ. ඔබතුමා විශ්වාස කරන්න. ණය ගෙවන්න ඕනෑ නම් අන්න, ඉවත් කරන වැලි මෙට්‍රික් ටොන් මිලියන දහයක් තිබෙනවා. සෝදා, ඔක්කෝම කරලා ඉවත් කරන වැලි මෙට්‍රික් ටොන් මිලියන දහයක් තිබෙනවා. ඒවායෙත් සියයට දහයක් ඛනිජ වැලි තිබෙනවා. සියයට දහය කියන්නේ ඛනිජ වැලි සෝදා ඉවත් කරන ටික. හැබැයි, ඒක තමයි ඕස්ට්‍රේලියාවේ මුළු නිෂ්පාදනය. ඕස්ට්‍රේලියාවේ මුළු නිෂ්පාදනය අපේ ඉවත් කරන වැලි ටිකේ තිබෙනවා.

ඒක නිසා අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටින්නේ, මේ ආකාරයට රාජ්‍ය සම්පත් පරම්පරා ගණනක අයිතිය විකිණීම නතර කරන්න කියලා. මීට කලින් ඉතිහාසයේත් කිව්වා. ඔබසතුකරණය. ජනතාකරණය. ප්‍රතිව්‍යුහගතකරණය. සේවක සහභාගිත්වය. කොටස් හිමිකාරිත්වය කියලා. මේ ඔක්කෝම කිව්වත් අවසානයේ වෙලා තිබෙන්නේ ඒ ගත්ත අය හප කරලා අතහැරලා යාම. වෙන මොනවත් නොවෙයි. මෙන්න මේ තත්වය තමයි අද ඇති වෙලා තිබෙන්නේ, මෙය වෙනස් කරන්න වැඩපිළිවෙළක් අවශ්‍යයි කියන එක අවධාරණය කරනවා.

## යහපත් සමාජයක් වෙනුවෙන්...

03 පිටුවෙන්

විදිහට කටයුතු කරන්නේ කොහොමද කියන ප්‍රශ්නය තියෙනවා.

මේ ගැටලු තියෙද්දි කටයුතු කරන්න ගියාම තහවුරු වන දේ තමයි කාන්තාව මේ දේ හරියට කළේ නැහැ කියන එක. ඇයට තියෙන දුෂ්කරතා නිසා කරන්න බැරිවුණු එකටත් වැඩිය ඇයට මෙය කරන්න බැරිවුණයි කියන මතය සමාජය තුළ තහවුරු වෙනවා. ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකෙන්ම තමන්ගේ අපේක්ෂකත්වය දෙන්නේ සල්ලි තියෙන, දේශපාලන පවුලකින් එනවානම් පමණයි; මේ වගේ අමතර සුදුසුකම් තියෙන අයට පමණයි. එහෙම නැත්නම් තමන්ගේ පාට, එහෙම නැත්නම් තමන්ගේ මොනවා හෝ දෙයක් ප්‍රදර්ශනය කරලා, විකුණලා, ඡන්දය ගන්න පුළුවන්නම් විතරයි ඔවුන්ට අවස්ථාව ලබා දෙන්නේ. මේ තත්වය තුළ අපි හිතන්නේ නැහැ කාන්තා නියෝජනය 25%ක් දක්වා වැඩි වෙයි කියල. අවම වශයෙන් කාන්තාවන් දේශපාලනයට ඒමේ හා ඔවුන්ගේ ක්‍රියාකාරිත්වයේ ගුණාත්මක වර්ධනයක් බලාගන්න පුළුවන් වේවි කියලා හිතන්න අමාරුයි.

***නියමුවා:-** ලංකාවට වැඩිම විදේශ විනිමයක් උපයා දෙන්නේ විදේශ ගත ශ්‍රමිකයින් විසිනුයි. එයින් වැඩි ප්‍රමාණය ගෘහ සේවිකාවන්. වැවිලි ක්ෂේත්‍රයේ වැඩිම ආදායම් උපදවන තේ කර්මාන්තයේද ශ්‍රම බලකායේ ප්‍රධාතම කොටස කාන්තාවන්. කර්මාන්ත ක්ෂේත්‍රයේ වැඩිම ආදායම් උපදවන ඇඟළුම් කර්මාන්තයේ වැඩිම පංගුව නිපදවන්නේද කාන්තාවන්. එහෙත් ඔවුන්ගේ ජීවන තත්වයන් තුළ එහි පිළිබිඹුවක් නැහැ. මේ තත්වය ඔබ දකින්නේ කොහොමද?*

***සමන්මලී ගුණසිංහ සහෝදරිය:-*** ඒක ඇත්ත. අපේ රටේ වැඩිම ආදායමක් ලබන ක්ෂේත්‍ර නියෝජනය කරන්නේ කාන්තාවන්. හැබැයි අනික් පැත්තෙන් ගත්තොත් ඔවුන්ගේ ජීවිතවල මේ ආර්ථිකයට දායක වුණා කියලා පෙනෙන්නෙ නැහැ. ඔවුන්ගේ ජීවිතවලට හැරී බැලුවොත් එහෙම ප්‍රශ්න කිහිපයක් තියෙනවා. පළවෙනි එක තමයි අපේ ආර්ථික ක්‍රියාවලිය තුළ කාන්තාවෝ ප්‍රමාණාත්මකව ඉන්නේ ජනගහනයෙන් පිරිමින්ට සාපේක්ෂව 36%යි. එතකොට වැඩි ප්‍රමාණයක් ඉන්නේ කාන්තාවෝ නෙමෙයි; පිරිමි. නමුත් ඒ 36% තුළ තමා ආර්ථිකය තුළ නියෝජනය වෙන කාන්තාවන් විදිහට විදේශගත කාන්තාවන්, වැවිලි ක්ෂේත්‍රයේ කාන්තාවන්, ඇඟලුම් ක්ෂේත්‍රයේ නියුතු හා වෙනත් සේවාවන්වල නියුතු කාන්තාවන් සියලු දෙනා ඉන්නේ. අපේ රටේ තියෙන ආර්ථික ප්‍රතිපත්තිය නිසා, විදේශගත වෙන කාන්තාවන් ගෘහ සේවිකාවන් විදිහට තමයි යොදවන්නේ. ඔවුන්ට පුහුණු ශ්‍රමයක් නැහැ. අඩු වැටුපට තමයි විදේශගත වෙන්නේ. ඒනිසාම ඔවුන්ට ලැබෙන්නේ අඩු මුදලක්. ඒ වගේම වැවිලි ක්ෂේත්‍රය තුළ ඔවුන්ට සාධාරණ මුදලක් ලැබෙන්නේ නැහැ. ඒ වගේම ඇඟලුම් ක්ෂේත්‍රය තුළත් ඔවුන්ගේ තරුණ කාලය ඉතාමත් කටුක අන්දමින් ගෙවා දමනවා. ඔවුන්ට තමන්ගේ ශ්‍රමයට සාධාරණ වැටුපක් ලැබෙන්නේ නැහැ.

ඒ නිසා ආර්ථික අතින් ඉතාමත් අමාරුකම් තියෙන, ආර්ථික ක්‍රියාවලියට දායක වන, කාන්තාවන්ට තමන්ගේ ශ්‍රමයට සාධාරණ මුදලක් ලැබෙන්නේ නැතිකම, ඔවුන්ගේ නුපුහුණුකම, නිසාම හොඳ වැටුපක්, හොඳ ආදායමක්, හොඳ පරිසරයක් ලැබෙන්නේ නැහැ. ඒකට මූලිකවම වගකිව යුත්තේ ආණ්ඩුව.



ඒ මොකද ඒ විදේශ රටවල් සමග ගිවිසුම් ඇතිකර ගැනීම, ඇඟලුම් ක්ෂේත්‍රයේ ඉන්න අයට සාධාරණ වැටුපක්, වැවිලි ක්ෂේත්‍රයේ ඉන්න අයට සාධාරණ වැටුපක් ලබාදීමේ වගකීම පවතින ආණ්ඩුවලට තියෙනවා. කාන්තාවන් විසින් උපදවන ආදායමින් වැඩිකොටසක් ශ්‍රම සූරාකෑම මගින් විදේශවලට යනවා මිසක් ඔවුන්ට අයිති වෙන්නේ නැහැ. ඒ නිසා ඔවුන් ඩොලර් ගෙනෙන අය වුණත් ඔවුන්ගේ ජීවිත හැමදාමත් ගතවෙන්නෙ ලයින් කාමරවල, පොල් අතු පැලේ. නැත්නම් ආර්ථික ප්‍රශ්න රාශියකට මැදිවුණු පිරිසක් ලෙස. මේ ක්‍රමය වෙනස් කරනකම් ඔවුන්ට ඒකෙන් ගොඩ ඒමක් නැහැ.

***නියමුවා:-** තමන් පීඩාවට පත්කරන සමාජ ආර්ථික දේශපාලන සංස්කෘතික කොන්දේසිවලට එරෙහිව ලාංකේය කාන්තාව බලමුළු ගැන්වීම සඳහා සමාජවාදී කාන්තා සංගමය ලෙස කරනු ලබන මැදිහත්වීම කවරාකාරද?*

***සමන්මලී ගුණසිංහ සහෝදරිය:-*** සමාජවාදී කාන්තා සංගමය විදිහට අපි දිස්ත්‍රික් මට්ටමින් සෑම දිස්ත්‍රික්කයකම අපේ සහෝදරියන් විවිධ වැඩසටහන් මගින් දැනුවත් කරගෙන යනවා. ඒවා අධ්‍යාපනික එහෙම නැත්නම් විවිධ මාතෘකා සම්බන්ධ සංස්කෘතික වැඩසටහන්, ඒවගේම ආකල්පමය වෙනසක් ඇතිකිරීමට අවශ්‍ය වැඩසටහන්. ඊට අමතරව අපි කාන්තාවන්ට සිද්ධ වෙන අසාධාරණකම්වලදී, මෙන්ම ඔවුන්ගේ අයිතීන් සුරක්ෂිත විය යුතු තැන්වලවලදී ඉතාමත් ප්‍රබල සංවිධානයක් විදිහට සමාජවාදී කාන්තා සංවිධානය වෙනත් කාන්තා සංවිධානත් සමග එකතුවෙලා හඬ නඟනවා. බඩු මිල වැඩිකිරීමේදී, විදුලි බිල වැඩිකිරීමේදී, එහෙම නැත්නම් වැට් එකේදි, එහෙම නැත්නම් කාන්තාවන්ට සිදුවෙන අසාධාරණකම්වලදී හැමවිටම කාන්තා සංගමයක් විදිහට කාන්තාවන්ගේ අයිතීන් වෙනුවෙන් උද්ඝෝෂණය කරන, පෙළ ගැහෙන සංවිධානයක් විදිහට ඉන්නවා.

ඒ වගේම රටේ පොදු ප්‍රශ්නවලදී, කාන්තාවොත් එක්ක එකතු වෙලා ආණ්ඩුවට බලපෑම් කරන සංවිධානයක් විදිහටත් පොදුවේ සියලු අරගලවලදීත් ඉස්සරහින්ම ඉන්නවා. ඒ නිසා රටේ ඉන්න හැකියාව තියෙන කාන්තාවන් විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන කාන්තාවන්, වතුකරයෙන් ඉන්න කාන්තාවන්, ඇඟලුම් ක්ෂේත්‍රයේ ඉන්න කාන්තාවන් අපේ රටේ විවිධ විදිහට අසාධාරණය ලක්වෙන කාන්තාවන්, මේ සියලුම ක්ෂේත්‍රවල ඉන්න කාන්තාවන් සහ අනෙක් සංවිධානත් එක්ක එකතු වෙලා වැඩසටහන්, බලපෑම් කිරීම වගේම අයිතීන් දිනාගැනීම වෙනුවෙන් කළ යුතු දේ නිරන්තරයෙන් කරමින් ඉන්නවා.

## කෝප් හෙළිදරව්ව...

09 පිටුවෙන්

රුපියල් මිලියන 73කි. එසේම මැතිවරණ ප්‍රසාද දීමනා මිලියන 20ක් වියදම් කර ඇත.

### වරාය වැයබර

ශ්‍රී ලංකා වරාය විකිණීම පිළිබඳව සාකච්ඡාව මෑත කාලීන මහත් ආන්දෝලනයට ලක්වූ මාතෘකාවකි. එක් පැත්තකින් හම්බන්තොට චීනයට විකිණීමය. අනෙක් අතට කොළඹ නැගෙනහිර ජැටිය රජයේ අඩු අයිතියට වෙනත් රටකට පැවරීමය. ත්‍රිකුණාමලේ වරාය, තෙල් ටැංකි සමග ඉන්දියාවට පැවරීමටද සාකච්ඡාවක් පවතී.

කොළඹ වරායේ නැගෙනහිර ජැටිය ඉදිකිරීමට රජය දරන ලද වියදම රුපියල් මිලියන 10,800කි. නමුත් එවැනි විශාල වියදමක් දරා රජයේ පංගුව ලෙස 15%ක් සහිතව 85%ක අයිතිය බාහිර පාර්ශවයකට විකිණීමට වර්තමාන යහපාලන හවුලද ක්‍රියාකරමින් සිටී. කෝප් වාර්තාවේ හඳුනාගැනීම අනුව, 2015 වසරේ හම්බන්තොට වරායේ පාඩුව රුපියල් මිලියන 37,186කි. එසේම දැනට කිසිදු ප්‍රයෝජනයක් නොගන්නා ඔලුවිල් වරාය ඉදිකිරීමට ඩොලර් මිලියන 46ක් සහ රුපියල් මිලියන 531ක් රජය වියදම් දරා ඇත. කෙසේ වුවද කිසිදු ශක්‍යතා අධ්‍යනයකින් තොරව ඉදිකල ඔලුවිල් වරාය අද වනවිට සුදු අලියකු බවට පත්ව තිබෙන්නකි. කෝප් වාර්තාවේ අනාවරණයට අනුව ශ්‍රී ලංකා වරායන්ගේ පාඩුව පමණක් 2014/2015 වසරවල රුපියල් මිලියන 48,523ක් (රුපියල් කෝටි 4852) කි.

මීට අමතරව, රූපවාහිනී සංස්ථාව මහින්ද රාජපක්ෂගේ ජනාධිපතිවරණ ප්‍රචාරයන්ට පමණක් අයකර නොගෙන දරා ඇති ප්‍රචාරණ වියදම් රුපියල් මිලියන 30කි. රූපවාහිනී සංස්ථාවේ අලාභයන් රුපියල් මිලියන 355කි. ජාතික ලොතරැයි මණ්ඩලයද එවැනිම ජනාධිපතිවරණ ප්‍රචාරක වියදම් දරා ට්‍රක්රථ සැරසිලි කිරීමට සහ ප්‍රචාරක පුවරුවලට දරන ලද වියදම රුපියල් මිලියන 147කි. ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයද රුපියල්වලින් නොව ඩොලර්, යුරෝවලින් මුදල් නාස්තිකළ අක්‍රමිකතා බහුල ආයතනයක් ලෙස හඳුනාගනු ලැබ ඇත.

ඉහතින් දක්වන ලද්දේ පසුගියදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද කෝප් වාර්තාවේ අඩංගු විශාල කරුණු ප්‍රමාණයකින් සාරාංශයකි. මේ 2011 සිට 2015 දක්වා වසර 04ක පමණ කාලයකදී රාජපක්ෂ පාලනය රාජ්‍ය ආයතනවල සිදුකළ විනාශයන්ගෙන් බිඳක් පමණි. නමුත්, ප්‍රශ්නය වන්නේ, වර්තමාන "යහපාලන" ප්‍රෝඩාව විසින්ද මේ නාස්තිකාර වියදම හා මූල්‍ය අක්‍රමිකතා එලෙසම පවත්වාගෙන යනු ලැබීමත් අතීතයේ රාජපක්ෂවරුන්ගේ ඉතිහාසය විසින් සිදු කරනු ලබන පාඩු, අලාභයන් පිළිබඳව කිසිදු පියවරක් නොගෙන යටපත් කිරීම සිදුකිරීමත්ය.

රනිල්-මෛත්‍රී පාලනය රට ණය බව පවසමින් රාජ්‍ය සම්පත් විකිණීමේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන ඇත්තේ මෙවැනි නාස්තිකාර පාලනයක් ද නඩත්තු කරමින් බවත්, එම සමස්ත බර දැරිය යුතුව ඇත්තේ සියලු පීඩනයන් කරපිට පටවා ඇති ජනතාවම බවත් තේරුම් ගත යුත්තේද ජනතාවයි.

**පාඩු ලැයිස්තුවක්**
2011 - 2015 (වසර 4ක් තුළ)

| | රුः කෝටි |
|---|---|
| මාර්ග සංවර්ධන අධිකාරිය | 5763 |
| (මඟ නැගුම ව්‍යාපෘති මගින්) | |
| සූරියවැව ක්‍රීඩාංගණයේ වියදම | 540 |
| වරාය - නැගෙනහිර ජැටිය වියදම | 1080 |
| 2015 - හම්බන්තොට වරාය පාඩුව | 3718 |
| රූපවාහිනී සංස්ථාව | 35.5 |
| ජාතික ලොතරැයි මණ්ඩලය | 14.7 |
| රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | 259.4 |
| විදුලි සංදේශ නියාමන කොමිෂම | 140.5 |
| **එකතුව** | 11,551 |

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




වරාය විකිණීමට එරෙහිව කොළඹදී...



සයිටම් උපාධි කඩයට එරෙහිව නීතිය හමුවට...



කුලමල නැති, දැවැදි නැති හෙටක් වෙනුවෙන්...



ධීවර ප්‍රශ්න විමසමින් දෙවිනුවරදී...



ගොවි ජන පීඩාවන්ට එරෙහිව සටන්වැද...



අධ්‍යාපනය විකිණීමට එරෙහිව...

## නව පළාත් පාලන ඡන්ද ක්‍රමය විකෘති පිළිබිඹුවක්

ජ.වි.පෙ. නායක
**අනුර දිසානායක සහෝදරයා**



රාජපක්ෂවරුන්ගේ බල වුවමනාව වෙනුවෙන් බලහත්කාරය භාවිත කරමින් සකස් කළ නව පළාත් පාලන මැතිවරණ ක්‍රමය ජනතා කැමැත්ත නිසි අයුරින් පිළිබිඹු නොකරන්නක් බව ප්‍රකාශ කළ ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා, ලෝකයේ කිසිදු තැනක මෙවැනි විකෘති ඡන්ද ක්‍රමයක් නොමැති බව පෙන්වා දුන්නේය.

ඔහු මෙම අදහස් පළ කළේ, නව පළාත් පාලන මැතිවරණ ක්‍රමය පිළිබඳව ජ.වි.පෙ. ස්ථාවරය පැහැදිලි කිරීම සඳහා පසුගිය 19වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවකදීය.

මෙහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් අනුර දිසානායක සහෝදරයා මෙසේද කීය.

"අපේ රටේ පාර්ලිමේන්තුවට එක් ඡන්ද ක්‍රමයක්ද පළාත් සභාවට තවත් ඡන්ද ක්‍රමයක්ද පළාත් පාලන ආයතනවලට තවත් ඡන්ද ක්‍රමයක්ද වශයෙන් ඡන්ද පැවැත්විය යුතු නැහැ. එය විකාර සහගත දෙයක්. එනිසා මෙම ඡන්ද ක්‍රමයේ විකෘති තත්වය ඡන්ද පැවැත්වීමට බාධාවක් වී තිබෙනවා.

කඩිනමින් පළාත් පාලන මැතිවරණය පැවැත්වීමට නම් මේ අවස්ථාවට පමණක් පැරණි ඡන්ද ක්‍රමය වලංගු වන පරිදි සංශෝධනයක් ගෙන ආ යුතුයි. නැතිනම් මෙම පළාත් පාලන මැතිවරණය කවදා පැවැත්වේදැයි කිසිවෙකුට පැවසිය නොහැකියි. මැතිවරණය ප්‍රමාද කිරීමට ආණ්ඩුවේ වුවමනාවක් තිබෙනවාද නැද්ද යන්න නිශ්චිතව සඳහන් කළ නොහැකි නමුත් මෙම තාක්ෂණික කරුණු බාධාවක් කරගෙන ආණ්ඩුවට මැතිවරණය කල් දැමීමට යොදාගන්න පුළුවන්.

අපේ රටේ ඡන්ද ක්‍රමයේ මුඛ්‍ය පරමාර්ථය ජනතාව විසින් නියෝජිතයින් පත් කිරීමයි. එසේ නම් ජනතාවගේ කැමැත්ත අනුව සාධාරණ පිළිබිඹුවක් සහිතව ජනතා නියෝජිතයින් පළාත් පාලන ආයතන නියෝජනය කළ යුතුයි. ජනතාවගේ කැමැත්ත 40%ක් නම් 40% කට ආසන්න ප්‍රමාණයකට නියෝජිතයින් පත්විය යුතුයි. නමුත් නව ඡන්ද ක්‍රමයකට අනුව මුළු ඡන්ද ප්‍රමාණයෙන් 40%ක් ලබාගෙන ජයගන්නා දේශපාලන පක්ෂයට මන්ත්‍රීධුර 77%ක් හිමිවෙනවා. 60%ක් ඡන්ද ලබාගන්නා පරදින කණ්ඩායමටම හිමි වන්නේ 23%ක මන්ත්‍රී ධුර සංඛ්‍යාවක් පමණයි. එය ප්‍රජාතන්ත්‍රවාදයට පටහැණියි. එය ඡන්ද ක්‍රමයේ විකෘති පිළිබිඹුවක්. එය පක්ෂයක් ලෙස ජනතා විමුක්ති පෙරමුණටත් බලපෑමක් තිබෙනවා. ජනතාවගේ අනුමැතිය නැත්නම් පත්වීම හෝ පත් නොවීම සිදුවිය හැකියි. නමුත් ඡන්ද ක්‍රමයක් මත යම් පක්ෂයක් දේශපාලනයෙන් පළවා හැරීම යුක්තිසහගත තත්වයක් නොවෙයි."

මෙම අවස්ථාව සඳහා ජවිපෙ මධ්‍යම කමිටු සාමාජික, පළාත් සභා මන්ත්‍රී, නීතිඥ සුනිල් වටගල සහෝදරයාද එක්ව සිටියේය.

## රටේ අධ්‍යාපනය දූෂණගස්වන්න අපි ඉඩ දෙන්නේ නැහැ

ජ.වි.පෙ. ජාතික සංවිධායක
**බිමල් රත්නායක සහෝදරයා**

මුදල් තිබෙන සුළු කණ්ඩායමක් සහ දේශපාලනඥයින් කිහිපදෙනෙක් රටේ අධ්‍යාපනය දූෂණ ගැස්වීමට උත්සාහ කරන බවට චෝදනා කළ ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික බිමල් රත්නායක සහෝදරයා එවැන්නක් කිරීම සඳහා ජනතා විමුක්ති පෙරමුණ කිසිසේත් ඉඩ ලබා නොදෙන බවත් ජනතාවගේ දරුවන්ගේ අධ්‍යාපන අයිතිය වෙනුවෙන් අඛණ්ඩව සටන් වදින බවත් අවධාරණය කළේය.

ඔහු මෙම අදහස් පළ කළේ සයිටම් ආයතනය සම්බන්ධ අභියාචනාධිකරණ තීන්දුව පිළිබඳව අදහස් දැක්වීම සඳහා පසුගිය 01වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද ජනමාධ්‍ය හමුවේදීය.

මෙහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ බිමල් රත්නායක සහෝදරයා, මෙසේද පැවසීය.

"රාජපක්ෂ ආණ්ඩුව කාලයේ දේශපාලන බලය පාවිච්චි කරලා ගෙනාපු දූෂිත ආයතනයකට දැන් ලයිසන් එකක් දීලා තියෙනවා. මේක වැරදි තීන්දුවක්. ඒ වැරදි තීන්දුවට වගකිව යුත්තේ මෛත්‍රීපාල ආණ්ඩුවයි. මේ ආණ්ඩුවේ සෞඛ්‍ය ඇමතිවරයාගේ පුතාගේ බිරිඳත් සයිටම් ආයතනයේ ඉගෙන ගන්නවා. ඊ.පී.ඩී.පී. පක්ෂයේත් ජ.වි.පෙ.ත් හැර පාර්ලිමේන්තුවේ ඉන්න අනෙකුත් දේශපාලන පක්ෂවල මන්ත්‍රීවරුන්ගේ දරුවන්, ඥාතීන් සයිටම් එකේ ඉගෙන ගන්නවා. අපිට ඒ සිසුන් සමඟ පෞද්ගලික ප්‍රශ්නයක් නැහැ. මෙතන තිබෙන්නේ අධ්‍යාපන ප්‍රතිපත්ති සම්බන්ධ ප්‍රශ්නයක්. සයිටම් ආයතනය වෙනුවෙන් පාර්ලිමේන්තුවේ විකෘති වාර්තා හදා තිබෙනවා.

සයිටම් ආයතනයේ වෛද්‍ය ශිෂ්‍යාවක් විසින් ගොනු කරන ලද නඩුවකට අදාළව සයිටම් ආයතනයේ සිසුන් වෛද්‍ය වෘත්තිකයින් ලෙස ලියාපදිංචි කරන්න කියලා අභියාචනාධිකරණය විසින් තීන්දුවක් ලබාදී තිබෙනවා. මෙම නඩුවේ තීන්දුව සයිටම් ආයතනයට වාසිදායක වන බව බොහෝ දෙනා දැන හිටියා. මොකද, සෞඛ්‍ය අමාත්‍යාංශයත් හිටියේ සයිටම් එක පැත්තේ. ඒ නිසා මේ නඩු තීන්දුව ගැන පුදුමයක් නැහැ. පැමිණිල්ලත් විත්තියත් එක පැත්තේ හිටපු නඩුවක්.

අපේ රටෙන් සැලකිය යුතු පිරිසක් අධ්‍යාපනය ලබලා පිටරට රැකියාවලට යනවා. ආණ්ඩුව ඔවුන් සමඟ ගිවිසුමකට පැමිණිය යුතුව තිබෙනවා. ලංකාවේ මුදලින් ආධ්‍යපනය ලබලා අඩුම තරමේ වසර 5ක් හෝ රටේ සේවය කළ යුතුයි



කියලා. ඒ වගේම රට අත්හැර යනවිට යම් මුදලක් ආණ්ඩුවට ගෙවිය යුතුයි කියලා නීතියක් හදන්න පුළුවන්. බොහෝ රටවල ඒ දේ කරනවා. අපේ රටේ ආචාර්යවරුන් විදෙස් ගත වෙන එක වළක්වන්න නම් අනිවාර්යයෙන් ඔවුන්ට පඩි වැඩි කළ යුතුව තිබෙනවා. ඔවුන්ගේ වැටුප් අඩු නිසයි සයිටම් වගේ කඩවල් රු. 50,000ක් වැඩිපුර දීලා ආචාර්යවරුන් තමන් ළඟට ගන්නේ. ඒ නිසා අපේ රටේ අධ්‍යාපනය දියුණු එකක් බවට පත්කළ යුතුව තිබෙනවා.

දූෂිත සයිටම් ආයතනය නීත්‍යානුකූල කිරීමේ උත්සාහය පරාජයට පත්කරන්න අපේ ශිෂ්‍යයන්ට, වෛද්‍යවරුන්ට වගේම සියලුම ජනතාවට අපි ආරාධනය කරනවා."

මෙම අවස්ථාව සඳහා සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක රංගන දේවප්‍රිය සහෝදරයාද එක්ව සිටියේය.

## රටම කතා කරන සයිටම් ගැන ආණ්ඩුවේ මුනිවත ඇයි?

ජ.වි.පෙ. නායක
**අනුර දිසානායක සහෝදරයා**



**රටේ ජනාධිපතිවරයාත් අගමැතිවරයාත් සයිටම් ප්‍රශ්නයේදී තමන්ගේ නිශ්චිත අදහස රටට කියනු වෙනුවට හොරගල් අහුලමින් සිටින්නේයැයි ප්‍රකාශ කළ ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා, වෛද්‍ය සභාව, දෙමාපිය සංගම්, වෘත්තීය සමිති, රජයේ වෛද්‍ය නිලධාරීන්, මාධ්‍යවේදීන් ඇතුළු මුළු ජනතාවක් සයිටම් ආයතනයට එරෙහිව කතා කරද්දී අගමැතිවරයාත් ජනාධිපතිවරයාත් මුනිවත රකින බවට චෝදනා කළේය.**

අනුර දිසානායක සහෝදරයා මෙම අදහස් පළ කළේ පසුගිය 08වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවේදීය. වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද කීය.

"කිරිඇල්ලගේ ප්‍රකාශ, තමන්ගේ උත්සාහය ඵල දැරීම නිසා උද්‍යෝගයෙන් කතා කරන එස්.බී.ගේ ප්‍රකාශ, සයිටම් වෙනුවෙන් පෙනී ඉන්න රාජිතගේ ප්‍රකාශ නොව ආණ්ඩුවේ ස්ථාවරය රටට පැහැදිලි කළ යුතුයි.

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය, ශිෂ්‍ය ව්‍යාපාරය, වෘත්තීය සමිති, බහුජන සංවිධාන එක්ව විශාල විරෝධතාවයක් දියත් කරමින් තිබෙනවා. එම අරගලයට අප පක්ෂයක් ලෙස අපගේ අවංක සහයෝගීතාවය පළ කරනවා. සයිටම් විරෝධී අරගලයට අපි හැකි උපරිම ශක්තිය යොදා මැදිහත් වෙනවා. අද අප අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයත් වෛද්‍ය පීඨ ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුවත් සමග සාකච්ඡා කළා. අධ්‍යාපනය පෞද්ගලීකරණයේ සංකේතය බවට පත්වෙලා තිබෙන මෙම සයිටම් ආයතනය අහෝසි කරන තුරු මේ සටනට අපේ ප්‍රබල සහාය ලබාදෙන්න අපි කටයුතු කරනවා. ඒ වගේම අප පක්ෂයට සම්බන්ධ වෘත්තීය සමිති ඉදිරියේදී වෘත්තීය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනවා. අපේ රටේ අධ්‍යාපනයත්, වෛද්‍ය අධ්‍යාපනයත්, සෞඛ්‍යයටත් මේ ආණ්ඩුව සිදුකරන අහිතකර බලපෑම් පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට අපි කටයුතු කරනවා. මේ මාසය පුරා දැවැන්ත විරෝධතා ක්‍රියාමාර්ග ගැනීමට අප කටයුතු කරනවා. අපේ රටේ වෛද්‍ය අධ්‍යාපනය අනතුරේ දමන, නිදහස් අධ්‍යාපනය අහෝසි කිරීමට උත්සාහ කරන මෙම කළු ආයතනය අහෝසි කළ යුතුයි."

**මෙහිදී අදහස් පළ කළ ජ.වි.පෙ. මධ්‍යම කාරක සභික නලින්ද ජයතිස්ස සහෝදරයා මෙසේ පැවසීය.**

"එස්. බී දිසානායක ඇමතිවරයා පෙනී සිටින්නේ සයිටම් ආයතනය වෙනුවෙන්. ඔහු කොතරම් ඒ වෙනුවෙන් පෙනී සිටිනවාද කියතොත් සයිටම් ආයතනයේ අයිතිකරු එස්.බී.ද කියලා අපිට හිතෙනවා. සයිටම් ආයතනයට මිලියන 600ක් ලබාදීමටත් මුල් වුණේ

***02 වැනි පිටුවට***

බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.



ද්විමාසික කලා සංස්කෘතික
සඟරාමය අතිරේකය
සමාජවාදී කලා සංගමයේ ප්‍රකාශනයකි.
නව සංස්කරණය 2017 මාර්තු
07 වන කලාපය

# රළ

# සැබෑ වේදිකාවක අඬහැරය

මේ 2017 මාර්තු මාසයයි. අපට වැදගත් වෙන්නේ ඇයි? ඒ, කලාව සහ සංස්කෘතිය පිළිබඳව සංවාදයක, ප්‍රකාශනයක හෝ විචාරයක යෙදෙන අපට, සමාජ සංවර්ධනයේදී එහි වැදගත්ම ඓතිහාසික පරිවර්තනීය කාර්යභාරය උර මතට ගත් සමාජ ව්‍යාපාරයේ කොටස්කරුවන් බවට පත්වූ අපට වඩාත්ම ජනතාවට සමීප සජීවී කලා මාධ්‍යයක් පිළිබඳව සංවාදය අලුත් කරන දිනයක් මේ මාසයට යෙදෙන නිසාය. එනම් මාර්තු 27 දිනට යෙදෙන ලෝක නාට්‍ය දිනයයි. හුදෙක් අපේ රටේ පාලකයන් විසින් නාට්‍ය මතක සැමරුම් දිනයක් බවට පත්කර ඇති මේ සජීවී කාලා මාධ්‍යය ඉන් ඔබ්බට ගිය වඩා පුළුල් සමාජ කාර්යභාරයක් ඉටුකරන කලා මාධ්‍යයක් බව අපි ඉතා ගැඹුරින් තේරුම්ගෙන සිටිමු.

සමාජ යථාර්ථය මිනිස් මනස උපයෝගී කොට ගෙන කපා කොටා ඔපමට්ටම් කර සෞන්දර්යාත්මකව පරිවර්තනය කිරීම අපි පොදුවේ කලාව ලෙස හඳුනා ගනිමු. එය සඳහා චිත්‍ර ශිල්පියා නම් පින්සලත් වර්ණත් සංයෝගකර ගනී. සාහිත්‍යකරුවා නම් භාෂාවත් වචනත් උපයෝගී කරගනී. සංගීතඥයා නම් ස්වර මාලාවත්, සංගීත භාණ්ඩත් උපයෝගී කර ගනී. නාට්‍ය කරුවාගේ මාධ්‍යය කුමක්ද? ඔහු සිය ශරීරය සහ මනස සිය ප්‍රකාශනය සඳහා සජීවීව උපයෝගී කර ගනී. මෙහි ඇති රමණීයත්වය නම් භාෂාව, සාහිත්‍යය, සංගීතය, නර්තනය, චිත්‍රය ආදී වූ බොහෝ කලා මාධ්‍යන් සුසංයෝග කරන සජීවී ප්‍රකාශනයක් අපට වේදිකාවේදී හමුවීමයි. වර්තමානය වන විට ලොව විශාලතම ප්‍රේක්ෂකාගාරයක් රැස්වෙන්නේ පාපන්දු තරඟයක් නැරඹීමට වුවත් අපේ රටේ නම් විශාල ප්‍රේක්ෂකයින් ප්‍රමාණයක් සහභාගි වන්නේ ක්‍රිකට් තරඟයක් නැරඹීමටය. එහෙත් ඉතිහාසයේ විශේෂයෙන්ම නාට්‍ය කලාවේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන ක්‍රි.පූ. 5, 6 යුගවල ග්‍රීසියේ ඇතැන්ස් නුවර රංග ශාලාවල ප්‍රේක්ෂකයින් 25,000ක් 30,000ක් පමණ නාට්‍ය නරඹා ඇති බව ඉතිහාසයේ සඳහන් වේ. එවැනි ස්වර්ණමය කාල පරිච්ඡේදයක් පිළිබඳව අපට ඉන්පසු අසන්නට ලැබෙන්නේ 1917 රුසියන් විප්ලවයෙන් පසු මේයර් හෝල්ඩ්, අන්තෝනියන් ආටෝ වැනි නාට්‍යකරුවන්ගේ නාට්‍ය විශාල පිට්ටනිවල විශාල ප්‍රේක්ෂකාගාරයක් හමුවේ රඟදක්වා තිබේ.

රංග කලාවේ ඉතිහාසයෙන් හමුවන සාක්ෂිවලට අනුව ග්‍රීසියේ විසූ 'තෙස්පියන්වරු' මුල්ම නාට්‍යකරුවන් ලෙස අප හඳුනා ගනිමු. එතැන් සිට නූතන නාට්‍ය වේදිකාව දක්වා පැමිණි ගමන් මඟ මිනිසා දේශපාලනික සත්වයෙකු ලෙස හැදී වැඩී වර්ධනයවූ ඉතිහාසයට සාපේක්ෂයි. ග්‍රීක, රෝම, මධ්‍ය කාලීන යුරෝපා නාට්‍ය කලාව පිළිබඳවත් පෙරදිග මහා නාට්‍ය සම්ප්‍රදාය ලෙස සැලකෙන සංස්කෘත නාට්‍ය කලාව පිළිබඳව විමසුවත් ඒ පිළිබඳව ඕනෑතරම් සාක්ෂි අපට හමුවේ. නාට්‍ය කලා ඉතිහාසයේ අපට හමුවන අද්භූතවාදය, ස්වභාවිකවාදය, යථාර්ථවාදය, අධියථාර්ථවාදය හෝ විකාර රූපී රංග කලාව ආදී නව නූතන විකල්ප රංග ආකෘතීන් දක්වා අපට නාට්‍යකරුවාගේ දාර්ශනික පසුබිම හා දේශපාලනික පසුබිම කියවා ගත හැකිය. දාර්ශනිකභාවයකින් හෝ සවිඥානික දේශපාලන අවබෝධයකින් තොරව වේදිකා රංගයකට හෝ නාට්‍යකරුවෙකුට පැවැත්මක් නොමැත.

ලාංකේය වේදිකාව සිය ප්‍රකාශන මාධ්‍ය කරගත් නාට්‍යකරුවන් සිය දාර්ශනිකභාවය සහ දේශපාලන සවිඥානිකත්වය පිළිබඳ අවබෝධය පළල් කර ගත යුතු යැයි අපට හැඟේ. සැබෑ වේදිකාවක අඬහැරය සමාජ සංවර්ධනයට නැතහොත් මීට වඩා යහපත්වූ ජීවිතයක් හෝ සමාජ පරිවර්තනයක් වෙනුවෙන් ඉවහල් වීමට නම් මේ දාර්ශනිකභාවය හා දේශපාලනික සවිඥානිකත්වය ගොඩනගා ගත යුතුමය. බ්‍රර්ටෝල් බ්‍රෙෂ්ට් නම් දාර්ශනික සහ දේශපාලනික නාට්‍යකරුවාගේ වැදගත් සටහනකින් ධෛර්ය ගැනීමට මෙවර රළ අතිරේකයෙන් ඔබට ආරාධනා කරමු.

"ඉතාමත්ම නරක නූගත්කම නම් දේශපාලනික නූගත්කමය. ඔහු සමාජයේ කිසිවක් දකින්නේ නැත. ඔහුට සමාජයේ කිසිවක් ඇසෙන්නේ නැත. ඔහු දේශපාලනයට කිසිදු සහභාගිත්වයක් දක්වන්නේද නැත. ජීවන වියදම සහල්, පිටි, ඇඳුම්, ඖෂධ යන සියල්ල මිල තීරණය වන්නේ, දේශපාලනික තීන්දු තීරණ මත බව ඔහුට කිසිදු අදහසක් නැත. එපමණක් ද නොව ඔහු තම දේශපාලනික නූගත්කම පිළිබඳව ආඩම්බරද වේ. තමා දේශපාලනයට වෛර කරනා බව ආඩම්බරයෙන් පවසයි. ගණිකාවන්, සොරුන්, අනාථ දරුවන් මෙන්ම දූෂිතයින් බිහිවීමට තමන් දේශපාලනයට සහභාගි නොවීම හේතුවන බව ඒ මන්ද බුද්ධිකයා නොදනී."



# සිනමාවක් ඇත කර්මාන්තයක් නොමැත

ශ්‍රී ලාංකීය සිංහල සිනමාවේ සිටි ජනප්‍රිය හා දක්ෂ නිළියක වන ස්වර්ණා මල්ලවආරච්චි රඟපෑ චිත්‍රපට කීපයක් තිරගත කළ සිනමා උලෙළක් පසුගිය ජනවාරි 22 සිට 26 දක්වා ජාතික චිත්‍රපට සංස්ථාවේ 'තරංගනී' සිනමා ශාලාවේ දී පැවැත්විණි. නොමිලේ තිරගත කළ මෙම සිනමා පට නැරඹීම සඳහා ප්‍රවේශ පත්‍ර චිත්‍රපට සංස්ථා කාර්යාලයෙන් කලින් ලබා ගත හැකිව තිබිණි. නමුත්, ජනවාරි 20 දින ප්‍රවේශ පත්‍ර වෙන් කර ගැනීමට සංස්ථා කාර්යාලය වෙත ගියද, ප්‍රවේශ පත්‍ර අවසන් වී තිබිණි. කෙසේ වෙතත්, අදාළ දර්ශන වේලාවන් හිදී ප්‍රවේශ පත්‍ර අත ඇතිව සිනමා ශාලාවට ඇතුළු වීමට පිරිසක් සිටි අතර, ඒ පිරිස එක් පෝලිමකද, ඒ තරමටම පිරිසක් ප්‍රවේශ පත්‍ර නොමැතිව තවත් පෝලිමකද පෙළගැසී සිටියහ. ප්‍රවේශ පත්‍ර සහිත පිරිස සිනමා ශාලාවේ ආසන සංඛ්‍යාවෙන් භාගයක්වූ අතර, දර්ශන ආරම්භක වේලාව පැමිණි පසු ප්‍රවේශ පත්‍ර නොමැති අයට ශාලාවට ඇතුළු වීමට සංවිධායකයන් ඉඩ ලබා දුන් අතර, එය ආසන ප්‍රමාණය සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත් විය. එයින් ගම්‍ය වන එක් කාරණයක් වන්නේ කලින් ප්‍රවේශ පත්‍ර රැගෙන ගිය හරි අඩක් වැනි ප්‍රමාණයක් නොමිලේ ලැබුණු ප්‍රවේශ පත්‍ර ළඟ තබාගෙන සිනමා ශාලාවට නොපැමිණි බවයි.

මෙම චිත්‍රපට නැරඹීම සඳහා ශාලාව වෙත පැමිණි පිරිසේ වයස සංයුතිය නිරීක්ෂණය කළ අයකු වේනම්, පැහැදිලිව පෙනෙන එක් කරුණක් වන්නේ තරුණ ගණයට වැටෙන පිරිස සියයට දහයකටත් අඩු බවයි.



1970-80 දශකයන් දෙස අවධානය යොමු කළහොත්, වසරකට චිත්‍රපට 40-50ක් සිනමා ශාලාවලට පැමිණෙන කාලයක් විය. වසරේ සති 52 තුළ සතියකට එක් චිත්‍රපටයක් අලුතෙන් රටේ තිරගත වෙයි. සිකුරාදා යනු අලුතෙන් චිත්‍රපටයක් තිරයට එන දිනයක් විය. චිත්‍රපට කර්මාන්තයේ නියැළෙන නළු නිළියන්, අධ්‍යක්ෂවරුන්, සංගීත ශිල්පීන්, ගායකයන්, වේෂනිරූපණ ශිල්පීන්, කාර්මික ශිල්පීන්. නිෂ්පාදකයන්, ප්‍රචාරක ආයතන, සිනමා ශාලා හිමියන්, සිනමා ශාලා සේවකයන්, ආපන >>ඉතිරිය 03

# සමාජයීය අරුත් දෙන කලාවක් බිහි වූයේ හැත්තෑඑකේ අරගලය නිසා

**මෙවර 'රළ' අතිරේකය සඳහාවූ සම්මුඛ සාකච්ඡාවට තෝරා ගනු ලැබුවේ 1971 අරගලයට සක්‍රීයව දායකත්වය සපයමින්, චිත්‍ර ශිල්පියකු සේම කලාකරුවකුද, මෙරට ප්‍රකට චිත්‍ර කලා උපදේශකයකුද වන චාල්ස් දයානන්ද සහෝදරයායි. චාල්ස් සහෝදරයා පිළිබඳව විමසීමේදී ගිරාගම සෞන්දර්ය අධ්‍යාපන ආයතනයේ හිටපු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (1993-2009), ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ හිටපු සභාපති (2004-2005), නැඟෙනහිර පළාත් සෞන්දර්ය හිටපු අධ්‍යක්ෂ (2008-2010), ලෙසද කටයුතු කළ අතර, වර්තමානයේදී සමස්ත ලංකා චිත්‍ර කලා අධ්‍යාපන වෘත්තිකයන්ගේ සංගමයේ හා සෝලියස් මැන්දිස් චිත්‍ර කලා සංගමයේ සභාපති ලෙස කටයුතු කරයි.**



**රළ: ඔබේ ළමා කාලය හා අධ්‍යාපනය ලැබූ ආකාරය ගැන කිව්වොත්,**

*චාල්ස් දයානන්ද:* මගේ ගම බලංගොඩ. රත්නපුර දිස්ත්‍රික්කයේ. ප්‍රාථමික අධ්‍යාපනය ලැබුවේ බලංගොඩ, බුද්ධ ජයන්ති විදුහලේ. ඊට පස්සේ බලංගොඩ මධ්‍ය මහා විද්‍යාලයට ඇතුළත් වුණා. 1969දී තමයි, උසස් පෙළ සමත්වී 1970දී කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධිය හැදෑරීමට ඇතුළත් වුණේ. මෙය මගේ ජීවිතයේ සුවිශේෂී කඩඉමක් වුණා. එහිදී විශ්වවිද්‍යාල සමකාලීනයකු ලෙස උපතිස්ස ගමනායක සහෝදරයාගේ හමුවීම වගේම ඒ මිතුදමත් සුවිශේෂී වුණා. මගේ තාරුණ්‍යය හා බැඳුණු විශ්වවිද්‍යාල ජීවිතය ඒ මොහොතේ රට තුළ ක්‍රියාත්මකවූ වමේ දේශපාලනය සමඟ බද්ධ වෙනවා. ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලනය මේ මොහොතේ ක්‍රියාත්මකවූ ආකාරය හා දේශපාලන අවබෝධය සමඟ තරුණ ක්‍රියාකාරිකයකු ලෙස එම දේශපාලන ගමන් මඟට පිවිසෙනවා. මේ කාලය ඒ කියන්නේ, හැටේ, හැත්තෑවේ දශක ගත්තහම ලෝක දේශපාලනය තුළද තරුණ හා ශිෂ්‍ය අරගල පැතිරී ගිය ආකාරයක් දැකගන්නට ලැබුණා. ඒ සමඟම සමාජවාදී සෝවියට් සංගමයේ පිබිදීමත්, කියුබන් විප්ලවීය ජයග්‍රහණයේ ආශ්වාදයත් විඳිමින්, වියට්නාමයේ විප්ලවීය ජයගොසද, ඇමෙරිකන් හමුදාවට එරෙහිව වියට්කොං ගරිල්ලන් හා විප්ලවවාදී වියට්නාම් හමුදාව අභීතව සටන් කිරීම හා වියට්නාම් ආක්‍රමණයට එරෙහිව සමස්ත ලෝකය පුරා ඇතිවූ අධිරාජ්‍ය විරෝධී උද්ඝෝෂණ හා අරගල තුළත් මගේ පරම්පරාවේ තරුණ ජීවිත විශාල ප්‍රමාණයක් පිබිදීමකට ලක් වුණා.

**රළ: ඔබ ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන ක්‍රියාධරයකු වීමට බලපෑ හේතු මොනවාද?**

*චාල්ස් දයානන්ද:* මම කලින් කිව්වා වගේ 60, 70 දශකවල ඇතිවූ නව වාමවාදී රැල්ලත්, ජ.වි.පෙ. අධ්‍යාපන සාකච්ඡා පහට (පන්ති පහට) සම්බන්ධ වීමත් සමඟ ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලනය තෝරා ගන්නට මා තීරණය කළා. එවකට විශ්වවිද්‍යාලයේ මාගේ සමකාලීනයන් රැසක් දේශපාලන අවබෝධය උදෙසා පන්ති පහේ සාකච්ඡාවට සම්බන්ධවී පසුව ජ.වි.පෙ. දේශපාලන ක්‍රියාවලියට සක්‍රීයව දායකත්වය ලබා දුන්නා. 1970 රෝහණ විජේවීර සහෝදරයා කොළඹ හයිඩ් පිටියේ පැවැත්වූ ඒ ඓතිහාසික රැලියත්, ඉන්පසුව බිම් මට්ටමේ සිට ඇතිවූ විප්ලවවාදී ප්‍රබෝධයත් මත ජ.වි.පෙ. වටා එකතු නොවූ තරුණයෙක්, තරුණියක් සොයා ගැනීමද එවකට අපහසු කාර්යයක් වුණා. සමහරු සක්‍රීයව ජ.වි.පෙ. දේශපාලනයට සම්බන්ධ නොවුවද, සිතින් පවා සෑම තරුණ හදවතකම අපේක්ෂාව වූයේ සමාජවාදී, විප්ලවවාදී දේශපාලන ක්‍රියාවලියක් තුළින් සමාජ ප්‍රශ්නවලට එරෙහිව නව පාලනයක් බිහි කර ගැනීම යන ප්‍රාර්ථනාවයි. මෙම තත්වයට මෙම යුගයේ පැවැති විශාල ආර්ථික අර්බුදයද බලපෑවා. නිදහස් අධ්‍යාපනය ලබා විශ්වවිද්‍යාලයන්ගෙන් එම දශක පුරාවට අධ්‍යාපනය ලැබූ විශාල පිරිසක් රැකියා නොමැතිව දැඩි පීඩනයකට මුහුණදී සිටියා. ඒ වාගේම තමයි, සමාජයේ තරුණ කොටස් සම්බන්ධව දැක්වූ ආකල්පමය පසුගාමීත්වයද විශාල ගැටලුකාරී තත්ත්වයක් නිර්මාණය කළා. මෙම තත්ත්වයන් මත රෝහණ විජේවීර සහෝදරයාගේ දේශපාලන භාවිතාව රට තුළ දැඩි ආකර්ෂණීයතම තත්ත්වයක් ලෙස නිර්මාණය වෙන්න පටන් ගත්තා. සමහර ගම්වල සිටින අවුරුදු 16ත් 30ත් අතර සියලුම තරුණ කොටස් අධ්‍යාපන පන්ති සාකච්ඡාවලට සම්බන්ධවූ බවට තොරතුරු දැනගන්නට ලැබුණා. මේ තුළ පෙනී ගියේ ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලනයට සමාජයේ තිබූ ආකර්ෂණීය තත්වයයි.

1971 අප්‍රේල් අරගලයේ සක්‍රීය දායකත්වයෙන් පසුව 1971 ජුලි 01 වැනි දින මා අත්අඩංගුවට පත් වුණා. 1977 රෝහණ විජේවීර සහෝදරයා නිදහස් වන තුරු මාද බන්ධනාගාරගතව සිටියා.

**ජාතිවාදය, ආගම්වාදය, මිථ්‍යා මත පසුපස හඹා යාම, මුදල් කේන්ද්‍රවූ ආර්ථිකවාදයකට තල්ලු වීම ආදී කරුණු රාශියක් තුළ සමාජය දැවැන්ත පරිහානියකට යනු ලැබුවා. මෙය වෙනස් කරන්නට නම්, රටේ සියලුම ජනතාව නිවැරදි අවබෝධයකට පැමිණිය යුතුයි. එම අවබෝධය ඇති කිරීමට කලාකරුවාට හා කලා නිර්මාණයන්ට හැකියාව තියෙනවා.**

**රළ: බන්ධනාගාර ජීවිතය ඔබට බලපෑ ආකාරය හා එම අත්දැකීම විස්තර කළොත්,**

*චාල්ස් දයානන්ද:* වසර හතරක් රිමාන්ඩ් ගතව සිටියා. තවත් වසර තුනක කාලයක් සිරදඬුවම්වලට යටත් වෙලා හිටියා. එහිදී මුලින්ම රිමාන්ඩ්ගත කළේ සී.ආර්.පී. (C.R.P.) කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයටයි. එහි වසරක කාලයක් සිටියා. එහි සියලුම දේශපාලන සිරකරුවන් පමණක් රඳවා සිටියා. මෙය හැබෑවටම දුෂ්කර කාලයක් වුණා. දෙසියයක් පමණ ඉන්න පුළුවන් සිරමැදිරිවල හත්සියයක් පමණ ගාල් කරනු ලැබුවා. මාස තුනකින් පමණ ස්නානයට හැකියාවක් නොතිබුණු අතර, වැසිකිළි, කැසිකිළි පහසුකම්ද ඉතා අවම මට්ටමකයි පවත්වාගෙන ගියේ. සිරගෙ දරදී බෝ වන රෝග හා වෙනත් රෝග හේතුවෙන් සිරකරුවන් මිය ගිය අතර, සමහර දිනවලදී නිඳ ගැනීමටද ඉඩක් නැති වුණා.

මේ තත්වයන් තුළ කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයේ සිරකරුවන්ගේ කැරැල්ලක් ඇති වුණා. හරියටම දින තුනක්



හිරගෙදර පාලනය අතට ගත්තා. සියලුම අංශ බෙදලා පාලනය ගෙන ගියා. පස්සේ හමුදා නිලධාරීන් පැමිණ අපේ ප්‍රශ්න සාකච්ඡා කරලා පසුව සමස්ත සිරගෙදර පුරා අභ්‍යන්තර පාලනය සිරකරුවන්ටද, හමුදාව සිරමැදිරියෙන් පිට සිට එය ආරක්ෂා කිරීමද සිදු කළා. මෙහිදී සිරමැදිරි තුළ සියලුම දොරවල් විවෘතව තැබූ අතර, දේශපාලන සිරකරුවන්ව සිටි අප සියලුම දෙනාට පුවත්පත්, වෙනත් පොත්පත් වැනි දෑ ලබා දීමට ඔවුන් කටයුතු කිරීම නිසා අපේ දේශපාලන සාකච්ඡා සහ වෙනත් අධ්‍යාපන වැඩ එම තත්වය මත නැවත ඇරඹුවා.

**රළ: සිරගතව සිටියදී අධ්‍යාපන වැඩ ගෙන ගියේ කොහොමද?**

*චාල්ස් දයානන්ද:* මේ කාලයේ සිරගතවී සිටි විශ්වවිද්‍යාල සිසුන් තම දැනුම අනෙකුත් තම සහෝදර දේශපාලන සිරකරුවන්ට බෙදා දුන්නා. ඉංග්‍රීසි භාෂාව, වෙනත් විදේශ භාෂා පිළිබඳවද අධ්‍යාපනය ලැබුවා. ඒ වාගේම හිරගෙදර බිත්තිවල සිරකරුවන් විවිධ සායම් වර්ග ගෙන චිත්‍ර, මූර්ති වැනි දේද, සෑම බිත්තියකම කවි හා සටන් පාඨද දෘශ්‍ය රූපද නිර්මාණය කළා. මේ නිසා හිරගෙදර විශ්වවිද්‍යාලයක් බවට පත් වුණා. මාත් සිරගෙය තුළ ලබපු අත්දැකීම් චිත්‍රයට නැගුවා. ඒ හරහා සිරගෙය තුළ වෙනමම චිත්‍ර නිර්මාණය වුණා. මාක්ස්, එංගල්ස්, ලෙනින් හා චේ ගුවේරා වැනි දේශපාලන නායකයන්ගේ රූප, මූර්ති, සිතුවම් විශාල වශයෙන් නිර්මාණය වුණා. 1975දී බරපතළ වැඩ සහිතව මට සිරදඬුවම් නියම වීමෙන් පස්සේ කොග්ගල, අනුරාධපුර, නව මැගසින් හා බෝගම්බර යන සිරගෙවල්වල කල් ගෙව්වා.

**රළ: 1977 සැප්තැම්බර් මාසය රිමාන්ඩ් ගතවූ සිරකරුවන්ට සුවිශේෂී වුණා නේද?**

*චාල්ස් දයානන්ද:* ඔව්. 1977 සැප්තැම්බරයේ අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභා පනත අහෝසි කිරිම නිසා එමගින් සිරදඬුවම් ලබපු අය හා රිමාන්ඩ්ගතව සිටි සියලුම දේශපාලන සිරකරුවන් නිදහස් කරනු ලැබුවා. එහිදී මාද නිදහස් වුණා. 1979 වන විට උපාධිය සම්පූර්ණ කරගෙන පසුව රජයේ චිත්‍ර කලා ගුරුවරයකු ලෙස වෘත්තීය ජීවිතය ඇරඹුවා. 1980දී කොළඹ කලාභවනේදී 'සිරගෙයි ඇඳි සිතුවම්' ලෙස චිත්‍ර ප්‍රදර්ශනයක් පවත්වා පසුව එහි සියලු තොරතුරු ඇතුළත් චිත්‍ර හා වෙනත් විස්තර ඇතුළත් පොතක් පළ කළා.

**රළ: වර්තමානයේ ඔබ කලාකරුවකු ලෙස සමාජගත කරන පණිවිඩය කුමක්ද?**

*චාල්ස් දයානන්ද:* කලාකරුවා සෑම විටම සමාජ මෙහෙවරක් උදෙසා සිය මාධ්‍ය භාවිත කළ යුතුයි. එහිදී මුදල මූලික කර නොගත යුතුයි. 1977දී පැමිණි විවෘත ආර්ථිකය මත 80 දශකයේ සිට අද දක්වා සමාජයේ සෑම පැත්තකම දැවැන්ත පිරිහීමක්, කඩාවැටීමක් දකින්න පුළුවන් වුණා. මෙයට කලා ක්ෂේත්‍රය මෙන්ම දේශපාලන, සමාජයීය, සංස්කෘතික වැනි අංගයන්ගේද එකහා සමාන පිරිහීම් දක්නට ලැබුණා. මේ තුළ ඇති වූයේ විවිධ සමාජ අපගමනයන් විතරයි. ජාතිවාදය, ආගම්වාදය, මිථ්‍යා මත පසුපස හඹා යාම, මුදල් කේන්ද්‍ර වූ ආර්ථිකවාදයකට තල්ලු වීම ආදී කරුණු රාශියක් තුළ සමාජය දැවැන්ත පරිහානියකට යනු ලැබුවා. මෙය වෙනස් කරන්නට නම්, රටේ සියලුම ජනතාව නිවැරදි අවබෝධයකට පැමිණිය යුතුයි. එම අවබෝධය ඇති කිරීමට කලාකරුවාට හා කලා නිර්මාණයන්ට හැකියාව තියෙනවා.

2020දී එළැඹෙන මහ මැතිවරණය මගින් අප රටේ ජනතාවට අලුත් ආණ්ඩුවක් ගෙන ඒමට හෝ පවතින ආණ්ඩුව පවත්වාගෙන යාමට ජන වරමක් උදා වෙනවා. එම ජන වරම නිසි ලෙස තේරුම්ගෙන සමාජ, ආර්ථික, දේශපාලන වෙනසක් උදෙසා සියලු ප්‍රගතිශීලී ජනතාව ඒකරාශී කොට ගත් පුළුල් බහුජන පෙරමුණක් හරහා නව දේශපාලන ක්‍රමයක් බිහි කළ යුතුයි. එම බහුජන පෙරමුණේ නායකත්වය ගැනීමට සුදුසුම කණ්ඩායම වන්නේ ජනතා විමුක්ති පෙරමුණයි. එම බහුජන පෙරමුණ හරහා සැබෑ වාමවාදී ආණ්ඩුවක් හා නව සමාජ ක්‍රමයක් පිහිටුවා ගැනීමටද ඒ තුළින් හැකි වනු ඇතැයි මා දැඩිව විශ්වාස කරනවා.

## සෙක්කුව.. >>04 පිටුවෙන්

සහ එය ඉටු කර ගැනීමට යාමේදී ඔවුන් තුළ නිසි සමාජ, දේශපාලන චින්තනයකින් ලැබූ පන්නරය අහිමි වීමේ ඛේදවාචකයද සංඥා කෙරේ. ධනේශ්වර සමාජයේ ව්‍යාජයට හසුවී තමන් අපේක්ෂා කරන සරු බිම වෙනුවෙන් හෙළන සෑම සුසුමක්ම දාඩියක්ම තුළින් උපයන ධනස්කන්ධය අවසානයේ භුක්ති විඳින්නේ, පීඩිත පන්තිය පෙළන පාලක පන්තියේම සුඛවිහරණය වෙනුවෙනි. විදේශීය ආධිපත්‍යයට හා ඊට ගැතිවූ පාලක පන්තිය තම ලාභ අපේක්ෂාවන් හරහා මෙරට වටිනා සම්පත් පිටරටට ඇදී යන ආකාරයෙන් දිනෙන් දින ණය බරින් මිරිකුණු සමාජයක ඒ ණය බර නැවත පැටවෙන්නේ ජනතාවගේ කර මතය. සෙක්කුවෙහි සිදුවන මෙම නාට්‍යානුසාරී සංසිද්ධීන් එදා මෙන්ම අදත් ඒ ආකාරයෙන්ම ක්‍රියාවට නැංවෙන බව ඉතා පැහැදිලිය. නිලධාරී පැලැන්තියේ සුඛ විහරණය හේතුවෙන් පොදු ජනතාව දිනෙන් දිනම දරිද්‍රතාවයේ පත්ලටම ඇද වැටෙන ආකාරය නාට්‍යය ආරම්භයේ සිටම ඒ භූමිකා තුළින් ප්‍රබලව මතු කිරීමට නාට්‍යකරුවා සමත්වී තිබේ. ඔහුගේ කලාත්මක දෘෂ්ටිය ඉන් මනාව පසක් වේ. ඔහු අපේක්ෂා කරන්නේද යහපත් මානව සමාජයක් ගොඩනැගීම හමුවේ අප ඉදිරියේ ඇති ප්‍රබල සමාජ ප්‍රතිවිරෝධතාවයන් හඳුනා ගත යුතු බවය.

රාල : ඔලුව හැරෙන අතක මම යනවා. මට දැන් ජීවත්වෙලා ඇති ඵලය කුමක්ද? මට දැන් මහ පොළොවේ පය ගහන්න තැනක් නැහැ.

පූරකඃ මොනවා ඒක යස පුදුම කතාවක් නේ. උඹට පොළොවෙ පය ගහන්න තැනක් නැහැ. මේ මහ පොළොවේ. ඇයි උඹට තිබුණ යස පංකාදු සරුබිම

රාල : ඒක මට දැන් අයිති නැහැ.

මේ ආකාරයෙන් ධනේශ්වර සමාජ පැලැන්තිය විසින් ජනතාවගේ ඉඩකඩම් සූක්ෂ්මව තමන් සතු කර ගන්නා බව පරාක්‍රම නිරිඇල්ලයන් ව්‍යාංගාර්ථවත්ව ප්‍රකාශ කර ඇත. ඉන් අනතුරුව රාල තම දුක්ගැනවිල්ල කියන්නට මහතැන හමුවීමට යයි. නාට්‍යයේ පූරක ඊට මැදිහත්ව මෙසේ ප්‍රකාශ කරයි.

පූරකඃ රාලප්පුවට පරම්පරාගතව උරුම වෙලා තිබුණ සරුසාර බිමක්. ඒත් දැන් ඒක බලහතකාරයෙන් කොල්ල කාලා තියෙනවා.

මහතැත : කවුද බොල ඒ ඉඩම් කොල්ලකන්න ඉන්න ජගතා මේ සක්වලේ කවුද ඒ?

මෙවැනි නාට්‍යමය සිද්ධීන් හමුවේ සෙක්කුව රංගය ඉදිරියට විකාශය වන්නේ ජනතාවට ක්ෂණික විසඳුමක් ලැබෙන ආකාරයෙන් නොව ඔවුන් තුළ අසීමිත බලාපොරොත්තු ගොන්නක් ඇති කරමින් ඒවා හුදු බලාපොරොත්තුම බවට පත් කරමිනි.

මහතැන : දැන් ඉතින් මං පෙන්නන්නම් උඹට අලුත් සරු බිමක්. හොඳට ඇස් දෙක පිහ දාලා බලාපිය අන්න උඹට සරු බිමක් හොයාගෙන ගමනේ යන්න අපූරු සෙක්කුවක්.

සෙක්කුව බල තෙල් හිඳිනා සෙක්කුව
මහතැනගේ මහ වත්තේ සෙක්කුව
හිත තිබුණත් තෙල් හිඳින්න සෙක්කුව
නැතුවයි බැලයෙක් තිබුනේ සෙක්කුව

රාලේ මේකයි සෙක්කුව වත්තේ
සෙක්කුව වටකොට මගකුයි ඇත්තේ
නුඹෙ ගමනට මග එයමයි සත්තේ
සෙක්කුව පැදලා යා ගත යුත්තේ

යන්නෙන් සෙක්කුව හා බැඳුණු සංඥා ඔස්සේ විවිධ හැඟවුම්කාරකයන් රාශියක් එම නාට්‍යයෙන් ධ්වනිත කරයි. නාට්‍යය පුරාම සෙක්කුව හා බැඳුණු මෙකී සංසිද්ධීන් හරහා දිනෙන් දිනම සිදුවන්නේ ශ්‍රම සූරාකෑමට ලක්වන පීඩිත පන්තියේ පිහිටෙන් අධික ලාභ ඉපයීමක් නිසා ජනතාව පීඩනයට පත් වන ආකාරය තවදුරටත් අඛණ්ඩව ක්‍රියාත්මක වන ආකාරයයි.

නාට්‍ය අවසානය වන විට මෙකී ප්‍රතිවිරෝධතාවයන්ට එරෙහිව ජනතාවගේ ඒකරාශීවීම පවා වළක්වයි. පාලක පන්තියට ප්‍රතිපක්ෂව නැගී සිටීමට සූදානම් වන ජනතාවට තර්ජනය පෑම හා සරුබිම සොයා ගිය ජනතාවට තිබූ නිදහස අහිමි කොට ඔවුන් දිනෙන් දින වහලුන් බවට පත් කිරීම මනාව නිරූපිතය.

පූරක විසින් ප්‍රකාශ කරන මේ සංවාද ඛණ්ඩයෙන් ඒ බව පැහැදිලි වේ.

පූරකඃ අපේ සක්වළ මේ විදියට වෙනස් වෙයි කියලා අපි හීනෙකින්වත් හිතුවේ නැහැ. ඒත් වෙනස් වුණා. රාල වගේම සරු බිම් අහිමි වෙච්චි අය අලුත් සරුබිම් සොයපු අය සෙක්කුවට බැඳිලා දහදුක් විඳපු අය අප සක්වළේම හිටියා.

මේ ආකාරයෙන් සරු බිම සොයා ගිය පීඩිත ජනතාව දිනෙන් දින ඉසුරුමත් වන පාලකයන්ගේ මහ මැඳුරු හා සරුබිම පමණක් දැක ගැනීම තුළින් සමකාලීන ලාංකේය දේශපාලන පැතිකඩෙහි තවත් ගැඹුරු කියැවීමකට සෙක්කුව නාට්‍යය හරහා අප ව පොළඹවලයි. එහෙයින් 40 වසරක් කරා එළැඹෙන පරාක්‍රම නිරිඇල්ලයන්ගේ 'සෙක්කුව' නාට්‍යය, උගත් නූගත් ඕනෑම ප්‍රේක්ෂකයකුට වඩාත් සංවේදීව මෙරට සමාජ දේශපාලන සන්දර්භය ප්‍රාමාණිකව තේරුම් ගැනීමට ඉඩකඩක් සපයයි.

ගා.පිරිස : රාලේ බැඳපං කිරිපුස්සා
ගා.පිරිස : රාලේ බැඳපං අපෙ පැඟිරා
රාලෙ
දෙමුහුං කුලයේ උපන්න කදීම වුරුසබයෙකි අපෙ පැඟිරා
රටේම ඉපදී හැදිලා වැඩුණයි රගේට මේ අපෙ පැඟිරා
සරුබිම හොයලා මුරණ්ඩු වීලා කම්මැලි උණු අපෙ පැඟිරා
ආයෙත් සෙක්කුවෙ සරුබිම හොයන්න බඳිනවදෝ අපෙ පැඟිරා

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය නොයෙල් විජයරත්න

## සිනමාවක් ඇත.. >>01 පිටුවෙන්



ශාලාකරුවන්, සිනමා ශාලාව පදනම් කර ගත් ප්‍රවාහණ සේවයක් හා තරුණයන් මූලික කර ගත් ඒ අතර, සියලු වයස් මට්ටම් නියෝජනය කරන නරඹන්නන් වශයෙන් විවිධ ආර්ථික හා සමාජයීය අඩිතාලම් සහිත සිනමා කර්මාන්තයක් එදා රටේ විය. ආර්ථික හා පන්තිමය අර්ථයෙන් බෙදුණාවූ බැල්කනි, ඕ.ඩී.සී. හා ගැලරි යනුවෙන් සිනමා ශාලාවේ ආසන පද්ධතියක් විය. අද එවැනි වර්ග කිරීමක් නොමැත. ගැලරියක් නොමැති සිනමා ශාලාවේ පන්ති හෝ ආර්ථික වර්ග කිරීමකට අනුව ප්‍රවේශ පත්‍ර නොමැත. එයින් හැඟෙන්නේ ආර්ථික හෝ පන්ති පරතරයක් රටේ නැත්තේද? අද සිනමා ශාලාව තුළ ආසන වර්ගීකරණය වී ඇත්තේ, සිනමා කර්මාන්තයක් වෙනුවට පවතින හුදෙකලා සිනමාවක් තුළ තවමත් ඉඳහිට සිනමා ශාලාවට පැමිණෙන ප්‍රේක්ෂකයන් අතළොස්සකට හා සමාජ අර්බුදයේම කොටස්කරුවන් බවට පත්ව ඇති ජෝඩු වෙනුවෙන් වෙන්ව ඇති ශාලාවක් ලෙසිනි.

එහෙයින්, අද ඇත්තේ සිනමා කර්මාන්තයක් නොව හුදෙකලාවූ සිනමාවකි. එයින් කර්මාන්තයක් ලෙස මතු වන නිර්මාණ, අලුත් සොයා ගැනීම්, අලුතෙන් ප්‍රවේශ වන පරපුරක්, ජීවන යැපීමක් හෝ ප්‍රේක්ෂකයාගේ මනසට එකතු වන කාලයක් මතකයේ රඳවන විඳීමක් ඉතිරි වන්නේ නැත. සිනමා කර්මාන්තයක් නොතිබිණි නම්, එච්. ආර්. ජෝතිපාල වැනි ගායකයෙක්, ඇන්ජලින් ගුණතිලක, ලතා වල්පොල වැනි ගායිකාවන් හා මෙතරම් සිනමා ගීත සාහිත්‍යයක් බිහි නොවන්නට තිබිණි. කර්මාන්තයක් නොතිබිණි නම්, මනසේ කාලයක් රැඳුණාවූ සංගීත රිද්ම, ප්‍රේමසිරි කේමදාස නම් සංගීතඥයකු සංගීත ක්ෂේත්‍රයට එක් නොවන්නට තිබිණි. මෑත ඉතිහාසයේ බිහිවූ සිනමාව හරහා එවැනි ආදර්ශයන් නැති තරමට පත්ව ඇත්තේ, කර්මාන්තයක අඩුව නොවේද? වේදිකා නාට්‍යයක් නිර්මාණය කිරීම උදෙසා අර්ථපතියෙක් (මුදල් යොදවන්නෙක්) නොමැති නම්, පදිංචි ගෙය, ඉඩම උකස් කොට නාට්‍ය කර ගැනීමට පෙළැඹෙන නිර්මාණකරුවෝ සිටිති. නමුත්, ගේ දොර උකස් තියා චිත්‍රපටයක් කිරීමට ඇති ඉඩකඩ අල්පය. කර්මාන්තයක් නොමැත්තේ වුවද, නාට්‍යයක් බිහි කිරීමට තවමත් ඉඩකඩ ඇති වුවද, කර්මාන්තයක් නොමැතිව චිත්‍රපටයක් නොමැත්තේය.

## මාක්ස්වාදී ඇසින්

# පුනරුද සමය හා කලාව

වත්මන් ධනවාදය තුළ නිෂ්පාදන මාර්ගද මානව සබඳතාද, දේශපාලනයද සංස්කෘතික වටිනාකම්ද කලාවද විශාල පිරිහීමකට ලක්ව තිබේ. එහෙත් වැඩවසම් සමාජය තුළ "අඳුරු යුගය" පුරා යටපත්කර තිබූ කලාව යළි පිබිදීමකට ලක්ව අතු ඉති ලියලා වැඩිවීමට පටන් ගත්තේද ධනවාදයේ උපතත් සමගය. පැරණි වැඩවසම් ක්‍රමය පසෙකට තල්ලුකොට ධනවාදය නව සමාජ ක්‍රමයක් ලෙස පෙරට එන විට එහි යෞවන අවධියේ එය, එහි නිෂ්පාදන මාර්ගවලද වෙළඳාමේද විද්‍යාවේ හා තාක්ෂණයේද විශාල පෙරළි කරමින් මහා පිම් පැන්නා සේම කලාවේද විශාල වර්ධනයකට මඟ පාදාලීය. ධනවාදයේ ආරම්භය සමග ඇතිවූ මෙම වෙනස පොදුවේ "පුනරුදය" ලෙස හැඳින්වූ අතර, කලාවද මෙම පුනරුදයට අයත් විය.

ධනවාදයේ සම්ප්‍රාප්තියත් සමග ධනවාදය තම වෙළඳ භාණ්ඩ නිෂ්පාදනය හා වෙළඳාම වෙනුවෙන් ඊට බාධාකළ බොහෝ පැරණි සමාජ සබඳතා කඩා බිඳ දැමූ අතර, දේශපාලනයේදී ලිබරල් මතවාදය ඇති කළේය. එම ක්‍රියාවලිය තුළ ඊට අනුරූපව කලාවද එහි පැරණි බන්ධනයන්ගෙන් නිදහස් විය. එක් අතකින් යුරෝපයේදී කලාව පල්ලියේ, රජයේ ආධිපත්‍යයෙන් බොහෝදුරට නිදහස් වූ අතර, ධනවාදය තුළ බිහිවූ විද්‍යාවේ හා තාක්ෂණයේ ජයග්‍රහණද එකතු කර ගනිමින් ලේඛන කලාව තුළ, චිත්‍ර කලාව තුළ, මූර්ති කලාව තුළ විශාල වෙනස්කම් ඇති කරගත් අතර, සිනමාව වැනි නව කලා ක්ෂේත්‍රද බිහිකළේය.

"පුනරුදය" යුරෝපයේදී හඳුන්වනු ලැබුවේ Rinaissance නමිනි. එහි අර්ථය වූයේ Re-birth හෙවත් නැවත ඉපදීම යන්නය. පුනරුද සමයේ කලාකරුවන් අතීතයේ පැවති උසස් ග්‍රීක හා රෝම කලාවන් පල්ලියේ ආධිපත්‍යය නිසා බිඳවැටුණු බව පවසමින් එසේ බිඳ වැටුණු සම්භාව්‍ය කලාවන් යළි නගා සිටුවීම අරමුණු කරගත් මතවාදයක් වෙනුවෙන් පෙනී සිටින ලදී. මේ නිසා ධනවාදයේ ලිබරල් චින්තනයට සමගාමීව කලාව තුළ 'මානවවාදය' නම් මතවාදයද, ඒ සමගම පැරණි සම්භාව්‍ය කලාවන් යළි නගා සිටුවීම අරමුණු කරගත් මතවාදය වූ සම්භාව්‍යවාදයද බිහිවිය.

මධ්‍යතන යුගය හෙවත් වැඩවසම් යුගයේ කවියාත් නව සමාජය වූ ධනවාදයේ ප්‍රථම කවියාත් ලෙස එංගල්ස් විසින් හඳුන්වනු ලැබූ ඉතාලි ජාතික මහා කවි දාන්තේ ඇලිගේරි, පළමු නූතන කවියා ලෙස සැළකෙන ඉතාලි ජාතික පෙට්‍රාර්ච්, පළමු නවකතාව ලියූ ඉතාලි ජාතික ගියෝවන්නි බොකාසියෝ, ඉංග්‍රීසි ජාතික එඩ්මන්ඩ් ස්පෙන්සර්, ෂේක්ස්පියර් වැනි කවීන් හා ලේඛකයින් පුනරුද සමයට අයත් ලේඛකයින් ලෙස සැලකේ. එසේම ලියනාඩෝ ඩාවින්චි, මයිකලාන්ජලෝ, ගොයෝතෙ වැනි චිත්‍ර ශිල්පීන්ද මෙම යුගයේ අය ලෙස සැලකේ. ඔවුහු සම්භාව්‍ය කලාවක් බිහිකිරීම වෙනුවෙන් කටයුතු කළහ.

පුනරුද යුගයේ වැඩී වර්ධනය වූ කලාව හා සාහිත්‍යය 18වැනි සියවස වන විට ඉහළ තලයකට එසවුණි. ලෝකයේ බොහෝ රටවල මහා ගත්කරුවන්ගේ බිහිවීමත් මහා සාහිත්‍ය සම්ප්‍රදායන්ගේ ආරම්භයත් නාට්‍ය හා චිත්‍ර කලාවන්ගේ පිබිදීමත් සනිටුහන් වන්නේ මෙම වකවානුවේදීය. රාජ්‍ය බලය තමන් අතට ගනිමින් ආර්ථිකයේ මෙන්ම සමාජයීය, සංස්කෘතික සියලු ක්ෂේත්‍රවල ආධිපත්‍යය තමන් අතට ගත් ධනවාදය ඒ සමගම කලාව තුළද සිය ආධිපත්‍ය පැතිරවීමට උත්සාහ දැරීය. ඊට කලාකරුවන්ගේ පැත්තෙන් එල්ල වූ විරෝධය නියෝජනය කරන මතය වූයේ "කලාව කලාව සඳහාය" යන්නය. ඉන් ඔවුන් අදහස් කරනු ලැබුවේ කලාව පාලක පංතියේ ආධිපත්‍යයෙන් මුදා ගැනීමය. එය එම මොහොතේ පැවති තත්වයට අනුව නිවැරදි වුවත්, එය ධනවාදය එයට එලෙස පැවතීමට ඉඩ දුන්නේ නැත. ධනවාදය සිය ප්‍රාග්ධනයේ අයිතිය මගිනුත් සිය පංති මතවාදයේ බලපෑම මගිනුත් බලය හා ධනය මගිනුත්, කලාවත් කලාකරුවාත් තම ආධිපත්‍යයට විටෙක ඉතා සියුම් වක්‍ර ලෙසත් විටෙක් සෘජු හා රළු ලෙසත් අවනත කර ගන්නා ලදී. 'කලාව කලාව සඳහාය' යන මතය ආරම්භයේ හොඳ අරමුණකින් බිහිකළද, පසුව එය කලාව ජනතාවගෙන් ඈත් කිරීම සඳහා ප්‍රතිගාමීත්වයට සේවය කළේය.

ධනවාදය තුළ කලාව විවිධ හැඩතල හා විවිධ රීති ඔස්සේ වර්ධනය විය. සාහිත්‍ය කලාවේදී මානවවාදය, ස්වභාවිකවාදය යනාදී දෘෂ්ටිවාදයන්ගෙන් ආරම්භ වූ එය පසුව රොමැන්ටික්වාදය, යථාර්ථවාදය, නූතනවාදය, විවේචනාත්මක යථාර්ථවාදය, සංදෘෂ්ටිකවාදය, පශ්චාත් නූතනවාදය, ඉන්ද්‍රාලික යථාර්ථවාදය (Magical Realism) ආදී දෘෂ්ටිවාදී රැසක් ඔස්සේ වර්ධනය විය. කෙසේ වෙතත් ධනවාදය වැඩවසම් ආධිපත්‍යයෙන්, පල්ලියේ ආධිපත්‍යයෙන් කලාව මුදාගෙන එයට සංවර්ධනය වීමේ ඉඩ ලබා දුන්නද, ඒ සමගම ඒ තුළ ධනවාදයේ ආධිපත්‍යය පතුරුවාලීය. කලාව ජනතාව ධනවාදය වෙත බැඳ තබා ගන්නා හුයක් බවට පත් කළේය. ධනවාදී මතවාදය ජනතාව වෙත ගෙන යන වාහකයා බවට කලාව පත්කර ගැනීමට ධනවාදය කටයුතු කළේය. එසේම ධනවාදයේ යෞවන අවධියේ ප්‍රගතිශීලී පියවර රැසක් මගින් වර්ධනය වූ කලාව ධනවාදයේ අවසන් යුගය වන වත්මන් යුගය වන විට බරපතළ පිරිහීමකටද ලක්කළේය.

ධනවාදය තුළ කලාව පිරිහුනේ කෙසේද යන්න පිළිබඳ අප කථා කළ යුත්තේ කලාව වත්මන් පරිහානියෙන් මුදාගැනීමේදී එය අත්‍යවශ්‍ය වන නිසාය.

# සෙක්කුව

## පරාක්‍රම නිරිඇල්ලගේ සෙක්කුව හා එහි අපේ සංස්කෘතික, දේශපාලනික එළැඹුම



පරාක්‍රම නිරිඇල්ලයන් ලාංකේය වේදිකාවෙහි නොමැකෙන නාමයක් සනිටුහන් කරනු ලබන්නේ 1976දී ඔහු විසින් නිර්මාණය කළ පළමු ස්වතන්ත්‍ර නාට්‍ය කෘතිය වූ 'සෙක්කුව' රංගගත කරනු ලැබීමත් සමඟය. 1976 රාජ්‍ය නාට්‍ය උළෙලේ හොඳම ස්වතන්ත්‍ර රචනය ඇතුළු සම්මාන කිහිපයකින්ම පිදුම් ලැබූ ඔහු එතැන් සිට මේ දක්වා පරම්පරා කිහිපයකම ශිල්පීන් සමඟ සෙක්කුව මේ වසර අවසන් වන විට එහි 40 වන වසර සම්පූර්ණ කරනු ලබන්නේය. හතළිස් වසරක සෙක්කුව ආ ගමන් මගේ එක් සුවිශේෂී සිදුවීමක් වූයේ එය පසුගිය දා ඉන්දියාවේ පැවැති 'බහුරූපි' අන්තර් ජාතික නාට්‍ය උළෙල නියෝජනය කරමින් පරාක්‍රම නිරිඇල්ල සම්මානයෙන් පිදුම් ලැබීමයි. එම නාට්‍ය ඊට තෝරා ගැනීමට හේතු වූ ප්‍රධාන කරුණක් වූයේ ලාංකේය සමාජ දේශපාලන සංසිද්ධියක් ජන සම්ප්‍රදාය උපයෝගී කර ගෙන කළ විශිෂ්ට නිර්මාණයක් වීමයි.

සෙක්කුව නාට්‍ය පිටපත එස්.ජී.පුංචිහේවාගේ 'අහේතුවට හේතුව' නම් කෘතියේ ඇතුළත් 'සෙක්කුව' නමැති කෙටිකතාව ඇසුරින් සකස් වූවකි. පරාක්‍රම නිරිඇල්ලයන්ගේ සෙක්කුව නාට්‍යය පිළිබඳව කරනු ලබන විග්‍රහයේදී එකල පැවති සමාජ, සංස්කෘතික හා දේශපාලනික පසුබිමින් කිසිවිටකත් වියුක්තව සාකච්ඡා කළ නොහැකි ආකාරයෙන් ඒ අවියෝජනීය ලෙස බැඳී ඇත. බ්‍රිතාන්‍ය යටත්විජිත පාලන සමයේ මෙරට ජනතාව ස්වකීය ඉඩකඩම්වලින් පිටමන් කර ඔවුන්ට අයත්ව තිබූ සරු බිම් ප්‍රභූ පැලැන්තිය ඉතා සූක්ෂ්ම ලෙස හිමි කර ගැනීම නිසා බහුතරයක් වූ පොදු ජනතාව තමන්ට උරුම ඉඩකඩම්වල දාසයන් බවට පත්වී එහිම තම ශ්‍රමය වගුරුවන්නට වූහ.

එමෙන්ම පාර්ලිමේන්තු ක්‍රමය හා දේශපාලන පක්ෂ ක්‍රමය මෙරටට හඳුන්වා දීමත් හේතුකොට ගෙන බ්‍රිතාන්‍ය පාලනයෙන් බලය ස්වදේශීය ප්‍රභූ පැලැන්තියට හිමිවීමත්, 1948දී ලබාදුන් ඊනියා නිදහස නිර්ධන පන්තියේ සැබෑ ශ්‍රමිකයන්ට අහිමිවී යාමේ ඛේදවාචකයත් සෙක්කුව නාට්‍යයේ ප්‍රබල හැඟවුම්කාරකයන්ය. එහෙයින්, සෙක්කුවේ නියෝජනය කරන මහතැන හා ඔහුගේ අණසකට සුවච කීකරු ලෙස කටයුතු කරන ගෝලබාල නිලධාරී පැලැන්තියද එකී ධනේශ්වර චින්තනයේ වැඩපිළිවෙළ ඉදිරියටම ගෙන යනු ලබයි. එහෙයින්, සෙක්කුවේ කඳට හිරවී ශ්‍රමය වගුරුවන ජනතාව එයින් හිඳෙන තෙල් ධනපති පන්තියේම පැවැත්මට පුද කරයි. ඔවුන් අපේක්ෂිත සාරභූමියට කිසිදා යාමට මගක් නැත. එය මිරිඟුවක් බවට පත් කරන සෙක්කුවේ රාළගේ භූමිකාව හරහා සමස්ත පීඩිත පන්තිය ශ්‍රමය වගුරන පන්තිය හොඳින් සංකේතවත් කරන්නකි.

සෙක්කුව ලාංකේය සමාජ, දේශපාලන, සංස්කෘතික හා එහි ආර්ථිකය හා ගැඹුරින් බැඳී පවතින හෙයින්, සෙක්කුව ලාංකේය සමාජයේ ගැඹුරු දේශපාලන පැතිකඩක් අප හමුවේ විවර කර තබයි. එපමණක් නොව ලාංකේය සමාජ - දේශපාලන ඉතිහාසයේ අඛණ්ඩ පැවැත්මද වර්තමානය දක්වාම විවිධාකාර මුහුණුවරින් ක්‍රියාත්මක වන බවත් පෙන්වා දේ. සෙක්කුවක් කැරකෙන්නාක් මෙන් එකම රටාවකට වර්තමානය තුළද එලෙසින් පවත්නා දේශපාලනය ජනතාව එකම තැනක කරකවමින් දිනෙන් දිනම පීඩාවට පත් කරන බව පරාක්‍රම නිරිඇල්ලයන් සෙක්කුවේ ඇතුළත් සංඥාර්ථයන් මගින් මතු කොට දක්වයි. මෙහි කතා සංකල්පය පැහැදිලිවම ලාංකේය ජනශ්‍රැතිය හා බැඳුණු වැඩවසම් සමාජ අර්ථක්‍රමයේ නිෂ්පාදන ක්‍රියාවලිය, නිෂ්පාදන සාධක හා නිෂ්පාදන මාදිලියද ධනේශ්වර පැලැන්තියට වුවමනා ආකාරයටම හසුරුවන්නේ කෙසේද යන්න සංකේතාත්මකවත්, සෞන්දර්යාත්මකවත් ප්‍රකාශ කෙරේ. මේ සඳහා නිරිඇල්ලයන් සොකරි, කෝලම්, නාඩගම් වැනි දේශීය ජනනාටක පද්ධතියෙන් හා ජන කාව්‍යයෙන් ලබා ගත් ආභාසය ඔස්සේ සෙක්කුවේ චරිත නිර්මාණය, සංවාද හා භාෂා භාවිතය, රංග ශෛලිය, හා රංග උපක්‍රම නව්‍ය ආකාරයකට ඉදිරිපත් කරනු ලබයි. සෙක්කුවේ නාට්‍ය සංදර්භය තුළ වඩාත් සෞන්දර්යාත්මක හා එහි දේශපාලනික අර්ථයන් අදටත් කාලීන වශයෙන් වැදගත් වන්නේ එහෙයිනි. ඒ මක්නිසාද යත්, අතීතයේ සිට මේ දක්වා අඩු වැඩි වශයෙන් මෙරට දේශපාලනික හා සමාජ සංදර්භයේ ක්‍රියාත්මක වූ තත්වයන් සංඥා රාශියක් ඔස්සේ අපූර්වත්වයෙන් යුතුව ඉදිරිපත් කරනු ලබන බැවිනි. එයින් සෙක්කුව නාට්‍ය පුරාම සෘජුවම දේශපාලනික රංග ක්‍රියාදාමයකට ප්‍රවේශ නොවී වඩාත් ජනතාවට හුරුපුරුදු ජනවේදය ඇසුරින් හා එය මනාව සුසංයෝජනය කර ගනිමින් ව්‍යාංගාර්ථවත් ලෙස නාට්‍ය කලා මාධ්‍යයේ විවිධ සංඝටකයන් ඔස්සේ හැසිරවීමට උත්සාහ කර තිබේ.

එබැවින්, සෙක්කුවේ සෙක්කුව ප්‍රබල සමාජ සංස්කෘතික දේශපාලන සංඥාවක් බවට පත්වේ. ඒ කෙසේද යත්, එහි එන කිරිපුස්සා, රාළ, මහතැන, හා මාරුවෙන් මාරුවට සෙක්කුවට බැඳ ඇති ගොනුන් මෙන්ම අවශේෂ චරිත හා සිද්ධි ගණනාවක්ම මෙරට ඓතිහාසික සමාජ, දේශපාලනික සංදර්භයත්, වර්තමානය තුළ එය මනාව දෝලනය වන ආකාරයත් නිරූපිත වේ. එහෙයින්, ධනේශ්වර පන්ති සබඳතා හා ඒවායේ ඇති කෲරතර හා අමානුෂික ලක්ෂණ මනාව කුළුගැන්වීමට එකී චරිත සමත් වේ. සෙක්කුවේ එන රාළගේ චරිතය පීඩිත ජනතාවගේ බලාපොරොත්තු

>>ඉතිරිය 03